බුද්ධෝ මේ සරණං වරං

පරම සුන්දර සත්‍යාවබෝධය පිණිස

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

බුද්ධෝ මේ සරණං වරං

පරම සුන්දර සත්‍යාවබෝධය පිණිස

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

හිමිකම් ඇවිරිණි.

බුද්ධෝ මේ සරණං වරං

පරම සුන්දර සත්‍යාවබෝධය පිණිස

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ප්‍රථම මුද්‍රණය - 2018 පොසොන්

9 789553 526007

ISBN - 978-955-3526-00-7

කවරයේ චිත්‍රය - බුද්ධික පියතිලක

පරිගණක අක්ෂර සංයෝජනය - අජිත් පුෂ්පකාන්ත

කවර නිර්මාණය සහ පිටු සැකසුම - ශෂී වැවේගෙදර

ප්‍රකාශනය සහ බෙදාහැරීම - මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය. දණ්ඩගමුව, කුලියාපිටිය.

මුද්‍රණය - ඉසුරු ප්‍රින්ටර්ස්, කෝට්ටේ

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

පිදුම

මායාව විනිවිද සත්‍යය දකින්නට,

අප තුළ ප්‍රඥාවේ නැණ පහන් දල්වා ගන්නට,

කළණ මිතුරු සෙනෙහෙන්

මඟ පෙන්වූ,

ගුරු පියාණන් ප්‍රමුඛ

සියලු යෝගාවචර

ගුරු උතුමන් වහන්සේලාට

උපහාරයක් වේවා...!

පටුන

අවබෝධය 01 - 02

අවිද්‍යාවෙන් මිදීම පිණිස.

එච්.ඒ. මහින්ද උදය බණ්ඩාර

දිස්ත්‍රික් තක්සේරුකරු - තක්සේරු දෙපාර්තමේන්තුව

නිදහස 03 - 10

තමා නිර්මාණය කළ මනෝමය සිර කුටියෙන් නිදහස් වීම.

මහාචාර්ය අජිත් ජයවීර

පීඨාධිපති, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය

මුළාවෙන් මිදීම 11 - 12

මට මේ භවයේදීම නිවන් දකින්න පුළුවන්.

එච්.එම්.පී. බණ්ඩාර

ව්‍යාපාරික

අඳුරෙන් ආලෝකයට 13 - 17

අවූලිකා ශ්‍රද්ධාව විපරීත කළ මනසට සැබෑ දහම

ඖපනයික කරනු පිණිස.

ඩබ්.ඒ. ලයනල්

විදුහල්පති

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ශාස්තෘවරයාණන්, දහම සහ සංඝ රත්නය 18 - 23
පැවිදි බිමට ඇතුළත් වී හෝ නොවී ශ්‍රාවක
මහා සංඝරත්නයේ සාමාජිකයෙක් වෙමුද?
ආචාර්ය එච්.එම්.එස්.පී. හේරත්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බැංකු හා මූල්‍ය අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය

සතං සමාගමෝ හෝතු 24 - 28
නිර්වාණ අවබෝධය සිදුවන තුරු පැතිය යුතු
එකම පැතුම කළණ මිතුරු ඇසුරයි.
නීතීඥ කේ.ඩී. නිලූකා දමයන්ති

හරි මග 29 - 30
ලොවම දිනුවද නොලැබෙන සැබෑ සතුට
ලැබිය හැකි එකම මඟ.
චමින්ද තුෂාර සිල්වා
ගණකාධිකාරී
බ්‍රැන්ඩික්ස් ටෙක්ස්ටයිල් ලිමිටඩ්

ආධ්‍යාත්මික සතුට 31 - 34
ඔබගේ නිවහන තුළ වළ දමා ඇති මහා නිධානය
ගොඩ ගැනීමට අවශ්‍යද...?
ජේ.ආර්. සීතා ජයකොඩි

©
ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

විශ්ව නියාම 35 - 38

සොබා දහම අවබෝධයෙන් මායාවන්ගෙන් ගැලවීම සඳහා.

ඉංජිනේරු ඩී.ඒ.ඩී. හේමචන්ද්‍ර

කළමණාකරු, ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය

උඩුගම් බලා 39

ළමා වියෙන්ම ඇරඹිය හැකි සසර සැඩ පහර පරදවන

සවිමා වායාමය.

බී.බී.වයි. අමරබන්දු

ශිෂ්‍ය (මධ්‍ය මහා විද්‍යාලයය - කුලියාපිටිය)

ජීවිත පොත 40 - 41

සෑම පුද්ගලයෙකුම කියවිය යුතු වටිනාම පොත එයම පමණයි.

එස්.ඩී.ටී. මනුජිත් ප්‍රනාන්දු

ජ්‍යෙෂ්ඨ මෘදුකාංග ඉංජිනේරු, සීරෝ පොයින්ට් ශ්‍රී ලංකා ආයතනය

එතෙරවීම 42 - 43

යතේ ගසාගෙන සැඩ රළ සසර ගඟේ

සිතේ නිවුම එතෙරට මඟ නිවන් මගේ.

එච්.ඒ.සී. රෝහිණී

විශ්‍රාමික කථිකාචාර්ය

පාරිශුද්ධත්වය හා සතුට 44 - 54

දැනුම ඉක්මවූ ප්‍රත්‍යක්ෂය තුළ සදාකාලික සැපයෙන් නිවී සැනසීමට.

එම්.ඒ. ජනක ධර්මප්‍රිය අභයසේකර
විශ්‍රාමික ඉංජිනේරු

ශ්‍රද්ධාවෙන් අචල ශ්‍රද්ධාවට 55 - 58

බුදුන් දැකීම යනු පරම සත්‍යය දැකීමයි.
එහි පළමු පියවර ශ්‍රද්ධාවයි.

ආචාර්ය එරන්දි ජිනාදරී වත්තේගම
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවහාරික විද්‍යා පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය

දුකෙන් මිදෙමු - සතුට ලබමු. 59 - 62

ඔව්. ඔබ සොයන සතුට ඔබ ළඟම ඇත.
ඉතින් කුමට තවත් දුක් විඳිමුද?

මනෝ වෛද්‍ය මහාචාර්ය ප්‍රියන්ත ගාමිණී ජයසිංහ

භව සංස්කාරය 63 - 64

දෙව්,බඹ,මිනිස්,ලෝ කටුක වූ සසරමය.
නිවන් මඟ නම් නොවේ.

ඒ.එම්.ඒ.එන්. අරම්පත්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, උසස් තාක්ෂණ ආයතනය - නයිවල

මිනිසා යනු කවරෙක් ද? 65 - 75

රකින්නට රටක්, ජාතියක්, ආගමක්, තනතුරක්,

කුලයක්, පරම්පරාවක්, නැති ඒ පරම පූජනීය ජීවියා.

ධර්මසිරි ජයවර්ධන

සහකාර ඉඩම් කොමසාරිස්, වයඹ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව

සාමය 76 - 78

පුද්ගලභාවය එකිනෙකා තුළ දියවී ගිය තැන නිමාවෙයි ගැටුම.

එයයි සාමය.

ඒ.එම්.කේ. නිර්මලා

අක්ෂි තාක්ෂණවේදී

කුලියාපිටිය මූලික රෝහල

තොටුපල 79 - 86

උතුම් නිර්වාණය පෙනෙන මානයට පැමිණ ඇත.

කුමට තොටුපොලෙන් ආපසු හැරී යමු ද...?

එල්.ආර්.යූ. බුද්ධික පියතිලක

සහකාර කළමණාකරු

සණස සංවර්ධන බැංකුව පී.එල්.සී.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

තරුණයා හා පෞරුෂය 87 - 95

කිසිදා සංවර්ධනය කරගත නොහැකි නමුදු මතුකර ගත හැකි ඔබේ පෞරුෂය.

කේ.ඩී.යූ. දිනේෂ් ප්‍රනාන්දු
කථිකාචාර්ය, කළමණාකරන අධ්‍යයන පීඨය
ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයය

කළයුත්ත 96 - 103

කිසිවක් නොකර දැක දැනගැනීම.

විජේසිරි බස්නායක
ව්‍යාපාර කළමණාකරණ අධ්‍යන අංශය
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය

නෙක්ඛම්මය 104 - 107

ඔබ අතහැරිය යුත්තේ මොනවාද? එය කළ යුත්තේ කෙසේද?

ආචාර්ය ටී. අර්ස්ලා එස්. පීරිස්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය

නිවීම 108

මුළාවේ කඩතිර ඉරී මතුවන සදාකාලික සැනසීම.

එච්.එම්. රේණුකා ප්‍රියදර්ශනී
මාණ්ඩලික සහකාර, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය

මනුෂ්‍යත්වය හා අධ්‍යාපනය 109 - 113

සැනසිලි සහගත මනුෂ්‍යයෙක් නිර්මාණය කිරීම සඳහා
යොමුවිය යුතු අධ්‍යාපනය.

එස්.ටී.එස්. සුභානි සෙනරත්
සංවර්ධන නිළධාරී
කලාප අධ්‍යාපන කාර්යාලයය, කුලියාපිටිය.

සම්මා දිට්ඨි 114 - 120

සෑම දැක්මකින්ම මිදුණු කල ඉතිරිවන්නේ නිවැරදි දැක්මයි.

ඒ.එම්.යූ.එම්. අරම්පත්
ඉංජිනේරු සහකාර
ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

විනාශය 121 - 122

මිනිසාගේ විනාශය සිදුවන්නේ ඔහුගේම ඇතුළාන්තයේ
කුරිරු බව නිසාය. බාහිර සාධක මත නොවේ...

උදය ගාමිණී මිදිපොලවත්ත
නියෝජ්‍ය රේගු අධිකාරි
ශ්‍රී ලංකා රේගුව

©
මානව ධර්ම හා ආධ්‍යාත්මක විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

හැඳින්වීම

මිහිමත ඉපදෙන සෑම මිනිසකුම තම මානසික තලයෙහි නිර්මාණය වන ද්විත්ව ක්‍රියාකාරීත්වයකට (ද්විතාවයට) හසුවී සිතයි. ක්‍රියා කරයි. නැතහොත් ජීවත් වෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇස, කණ, නාසය, දිව, ශරීරය යන සංවේදීතාවයන් ලෝකය ලෙස හැඳින්වෙන ද්‍රව්‍ය පුද්ගල සිද්ධි සමඟ නොනිවී ඇවිලෙමින් පවතිනු ඇත. මෙම නොනිවෙන ඌණතාවය පූර්ණය කර ගනු පිණිස මිනිසා විසින් සබඳතා උපයෝගී කරගෙන ලෝකයක් අත්විඳී. එහිදී යුවල, පවුල් ඒකකය, නෑදෑයින්, ගම් වැසියන්, රට වැසියන්, කුල පරම්පරා හෝ ආගමික සංවිධාන වශයෙන් කණ්ඩායම් නිර්මාණය කරනු ඇත. ද්විත්වයට විසඳුම වන ඒකීයත්වය පිටතින් සොයයි. නමුත් මෙහිදී මිනිසාට තමා තුළ උත්සන්න වී ඇවිලෙන තරඟය, ගැටුම, දුක සහ තනිකම දුරු කර ගැනීමට නොහැකිව වෙහෙස පමණක් ඉතිරි වනු ඇත. අවසානය විනාශකාරී යුද්ධයක් ලෙස විකාශනය වන මෙම ගැටළුව තුළ තමා විසින්ම තම වර්ගයා විනාශ කර දමනු ඇත.

බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ ලෝකය තුළ තිබෙන ද්විත්ව මායාව හොඳින් හඳුනාගෙන සමස්තය ලෙස සමාන වන යථාර්ථය ඥාන දර්ශනයක් ලෙස ගෙන සතිමත්ව ජීවත් වීම තුළ ශාන්තිය නැතහොත් නිවීම

ඇති වන බවයි. එදා මෙදා තුර බාහිර විද්‍යාවන්, ආර්ථික සංකල්ප, සමාජ සහ දේශපාලනික න්‍යායන්, ආගමික සංකල්ප ආදිය සමාජ ගත කර එම කරුණු මත ජනතාව පෙළ ගැස්වීම සිදුකළත් මෙම ගැටළුවට විසඳුම් හමුවී නොමැත.

පෘතග්ජන උමතුව තුළ ගිලන් වූ ජන සමාජ තරඟය, ගැටුම, දුක යන ප්‍රශ්න වලට විසඳුම් නොමැති බලාපොරොත්තු සුන් වූ පිරිසක් ලෙස මං මුළාවී ඇත. සත්‍යය සොයා ගැනීමට නොහැකිව වෙහෙසට පත් වී සිටින මෙම පිරිස්, ජන සමාජය විසින්ම නිර්මාණය කරන "මානසික උණ" නමැති බෝවන වසංගත රෝගයට ගොදුරු වෙති.

මෙම මානසික උණ වසංගතයෙහි රෝග ලක්ෂණය වන්නේ තමා විසින් ස්ව සන්තානය තුළ කිසි දිනෙක සොයා බලා නොමැති කරුණක්, ස්ථානයක්, පුද්ගලයෙක් හෝ විස්තරයක් (පුරාවෘතයක් වැනි) සහිත වැඩපිළිවෙලක් පිළිබඳව ඇසූ පමණින් රැල්ලේ දුව ගොස් එකතු වීමයි. මෙම නායකත්වය සහ පිරිස් කුමන හානිකර ස්වභාවයක ක්‍රියාත්මක වන්නේද, ඔවුන් තමාව රවටන්නේද, ඔවුන් තමාව ප්‍රයෝජනයට ගන්නේද කියා නොසොයා එම තැන්හි ක්‍රියාත්මක වේ. වැඩි වැඩියෙන් අළුත් පිරිස්ද එකතු කිරීමට උත්සාහ දරයි. මෑත ඉතිහාසයේ මෙරට පැතිර ගිය මානසික උණ රෝග කිහිපයක් මෙසේ නම් කළ හැකිය. එනම් මීවැල්ලැව, දොළුකන්දේ

පිරිත් පැන්, නිවන අත ලඟ කියූ අසපු සහ බුදුන් වහන්සේගේ උප්පත්තිය ශ්‍රී ලංකාවේ සිදුවී යැයි ප්‍රචලිත කරන මතය ආදියයි.

මානසික උණ රෝගයෙන් අන්ධ වූ ගිලන් බව හොඳින් ප්‍රකට වූ තවත් කරුණක් සිහි කළ හැක. නිවන අත ලඟට ගෙනා අසපුවක නායකයින් සහ ගෝලයන් දහම් පොත් ජාවාරමේ ලාභය අත්පත් කර ගැනීමට පොලිසි, උසාවි වල ලගින විටත් එකිනෙකා ඝාතනය කිරීමට උපක්‍රම යොදන විටත් ජනතාව ඔවුන් පසුපසම යාම සහ රොක්වීමයි. අමා මහ නිවන අත ළඟට කියූ අසපුවාසීන් එය කට ළඟට ගෙන ක්‍රියාකරන විටත් තවමත් ඔවුන් පසුපසම යයි. නිවනම සොයාගිය පිරිස් පින සඳහා පෝලිම් ගස්වා සිටින විටත් එහිම රැඳී සිටී.

පුද්ගල විඥ්ඥාණය (මම) තුළ කකියන අසහනකාරී අපහසුව පොදු විඥ්ඥාණයකට (අපි) ප්‍රසාරණය කොට වසන් කරගන්නට දරණ අසාර්ථක උත්සාහය මෙයින් පිළිබිඹු වේ. සමහරු පරණ ස්ථානය අතහැර ආකර්ශණීය නව කණ්ඩායමකට එකතු වෙයි. තවත් සමහරු ගිය තැනටම මුල් ඇද දළුලා වැඩී මහා ගසක් වී බණ දෙසන්නට පටන් ගනු ඇත. තවත් උණ රෝගීන් පිරිවරාගෙන වැජඹෙනු ඇත. අප කුඩා කාලයේ අපට තිබුණේ පන්සල නමැති ආගමික සංස්ථාව පමණි. දහම වැළලී ගිය යුගයකට පසුව නැවත

දහම ස්ථාපිත කරනු පිණිස, එම මධ්‍යස්ථාන පුරාණ යතිවරයන් වහන්සේලා විසින් ඉතා අපහසුවෙන් ගොඩ නගා ඇත. එමඟින් යථාර්ථවාදී ප්‍රබල දහම් කරුණු සොයා බැලීමට කටයුතු නොකළද වත්මන් පරපුරට නැවත ආර්යය පරීක්ෂණය ආරම්භ කිරීමට අවශ්‍ය සියළු දැනුම සහ ඉඩ පහසුවද නිර්මාණය කර ඇත. අඩුපාඩු තිබුණද එය ඉතා අත්‍යවශ්‍ය අහිංසක ක්‍රියාදාමයකි. අප ජීවිතය තුළ අත්විඳින දෙවන අවස්ථාව වන්නේ වර්තමානයේ ඇති දහම් සුනාමියයි. එය බොහෝ විට කට කයිවාරු වලින් පිරීගිය ඝෝෂාවකි. ධර්ම යුද්ධයකි. විනාශයෙන් පසුව ඇතිවූ ආරම්භක සංරක්ෂක වැඩ පිළිවෙළ සහිත ශාසනයත් දැනට පවතින කයිවාරු ශාසනයත් මීළඟට බිහිකරන්නේ කුමන ආකාරයේ ශාසනයක්ද? "රහතන් වහන්සේලා ඔහොම නොවෙයි." "මෙන්න මෙහෙමයි" කියමින් රහත් සංදර්ශන බිහිවෙමින් පවතින යුගයක මානව ධර්ම සහ ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය වසර ගණනක් තිස්සේ නිහඬව කළ පරීක්ෂණයක ප්‍රතිපල ලෙස එළි දක්වන මෙම ලිපි එකතුව "බුද්ධෝ මේ සරණං වරං" ලෙස නම් වෙයි.

මෙම ලිපි ලියා ඇති අයගේ බුද්ධිමය ශරීරයේ පෝෂණයට පාදක වී ඇත්තේ සියළුම ශාස්තෘ, ඍෂි සහ මුණි භාෂිතයන් මත ලියැවුණු ත්‍රිපිටකය, සතර වේදය, උපනිශද්, සෙන් දහම, තාඕ වාදය, ක්‍රිෂ්ණමූර්ති දර්ශනය,

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

බයිබලය, කුරාණය, භගවත් ගීතාව වැනි ග්‍රන්ථයන්ය. මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව තුළ, ආවේණික ගුරු පරපුර විසින් නිර්මිත අභ්‍යාසයන්ගෙන් මොවුන්ගේ ආධ්‍යාත්මික ශරීරය පෝෂණය කරගෙන ඇත. තවද තම තමාගේ ජීවිත වල අන්තර්ගතය වන කය, වේදනා, සිත හා ධර්මතා මත සතිමත්ව තමා විසින් තමා තුළ සිදුකරන ලද ගවේෂණයක ප්‍රතිඵල මෙම ලිපි තුළ සඳහන්ව ඇත.

වැදගත්ම කරුණක් වන්නේ මෙම නිහඬ පර්යේෂණය සිදුකළ පිරිස සමාජයෙන් නොඑසේ නම් ඔබ අප එදිනෙදා ජීවත් වන පරිසරයෙන් වෙන්වී, හුදකලා වී විවිධ අද්භූත අභිචාර විදි ක්‍රම ප්‍රයෝජනයට ගනිමින් හෝ අත්හදා බලමින් අමුතු ආකාරයේ බරපතල පර්යේෂණයක් සිදුකළ පිරිසක් නොවීමයි.

ඔවුන්ද ඔබ සේම සම්,මස්,ඇට,නහර වලින් සුසැදි අතිශය සාමාන්‍ය , එමෙන්ම ඔබ වැනිම විවිධාකාර ආර්ථික හා රැකියා කටයුතු වල නියැලෙන, යුග දිවි සහ දරු මුණුබුරන් සහිත විවිධ සාමාජික සබඳතා පවත්වන, සමාජයේ විවිධ නිළතල හා තානාන්තර දරමින් විවිධ සමාජ මට්ටම් නියෝජනය කරන ඔබ ජීවත් වන පරිසරයේම ජීවත් වන සාමාන්‍ය පුද්ගලයින් පිරිසකි.

නමුත් ඔවුනට සත්‍යය අවබෝධ කිරීමේ බලවත් එමෙන්ම අවංක ඕනෑකමක් නම් ඇත. ඒ හේතුවෙන් ඔවුන් එදිනදා ජීවිතයේ හමුවන සියළුම ද්‍රව්‍ය, පුද්ගල, සිද්ධි පුහුණුවට ලක්කරමින් මුළු ජීවිතයම පුහුණුවක්,

පර්යේෂණයක් බවට පත්කර ගනිමින් ඒ තුළින් මෙම පර්යේෂණ ප්‍රතිඵල ලබා ඇත.

මෙම ලිපි වල සඳහන් කරුණු , පවතින දෘෂ්ඨී අතරට එක්වන තවත් එක් දෘෂ්ඨියක් නොවේ. විවිධ සංකල්ප අතරට එක්වන තවත් එක් සංකල්පයක්ද නොවේ.

සත්‍යයේ පණිවුඩය ලෙස යථාභූත ඥාන දර්ශනය මත ඇතිවන එකම දෘෂ්ඨියකටවත් හසු නොවන, එකම සංකල්පයකටවත් හසු නොවන සම්මා දිට්ඨිය හා සම්මා සංකල්පය ගැන කථා කරයි. ඔවුන් තම කළණ මිතුරු හස්තය දිගු කරගෙන සිටින්නේ කරුණාව, දයාව පෙරදැරි කරගෙනයි. ධර්මය සහ කළණ මිතුරන් පිළිබඳ ඔවුන් දැක දැනගත් බොහෝ දේ ඍජුවම ප්‍රකාශ කරයි. සමහර විටෙක මෙම ඍජු ප්‍රකාශන, අයෙකුට, ස්ථානයකට පහර දීමක් ලෙස උමතු මනසකට ගෝචර වීමට ඉඩ ඇත. මෙය පුද්ගලයන් හෝ ස්ථාන සොයා පහර දීමක් නොව වැරදුනු තැන අවධාරණය කිරීමක් පමණකි. වැරදුනු තැනට ස්ථානයකුත්, පුද්ගලයෙකුත් ආරූඪ කර ගැනීම අනුවණ කමකි. කෙළෙස් පමණක් දකින ලෙස, ද්‍රව්‍ය සහ පුද්ගල මනසින් නිදහස් වී මෙය කියවීම යහපති.

වැරදුනු තැන සඳහන් නොකර පොත්වල සඳහන් වන සත්‍ය ධර්මය පමණක් දේශනා කිරීමෙන් ධර්ම අවබෝධයක් සිදු නොවනු ඇත. වැරදි

අවබෝධ කරගැනීම යනු ධර්ම මාර්ගයට පිවිසීමම වේ. මීලඟ ධර්ම සංඝායනාව සිදුකළ යුත්තේ වර්තමාන බුදු සසුන සංඝ භේදයෙන් සහ සීලබ්බත පරාමාසයෙන් ගලවාගෙන මේ මොහොතේ තමා තුළ සිදු කරන ගවේෂණයන් ආරම්භ කිරීමටය. අපරිමිත අනන්ත වූ "බුද්ධ ගුණය" මත තම පෞද්ගලිකත්වය දියකර හරින විද්‍යාව හෙළි කිරීමටය.

ඇතැම් අවස්ථා වලදී දහම් කරුණු තරමක් ගැඹුරින් ලියා ඇත. පමණ ඉක්මවා සරල කිරීම තුළ දහම විකෘති වීම වැළැක්වීමට එසේ කර ඇත. කියමන මෙසේ සංකීර්ණ වුවද, පුහුණු කිරීමට ඇත්තේ ඉතා සරල අභ්‍යාස බව අපි තවදුරටත් කියා සිටිමු. භාෂාවක් යනු දහම් අවබෝධයට හොඳම සහ එකම උපකරණය නොවන්නේය. එය හොඳින් සිදුවන්නේ හදවතකින් හදවතකට සිදුකරන උත්තරීතර සම්ප්‍රේෂණයක් මඟිනි.

©

බුද්ධ යනු විශ්වයේ පරම සත්‍යයයි. මෙය දකින්නට උත්සාහ නොකරන පිරිසකගේ එකතුවකට බුදු සසුනක් කිව නොහැක. ශ්‍රී සද්ධර්මය විකෘති කොට දේශනා කිරීම සංඝ භේදයයි. සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ උතුම් ශාසනය ලෙස සංඝ භේදය සහ සීලබ්බත පරාමාසය ක්‍රියාවට නංවන පිරිස වෙනුවට මහා සංඝරත්නය වැඩ සිටින ආර්ය ශාසනයක් දකිනු රිසියෙන් "බුද්ධෝ මේ සරණං වරං" නම් වන මෙම කෘතිය ජනතාව වෙත පිළිගැන්වෙයි.

මේ සඳහා මූල්‍යමය ආධාර ලබා දුන් සියලු සිසුන්ටත්, කාලය ශ්‍රමය කැප කළ සියලු සිසුන්ටත්, සිසුන් නොවන උදව් උපකාර කළ සියලු හිත මිතුරන්ටත්, මුද්‍රණ කටයුතු සිදු කර දුන් ශෂී වැවේගෙදර පුතණුවන්ටත් නිවනින් සැනසීමට උපනිශ්‍රය කුසලයක් වේවායි ආශිර්වාද කරමින් තුති පුද කරමු.

මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

දණ්ඩගමුව, කුලියාපිටිය.

071 833 6400 / 076 733 6400

(රාත්‍රී 9.00 ත් 10.00 ත් අතර සම්බන්ධ කරගත හැකිය.)

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ධර්ම දානයක් ලෙස ඔබ අතට පිරිනැමෙන මෙම පුස්ථකය තවත් බොහෝ පිරිසකට කියවීමට සළස්වන්න.

අවබෝධය

අවිද්‍යාවෙන් මිදීම පිණිස.

- ඔබට සැමදා සතුටින් සිටින්නට නොහැකි වී ඇත්ද ?
  එසේ වී ඇත්නම් ඒ මන්ද ?

- මග ඵල නිවන් සඳහා ගිහිගෙය හැර යා යුතුමද ?
  සෝතාපන්න විශාඛාවන් ගිහිගෙය හැර නොගියේ ඇයි ?

- ඉපදෙන විට ඔබට උපතින් උරුම වන්නේ මොනවාද ?

- බුදුන් දැකීමට තව කොපමණ කලක් හෝ කොපමණ භව ගණනක්
  පසුකළ යුතුද ?

- සත්‍යාවබෝධය සඳහා ඔබ විසින් කළ යුතු දෑ මොනවාද?
  එය අසීරු කාර්යයක් දැයි හැඟෙනවාද ?

- ඔබට ආගමක් අවශ්‍යද ? ඔබගේ ආගම විය යුත්තේ කුමක්ද ?

- ධර්මාවබෝධය සඳහා ඔබ කියවූ ධර්ම පුස්තක ප්‍රමාණය ප්‍රමාණවත්
  නොවේ යැයි සිතෙනවාද? දහම් දැනුම ගැන ළතවෙනවාද ?

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ සංසදය

- ඔබට තමා ගැන ගැඹුරෙන් සොයා බැලීමෙන් පමණක් නිවන් අවබෝධ වේ යැයි පැවසුවහොත් පිළිගන්නවාද ?

- සැබෑ ජීවිතයේ එදිනෙදා කටයුතු වලින් ලැබෙන ප්‍රීතිය සතුට දිගටම පවත්වාගත නොහැකිද ?

- නූතන විද්‍යාව යනු අවිද්‍යාවමය. "ලෝකය යනු මුලාවක්මය" යැයි පැවසුවහොත් ඔබ පිළිගන්නවාද ?

- භෞතිකය වන්දනා කර සිදුකරන ප්‍රාර්ථනා වලින් කුමක් ලබා ගත හැකිද ?

- සෑම ආකාරයකම දෘෂ්ඨීන්ගෙන් මිදුණු කළ ඉතිරිවන්නේ කුමක්ද ?

ඔබට ඉහත ප්‍රශ්න කියවීමේදී සමහර විට නිවැරදිම පිළිතුරු ඔබ සිතට නැගී නොමැති වන්නට පුළුවන. නමුත් සමහර විට ඔබ දහම් මග හැසිරෙන්නේ නොවිසඳවුණු මෙම ප්‍රශ්න සිත දරාගෙන වන්නටද පිළිවන. නමුත් මේ වන විට යම් දළ පිළිතුරක් ඔබ සිතට ඇතිවී තිබෙන්නටද හැකිය. කෙසේ වෙතත් මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීමේදී විචක්ෂණශීලීව හා නිදහස් සිතින් මෙය කියවනු ලැබුවහොත් ඔබට බොහෝ දුරට ඉහත ගැටළු වලට හා ඔබ සිත ඇතුළත ඇති අපැහැදිලිතාවයන් පැහැදිලි කරගැනීමට අවස්ථාව උදා වනු ඇත. එවිට ඔබගේ සාමාන්‍ය ජීවිතය යහපත් කරගැනීමට හා ගැඹුරු ආධ්‍යාත්මය කරා යන ගමන ආරම්භ කිරීමට අවස්ථාව උදා වනු ඇති බව මගේ විශ්වාසයයි.

නිදහස

තමා නිර්මාණය කළ මනෝමය සිර කුටියෙන් නිදහස් වීම.

මිනිසාද ඇතුළුව මුළු සත්ත්ව සංතතියම වඩාත්ම අගය කරන දේ වනුයේ නිදහසයි. නිදහස අහිමි වීමෙන් අපට බොහෝ දේ නොලැබී යයි. නිදහස නොමැති විට නොසතුට හා ආතතිය ඇති වී අති පීඩාකාරී හැඟීම් හා ක්‍රෝධය පුද්ගලයා තුළ ගොඩ නැඟේ. අහිමි නිදහස තුළින් බලාපොරොත්තු වූ සතුට නොලැබීම, කැමති දේ නොලැබීම සහ යමක් සිතූ පරිදී සිදු නොවීම දැකිය හැකියි. මෙම සියලු කරුණු වලට හේතුව අප බලාපොරොත්තු වූ නිදහස නොලැබීම බව අපට එකවරම පෙනුණත් නිදහස යනු වෙනත් පාර්ශවයකින් අපට ලබා දෙන දෙයක්ද ? අප විසින් අප අපටම නිදහස දී තිබේද ? අප චින්තනයෙන් නිදහස්ද ? ඇදහීමෙන් නිදහස්ද ? මෙම සියලු ආකාරයේ නිදහස අපට ලබා දිය යුතුද? අප ගොඩ නගා ගත යුතුද? නිදහස් වීම යනු බාහිර කරදර වලින් තොරව සිටීම පමණක්ද ? අභ්‍යන්තර වශයෙන් අප විසින් ගොඩනඟා ගෙන ඇති වහල් භාවයන්ගෙන් මිදීම සැබෑ නිදහස නොවේද ?

"කුරුල්ලකු වගේ නිදහස්ය" යන කියමන අප නිතර ඇසුවත්, කුරුල්ලකු වනපෙත්, තුරු හිස්, ගිරි ශිඛර, මතින් පියාඹා යන්නේ නිදහසේ සතුට අත් විඳීමටද ? වා තලයේ හැසිරෙන කුරුල්ලෙකු සිරකර නැති බව

සැබෑවකි. නමුත් කුස ගින්න, අනාරක්ෂාව, රෝග, පීඩා සහ ශෝක කිරීම් ආදී අති මහත් දුක් කම්කටොළු වලින් එම සත්ත්වයාද නිදහස් නැත.

ලැබූ මනුෂ්‍යත්වයේ උත්තරීතර ඵලය හෙවත් ආත්ම විමුක්තිය ළඟා කිරීම සඳහා වූ නිදහස මිනිසාට උරුම විය යුතු සැබෑ නිදහස ලෙස අප හඳුනාගත යුතුව ඇත. මිනිසා ලෞකිකත්වය ඉක්මවා ගිය උසස් සමාජයීය, චර්යාමය සහ ආධ්‍යාත්මික මට්ටමකට ගෙන යාමට ආගම අවශ්‍ය වේ. එය අපගේද විශ්වාසයයි. එනමුත් චින්තනයෙන් නිදහස් වීමට, ඇදහීමෙන් නිදහස් වීමට, අන්ධ භක්තියෙන් නිදහස් වීමට, අන්තවාදයෙන් නිදහස් වීමට සමහර විට මිනිසා උසස් තත්ත්වයට පත්කරතැයි අප සිතන ආගමම බාධාවක් යැයි පෙනෙන්නට තිබේ. ආගම තුළ ගැබ් වූ දහම අධ්‍යයනය කරන බොහෝ පිරිස් අදද දක්නට ලැබේ. එනමුත් දහම් කරුණු වනපොත් කිරීම, දැනුමට එකතුකර ගැනීම හා බුද්ධි ගෝචර කර ගැනීම සඳහා තර්ක විතර්ක කිරීම තුළින් පුද්ගලයාට ප්‍රයෝජනයක් ලැබිය හැකිද? එය පිපාසයෙන් පෙලෙන්නෙකු හට බීමට ලැබුනු පැන්, පය දෝවනය කිරීමට යොදවන්නක් වැනිය. පෙළ දහම ගුරුකොට ගනිමින් අවබෝධ කරගත් දහම් කරුණු තමා තුළින් ක්‍රියාත්මක කර අත්දකිමින් ආධ්‍යාත්මිකව උසස් වීම, ආගමෙන් අප ලබන ඵලය විය යුතුය. මේ නිදහස අප ආගම තුළින් ලබාගෙන තිබේද ?

ආගමේ පිළිවෙත් වලින් නොනැවතී ධර්මයෙහි හරය තේරුම් ගත

යුතුය. ධර්මයම ගුරු කොට ජීවත් විය යුතුය. ඇදහිලි හා විශ්වාසයන් අපගේ සිතීමේ නිදහසට බාධා කර ඇත. භක්තිය, ශ්‍රද්ධාව ලෙස අප සිතන්නට පුරුදු වී තිබේ. ආමිස පූජා දහම ලෙස ගෙන ප්‍රතිපත්ති පූජාවන් සුළු කොට සළකා ඇත. දහමෙහි හරය පසෙක ලා ආගමික යැයි කියා ගන්නා කටයුතු වල ප්‍රතිලාභයට ගලපා වත් පිළිවෙත් කරන පිරිසක් ආගම් ඔස්සේ බිහිවෙමින් පවතී. මේ ඔස්සේ අප ඇදහීමේ නිදහස අහිමි කරගෙන ඇත. නිරර්ථ ඇදහිලි හා සම්ප්‍රදායන් ආගම ලෙස නම්කර අප කරගෙන යන හරඹය තුළින් අපට ආත්මීය නිදහස ලබා ගත නොහැක. ආගම ආයතනයක් වී අප එහි අනුගාමිකයන් වී සිටිමු. ආගම විසින් සාදා ඇති රාමුවකට අපව කොටු කර බොදුනු, කිතුණු, හින්දු, මුසල්මානු ආදී ආගම් අපේ සිතීමේ නිදහස, ඇදහීමේ නිදහස, ප්‍රඥාව සඳහා වූ නිදහස නැති කරමින් අපේ ආත්ම විමුක්තියටම බාධාවක් වෙමින් පවතී.

පල්ලිය, පන්සල, කෝවිල, දෙවොල ආගමේ පරිපාලන මධ්‍යස්ථාන ලෙස පෙනේ. සැබෑ මිනිසුන් ලෙස සිතීමේ අපේ නිදහස අහුරා ආගමේ නාමයෙන් මරාගෙන මැරෙන අන්තවාදී චින්තනයක් තම අනුගාමිකයන්ට ආගමික සංස්ථා ඔස්සේ පතුරුවා හරිමින් සිටී. ශාස්තෘන් වහන්සේලා දේශිත දහම වසාගෙන මිනිසාගේ උසස් භාවය හා ආත්මීය පැවැත්ම ළඟා කර දීම යන නිර්වචනයන්ට බැහැර වූ ආන්තික ගුණයන් ආගම් ඔස්සේ හුවා දක්වමින් සිටී.

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

"ධර්මය රකින්නා ධර්මයෙන් රැකේ" යන්නෙහි අදහස දහමේ අදෘශ්‍යමාන බලයකින් ලැබෙන ආරක්ෂාවක් ලෙස අප අදහාගෙන සිටී. පල්ලි, පන්සල්, කෝවිල්, දෙවොල් කේන්ද්‍ර ගතවූ වත් පිළිවෙත් කරගෙන දහමේ අදෘශ්‍ය මාන බලයකින් ආරක්ෂාවක් ලැබෙන බවක් අප අදහාගෙන සිටී නම් එය මුළාවකි. දහම ගුරු කොට ජීවත් වන අප විශ්වාසයෙන් හා ප්‍රඥාවෙන් ගොඩනැගුණු ශ්‍රද්ධාව ඇතිව සිදු කරන සෑම ක්‍රියාවකින්ම අපව තව දුරටත් ඇතුළාන්තයෙන් උසස් තත්ත්වයට පත් වූ පුද්ගලයන් බවට පත් කරයි. ලෞකික ප්‍රතිලාභයට නොගලපමින් ආධ්‍යාත්මික පරමාර්ථයෙන් අපගේ දහම් පරමාර්ථය ක්‍රියාත්මක වන්නේ නම්, දිනෙන් දිනම ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය ලබා, ජීවන ක්‍රියාවලිය ඔස්සේ ආධ්‍යාත්මික පරමාර්ථයන් අප තුළින් පිළිබිඹු වනු ඇත. දහම ගුරු කොට ගැනීමෙන් දහමට අනුකූලව ජීවත් වන්නාට සියලු ලෞකික දෙයෙහි හරයක් නැති බව පසක් වේ. අනිත්‍ය බව හා අනිච්ඡතාව මනාවට පැහැදිලි වේ. අටලෝ දහමෙහි කම්පා වීමෙන් නිදහස් වේ. මෙලෙස ධර්මය තමා තුළින් අත්දකින්නෙකුට තව කිනම් ආරක්ෂාවක් නම් අවශ්‍ය වේද?

යැදීම්, යාඥ්ඥා කිරීම්, පුද පූජා වලින් ආරක්ෂාව සොයා යා යුතු නොවේ. දහමෙහි සැබෑ අරුත තමා තුළින් අත්දැකිය යුතුය. අප දහම රකී

නම් අප විසින්ම අපගේ ආරක්ෂාව තහවුරු කරගෙන ඇත. ස්තෝත්‍ර, සූත්‍ර, යාඥා, සජ්ඣායනා කිරීම් මගින් ආරක්ෂාව හා ප්‍රතිලාභ සෙවීම බෙහෙත් වට්ටෝරුවක් හඬ නගා ගායනා කිරීමෙන් ලෙඩ සුව වේ යැයි සිතීමක් වැනිය. බෙහෙත් වට්ටෝරුවක අමු ද්‍රව්‍ය සකසා නිසි පරිදී භාවිතා කිරීමෙන් මිස වට්ටෝරුව උදේ හවස සජ්ඣායනා කිරීමෙන් රෝගයට ප්‍රතිකාරයන් බලාපොරොත්තු විය නොහැක. දහම අඩංගු ස්තෝත්‍ර, සූත්‍ර, යාඥා වනපොත් කිරීම, මුද්‍රණය කර ප්‍රදර්ශනය කර ගැනීම, ඇසීම නොව කළ යුතු වන්නේ එහි අන්තර්ගතය පිළිපැදීම, අනුගමනය කිරීම හා ඒ අනුව යමින් කිසිලෙසකත් ජීවිතය අතිපාතනය වීමට ඉඩ නොදී ජීවත් වීමයි. අපේ දරුවන්ට මෙම සැබෑ නිදහස ගැන කියා දිය යුතුය.

කුසගින්න, රෝ දුක්, ශෝක කිරීම්, වැළපීම්, මෙම ලෝකය තුළ ඇති ධර්මතාවන්ය. මෙම සංසිද්ධි නවතාලිය නොහැක. මේවාගෙන් නිදහස් විය හැකිද? ලෞකික ලෝකයේ නිදහස නොව භවයෙන් නිදහස් වීමට වෙර දැරිය යුතුය. ආගම යැයි කියාගන්නා සංස්කෘතික උත්සව, මෙගා කඨින, දස දහස් ගණනින් කරන මල් පහන් පූජා, කොඩි ගස් ගෙන යාම, වේල් පෙරහැර, රථ ඇදීම, සාන්තුවරයන්ගේ පිළිම වන්දනා ආදියෙන් සතුටක් ලැබෙන බව කිව හැකිය. ඒ ඔස්සේ භව ගමනින් එතෙර වීමට හැකි යැයි අප සිතන්නේ නම්, එය අපගේ විශ්වාසය නම්, අප කලබල විය යුතු නැත.

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි හෝ රහත් වීමට තව අපට බොහෝ කල් ඇති බවක් එයින්ම පෙනේ. ආත්ම විමුක්තිය පිණිස වූ සියලු ක්‍රමවේදයන් දහම තුළින්ම පහදා දී ඇත. සංස්කෘතික උත්සව ආගම ලෙස දකින චින්තනයෙන් නිදහස් වෙන්න. දහම පිළිපදිමින් ආත්ම නිදහස හා විමුක්තිය සාදා ගත යුතු යැයි සිතා වහ වහා කටයුතු කරන්නේ නම්, ආත්ම විමුක්තිය ලබන්නට අපට වාසනාව ඇත. මෙම භවයේදීම මාර්ග ඵල නිවන් පිණිස අපට කුසල් රැස් වී ඇති බව කිව හැකිය. පමා නොවෙමු. නිදහස් සටන අරඹමු.

ධර්මානුකූලව ජීවත් වීමට දහම ඉගෙන ගැනීම හා පෙළ දහම පිළිබඳ අවබෝධය ඉමහත් රුකුලක් වේ. අප දහම ඉගෙන ගත් බව තීරණය වන්නේ ආවර්ජනය කිරීමට අප දන්නා දහම් කරුණු ප්‍රමාණය මත නොවේ. පිළිපැදීම තුළින් සහ සෑම විටම ධාර්මිකව හැසිරීම තුළින් ඔබ ප්‍රදර්ශනය කරන ආධ්‍යාත්මීය පිරිසිදු බව අප දන්නා දහමයි. කෙස් පැළෙන තර්කයෙහි යෙදෙමින් පෙළ දහමෙහි වැරද්ද නිවැරද්ද සෙවීමට කාලය යෙදවීම නොවැදගත්ය. මමත්වය හුවා දක්වන තමාට ජය පිණිස වූ තර්ක ඉදිරිපත් කිරීම නොව දහම් අවබෝධය වඩා ගැනීම සඳහා දහම් සාකච්ඡාවෙහි යෙදීම වඩා උතුම්ය. සිල් වඩමු, සමාදම් වීම නවතා පිළිපදිමු. සීලයෙහි පිහිටමු. මෙම ආධ්‍යාත්මික ගමනට හරස්වන හා ජීවිතය නිකැලැල්ව පවත්වා ගැනීමට බාධා වෙන සියලු දේ වැරිය යුතුය. අනාගතයේ ලැබෙතැයි කියන දෙව් මිනිස් සැප

පිළිබඳ මොහොතකටවත් නොසිතමු. මෙම සිතුවිල්ලෙන් නිදහස් වෙමු. දහම ලොවට කියා දීමට පහළ වූ ශාස්තෘන් වහන්සේලාට තම ශාසනය තුළ ආගමකට කොටු වූ වහලුන් පිරිසක් අවශ්‍ය වූයේ නැත. සියලු බැම් වලින් මිදී නිදහස්ව ලෝ වැසියන්ගේ නිදහස පිණිසම ඔවුහු තම ජීවිත කාලයම කැප කළහ. දහම තුළ හැසිරීමෙන් ආත්මීය නිදහස් ලබාගන්නා පිරිසක් දැකීම උන්වහන්සේලාගේ පරමාර්ථය වූවා ට සැක නැත. තථාගතයන් වහන්සේලාට පුද පූජා දෙමින් මග ඵල නිවන් දැකිය හැකි යැයි සිතන චින්තනයෙන් වහා මිදෙන්න. උන්වහන්සේලාට කරන සැබෑ පූජාව දහමේ ප්‍රතිපදාවන්ට අනුකූලව හැසිරෙමින් කරන ප්‍රතිපත්ති පූජාවම බව තථාගතයන් වහන්සේ බලවත් ලෙස දේශනා කර තිබේ. අන්තවාදී විශ්වාසයන්ගෙන් නිදහස් වෙමු. ඥානවන්තව ක්‍රියාකරන්නා බෞද්ධයාය. ලැබෙතැයි සිතන පිනෙහි විශාල බව අපේක්ෂා කරගෙන පුණ්‍ය ක්‍රියා වල නොයෙදෙමු. පින් ලබා ගන්නා ආශාවෙන් දස දහස් ගණනින් පූජා වල යෙදෙන්නේ නම් අප තෘෂ්ණාවෙන් නිදහස් නැත. එය මග ඵල නිවනට බාධාවක්ම වේ. මෙම වතාවත් වල සංස්කෘතික වටිනාකමක් තිබිය හැකිවා මෙන්ම පින් රැස්වීමක්ද සිදුවනවා විය හැකිය. නමුත් ආත්ම විමුක්තිය සඳහා ඒවා අති විශිෂ්ට කටයුතු ලෙස අප දකී නම් අපගේ විමුක්තියට එයම බාධාවක් වන බව කිව හැක. ආත්ම නිදහස සඳහා පවුල් බරින් නිදහස් විය යුතුමද? සාමාන්‍ය ඇඳුමෙන් ඉවත්විය යුතුමද?

වෙනත් පාට ඇඳුමක් ඇඳිය යුතුමද? ගල් ගුහාවක විසිය යුතුමද? යහපත් ක්‍රියාවකින් හා ඉපයුම් මර්ගවලින් ඉවත්විය යුතුමද? එය එසේ නොවේ. දහම් මැනැවින් ඉගෙනගෙන තව බොහෝ පිරිසකට දහම් පණිවිඩය ලබා දීම අපගේ අරමුණ නම් ලෞකික බැඳීම් වලින් නිදහස් වීම අවශ්‍ය විය හැක. දහම අවබෝධ කොට ගෙන මාර්ග ඵලයන් ලැබීමට එවැනි නිදහසක් අවශ්‍ය නොවේ. සියලු පවින් වැළකීම, කුසල් වැඩෙන පරිදි කටයුතු වල යෙදීම හා තමාගේ සිතිවිලි මනාව පිරිසිදු කර ගැනීම, ශාසනය ලෙස සිතිය යුතුය. අප වචනයෙන් නිදහස් වෙමු. යහපත් සත්‍ය හා අවශ්‍ය දේ කතා කරමු. අධික මානව සබඳතා වලින් නිදහස් වෙමු. අපගේ කාලය සොරාගන්නා පෙළඹවීම් හා රුචිකම් වලින් නිදහස් වෙමු. දිට්ඨියෙන් නිදහස් වෙමු. සම්මා දිට්ඨිය යනු සැබෑ ලෙසම සියළුම දෘෂ්ටි වලින් නිදහස් වීමයි. අතීතයේ මතක සටහන් හා අනාගතයේ සිහින අතර ජීවත් වීමෙන් නිදහස් වෙමු. වර්තමානය එනම් මෙම මොහොතේ ජීවත් වෙමු. මෙම චින්තන නිදහස අප වහ වහා ලබා ගත යුතුයි. මෙම නිදහස ලබාගැනීම සඳහා සටන් කිරීමට ඇත්තේ මෙම මනුෂ්‍ය ජීවිතයම පමණක් බව සෑම විටම සිතිය යුතුයි. ඊළඟ ආත්මය නොව මෙම මිනිස් බවයේම සසරින් මිදීමට සිතා ගනිමු. භවයෙන් නිදහස් වීම සහ තමා තමාගෙන් නිදහස්වීම පරම මෝක්ෂයයි.

මුළාවෙන් මිදීම

මට මේ භවයේදීම නිවන් දකින්න පුළුවන්.

මිනිසුන් ලෙස ඉපදී සිටින අප මොහොතක අස්වැසිල්ලක් ලැබුවත් එය දුකකින්ම කෙළවර වන අතර දුකම පමණක් උරුම වූ සසරට වැටී දුක තුළම ගිලී ඇත. සත්ත්වයා භවයෙන් භවයට යමින් අඛණ්ඩව මෙම කෙළවරක් නොපෙනෙන දුකෙහි වැටෙයි. කටුක යථාර්ථයක් වූ මෙම සසර බිය දැකීමෙන්, එම දුකින් මිදීම නම් වූ පරම සැපත වන නිවන කරා පිවිසීමට මම යොමු වුනෙමි.

එම නිවන කරා යොමුවන දහම බුදුන්වහන්සේ පැහැදිලිව දේශනා කර තිබුණත්, දහමේ හැසිරෙනවා යැයි කියමින් ලෝකයා කරනුයේ ආගමක්, සංස්කෘතියක් ගොඩනගා ගෙන සීලබ්බත පරාමාසයෙහි යෙදීමයි. මා නිවනින් ඈත් කොට තබනුයේද මෙම බෞද්ධයින් යැයි කියා ගන්නා පිරිස් හා ඔවුන් ගෙන යන මෙම වැඩපිළිවෙලයි.

සීමාසහිත වූ ආයුෂයක් ඇති මෙම මනුෂ්‍ය භවයේ වැඩි කාලයක් අපතේ ගොස් ඇත්තේ ඉහත කී වැරදි වැඩපිළිවෙලෙහි යෙදීමට බව මට පසක් විය. ඒ ගැන සිතන විට මට ඇතිවනුයේ බලවත් කණගාටුවකි.මේ භවයේදීම නිවන් දැකීමට අපේක්ෂා කරන මා හට බුදු දහමට අයිතිවාසිකම් කියන ආගමික පූජකවරුන්ට මඟ පෙන්විය හැකිද? ඔවුන් කරනුයේ ඔවුන් විසින් ගොඩනගාගෙන ඇති බාහිර වත් පිළිවෙත් හා වෘත ක්‍රම වලට මා අනුගත කරවීම පමණි. මේ භවය තුළදීම නිවන් දැකිමට මා තුළ වූ කැමැත්ත, උත්සාහය ඒ තුළ සඵල විය හැකිද? මා මෙන්ම එම අවශ්‍යතාවය ඇති අනෙකුත් පිරිස් වලටද ඒ සඳහා සැබෑ ලෙසම මග පෙන්වන්නේ කවරෙක්ද?

ඒ මඟ කියා දෙන ස්ථානයක් මෙම දහම් දිවයින තුළ වේද?

නිවැරදි දහම පහදා දෙන කල්‍යාණ මිත්‍ර සේවනයක් මට හමු විය. නිවන බාහිරින් සොයාගත නොහැකි බවත්, නිවන සාක්ෂාත් කිරීම සඳහා තමා අභ්‍යන්තරයට පිවිසිය යුතු බවත් එහිදී මා හට පහදා දුනි. තමා අභ්‍යන්තරයේ පවතින මූල ස්වභාවය නැතහොත් ඇත්ත ඇති සැටියෙන් අවබෝධ කර ගැනිම නිවනට ඇති මාර්ගය බව මා හට වටහා දුනි. අතීතයත් අනාගතයත් අතහරිමින් මේ මොහොතේ තමා තුළ වාසය කරමින් යෝනිසෝ මනසිකාරයේ යෙදීම ඒ සඳහා ඇති උපාය මාර්ගය බව මා හට පහදා දුනි. එම උපාය නිවැරදි බවත් එම උපාය ක්‍රියාත්මක කිරීමෙන් ක්‍රමිකව නිවන තමන් තුළින්ම අවබෝධ වන්නක් බවත් කලණ මිතුරු ඇසුර තුළ මට පසක් විය.

මනුෂ්‍ය ආත්ම භාවයක් ලැබීම දුර්ලභය. බුද්ධෝත්පාද කාලයක එනම් අවිද්‍යාව දුරු වූ සමයක එය ලැබීම තවත් දුර්ලභය. එසේම මේ අවශ්‍යතා දෙකම සම්පූර්ණ වී ඇති නමුදු දහම නොපවතින දේශයක වනචාරී ගෝත්‍රයක ඉපදුණි නම්..? වාසනාවට අප දහම පවතින දේශයකද ඉපදී සිටිමු. මේ අවශ්‍යතා තුනම සම්පූර්ණ වුවද, දහමක් තේරුම්ගත හැකි බුද්ධියක් සහිතව නොඉපදුන වුන් සමාජයේ නොමැතිද? අපගේ ඒ අවශ්‍යතාවයන් සම්පූර්ණය. ප්‍රමාණවත් බුද්ධියක් සහිතව ඉපදී සිටිමු. ඉදින්.. තවත් අවැසි වන්නේ එක් කරුණක් පමණි. එනම් කලණ මිතුරු ඇසුරයි. එයත් සම්පූර්ණ වන්නේ නම් තවත් කුමට පමාවෙමුද? මෙය කල්ප ගණනාවකට වරක් ලැබී ඇති අවස්ථාවක් නොවේද? එය මඟහරිමුද? වහ වහා ආර්යය ගවේශණය කිරීමට මම තීරණය කළෙමි. ඔබ...?

අඳුරෙන් අලෝකයට

අවුලිකා ශ්‍රද්ධාව විපරීත කළ මනසට සැබෑ දහම ඕපනයික කරනු පිණිස

අප මාතෘ ධරණිය තුළ සැබෑ නෛර්යාණික ශ්‍රී සද්ධර්මය පිහිටා මේ වන විට ශත වර්ෂ විසි පහකට ආසන්න වී ඇත. වර්ෂ පන්දහසක් සම්බුද්ධ ශාසනය පවතින භූමිය ශ්‍රී ලංකාව බව අප අසා ඇත්තෙමු. ඓතිහාසික අනුරාධපුරයේ විසූ ඉපැරණි ගෙවිලියන්ට දිවා කාලායේ වී, කුරහන්, තල, මෙනේරි වේලාගන්නට පවා අපහසු වන සේ මහරහතන් වහන්සේලා සෘද්ධි බලයෙන් අහසේ වැඩිය බව අප අසා ඇත්තෙමු.

එදා ගම් නියම් ගම් හි ගල් ලෙනක් පාසා ගිරි ශිඛරයන්හි ඉදි කළ වෙහෙර විහාරයන්හි බවුන් වඩනා මහ සඟ ගනය. දිවා රෑ ගම් වැසි දනන් හට පා ගමනින් වැඩමවා දහම් දෙසන ආර්ය මහා සඟ ගනය. ගමක් ගෙයක් පාසා උදේ කල පිඬු සිඟා වඩිනා සීල ගුනෝපේත සංඝ රත්නයයි. සන්ධ්‍යා හඬ, හේවිසි හඬ ඇතුළුව සිව් දිශාවෙන් නැගුණ සාදු නාදයයි. පිරිවෙන්, පන්සල්, පාසල් හි ධර්මය වනපොත් කරන ගමේ දරු දැරියන්ය. මේ එදා බුදු පහස ලද අප මාතෘ භූමියේ ස්වභාවයයි. එයින් නෙලා ගත් සද්ධර්මය නමැති පල සතුටින් වැළඳූ සිව්වනක් මහ පිරිස සතර මඟ සතර පල ලබමින් සිත නිවා ගත්හ.

ගෙවුණු ශතවර්ෂ 25 මුළුල්ලේම දහමින් පෝෂණය වූ වට පිටාවක අදද අප ජීවත් වන්නෙමු. එනමුදු අතෘප්තිකර ජීවන ස්වභාවය අප තුළ තවමත් පවතී. අභාග්‍ය සම්පන්න සිදු වීම් මාලාවක් එදිනෙදා අසන්නට දකින්නට ලැබෙන වටපිටාවක් අපට උරුමව ඇත්තේ කෙලෙසක ද? අතීතයේ සිටි බෞද්ධයාට වඩා ධනය, හා තාක්ෂණය අප සතුව ඇතත් දහම් මඟට සමීප වීමට අපට නොහැකිවීමේ හේතුව කුමක් ද? ඉදි වී ඇති වෙහෙර විහාර සංඛ්‍යාව මුද්‍රණය වී ඇති දහම් පොත් සංඛ්‍යාව අසන්නට ඇති දහම් දේශනා සහ සහභාගි වීමට ඇති දහම් සාකච්ඡා දානය හා ශීලය සඳහා ඉඩ ප්‍රස්ථා එදා බෞද්ධයන්ට වඩා අති මහත්‍ය. එහෙත් අප දහමෙන් දුරස් වී භෞතිකයට සමීපව සිටිතැයි මට සිතේ. අත්‍ය ලංකෘත බොහෝ වෙහෙර විහාර පූද පූජා, නැමදීම් ඉහළ තැනෙහි තබා ගෙන අපට බාහිරව ඇති භෞතිකය දහම ලෙස අප සළකා තිබේනවා නොවේ ද? මෙම ආගමික සංකේත හා වත් පිළිවෙත් සරණ යාම හුදු භක්තිකයන්ගේ ලක්ෂණයක් වේ.

භක්තිය ශ්‍රද්ධාව බවට පත් කර ගත යුතු අවධියකට අප එළඹ සිටී. එය ක්‍රමිකව සිදු වේ යැයි කිසි සේත් නොසිතන්න. සත්‍යාවබෝධය පිණිස වත් පිළිවෙත් මෙන්ම සංස්කෘතිමය කටයුතු වලින් ගැලවීම පහසු

කටයුත්තක් නොවේ. ඒ සඳහා විප්ලවීය වෙනසක් ඔබ තුළින්ම පැන නැඟිය යුතුය. බිය නොවන්න. මේ පෙළඹවීමද සිදු කිරීමට අවශ්‍ය නිර්මල සම්බුද්ධ දේශනාව අප සතුය.

ඇතැම්විට මේ දහම් රසය ඔබට දැනී ඇතුවා මෙන්ම එයම පරම සත්‍යය බව ඔබවට හැඟී ඇතුවාටද සැක නැත. එහෙත් මිස දිටුවන්, පාපතරයන් යැයි ලෝකයා ඔබට චෝදනා කරති යන බිය - නොඑසේ නම් අන්ධ භක්තීන් හෝ අමූලික ශ්‍රද්ධාව නිසා ඔබ ඒ සත්‍ය මාර්ගයට ප්‍රවේශ වීමට බියෙන් පසුවෙනවා විය හැකිය. බිය නොවන්න. '' ධම්මො හවේ රක්ඛති ධම්මචාරි'' මේ අපේ සම්බුදු පියාණන්ගේ බුදු වදනයි.

මේ නිර්මල දහම අවබෝධ කරගත යුත්තේ තමා තුළටම පමුණුවා ගෙනය (ඕපනයික). නැතහොත් ඔබ තුළ ඇති අන්ධ භක්තිය සහ අමූලික ශ්‍රද්ධාව මගින් ඔබගේ ජීවිතය අධර්මයේ අන්ධකාරයෙන් වැසී යනු ඇත. මතුවටද සුගතිගාමී වීමක් ද සිදු නොවනු ඇත. තමා තුළට නැඹුරු වූ ආර්ය ගවේෂණය තුළින් පමණක්ම ධම්ම ගවේෂි වන්න. අප මහ බෝසකාණන් වහන්සේ ධර්මය අවබෝධ කර ගත්තේ එවැනි සුවිසල් ආර්ය ගවේෂණයක ප්‍රතිඵලයක් ලෙසය.

අඳුරේ අතපත ගාන අන්ධයන් සේ සංසාරය නම් ගොහොරු මඩේ එරී දුක් විඳිමින් මං මුළා වී නොගොස් ආර්ය සත්‍යය ගැඹුරින් සොයන මඟ පල නිවන් මගේ ගමන් ගන්නා කල්‍යාණ මිත්‍රයන් අප අතර තවමත් සිටී. ඔව්හු ගිහි හෝ පැවිදි උතුමන් විය හැකිය. ප්‍රිය සබඳ ඔබ මේ අනන්ත සංසාරයේ නිමක් නැති දුක්ඛ දෝමනස්සයන්ගෙන් පීඩා විඳිමින් මේ භෞතික ලෝකය නමැති මායාවට ගොදුරු වී ජීවත් වී මියැදෙන්නේ ද? ඔබ බෞද්ධ / හින්දු / කතෝලික / ඉස්ලාම් ආදී කවර ආගමික ශාස්තෘවරයෙකුට ගරු කළ ද කම් නැත. එකී උතුමන් විසින් දේශනා කළ සත්‍ය දහම් මඟ අවබෝධ කර ගන්නට ඔබ ඔබගේ වීර්යය වඩා ගන්න.

ඒ මගින් ඔබ, ඔබටත්, නිවසටත්, ගමටත්, සේවා ස්ථානයටත්, රටටත්, පරිසරයටත් හොඳ සේවා දායකයෙකු වනු ඇති බව මාගේ විශ්වාසයයි. ඔබ ඇසුරු කරන කල්‍යාණ මිත්‍රයන්ගේ සේවනය තුළින් අඳුරේ සිරව තිබූ මාගේ ජීවිතය ආලෝකමත් කරන පහනක් දල්වා ගෙන ඇතැයි මම සතුටු වෙමි.

ඔබටද එය දල්වා ගන්නට මඟ පෙන්වා දීම මාගේ යුතුකම යැයි උදක්ම විශ්වාස කරමි. එය මාගේ කළණ මිතුරු වගකීම බවද සිතමි. ඒ

සඳහා පෙළ දහම කියවන්න. කළණ මිතුරන්ට සවන් දෙන්න. ධම්ම ගවේෂී කල්‍යාණ මිත්‍රයන් ඔබ අවටම සිටිය හැකිය. ඔවුන් හඳුනා ගන්න. දැන්වීම් පල කරමින් ඔවුන් ඔබව කැඳවන්නේ නැත. ඔබ සොයන්නේ නම් ඔබට හමුවනු ඇත. සැබෑ දහම් මාර්ගය හඳුනා ගැනීමට නම් එවැනි කල්‍යාණ මිත්‍රයෙකුගේ ඇසුර අත්‍යවශ්‍යය. ඔවුන්ගෙන් සත්‍ය දහම හඳුනාගත හැක. එහි ගමන් කළ යුත්තේ ඔබමය. එය පහසු නැත. එහෙත් අපහසු ද නැත.

ප්‍රිය සබඳ මා ඔබට ඇරයුම් කරන්නේ තවත් කණ්ඩායමක සාමාජිකයෙකු වීමට නොව ඔබට ඔබ තුළම හුදකලා වීමට මඟ කියාදෙනු පිණිසය.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ශාස්තෘවරයාණන්, දහම සහ සංඝරත්නය

පැවිදි බිමට ඇතුළත් වී හෝ නොවී ශ්‍රාවක මහා සංඝරත්නයේ සාමාජිකයෙක් වෙමුද?.

වර්තමානයේදී අන් කවරදාකටත් වඩා ශ්‍රී ලාංකේය බෞද්ධයන් ශාසනික දියුණුව ඇති කිරීමේ අභිලාෂයෙන් අනේක විධ කාර්යයන්හි නියැලී සිටිනු දක්නට පුළුවන. සමහරෙක් අප මහා ශාස්තෲන් වහන්සේ වන බුදුන් වහන්සේ දැකීමේ පරම අරමුණින් සෑම මංසන්ධියකම බුදු පිළිම ඉදිකරමින් සිටී. තවත් සමහරෙක් ආසියාවේ විශාලම බුද්ධ ප්‍රතිමාව ඉදිකිරීමට සම්මාදමේ යති. එමෙන්ම තවත් පිරිසක් අසු හාර දහසේ පහන් පූජා, පිංකම්, උත්සව, පෙරහර සහ බෝධි පූජා සංවිධානය කරමින් සිටී. සත්‍යය වශයෙන්ම මෙවන් අනේකවිධ ක්‍රියාකාරකම් කිරීමෙන් ශාස්තෲන් සහ බුදු දහම දැකිය හැකිද? බුදු දහමේ පරම සත්‍යය අවබෝධ කරගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම් කෙසේ දායක වනු ඇතිද යන්න නුවණින් විමසීමට අප සැමට කාලය එළඹ තිබේ. බුදු දහමේ පරම සත්‍යය එනම් චතුරාර්ය සත්‍යය දැක සෝවාන්, සකෘදාගාමි, අනාගාමි හෝ අරහත් මාර්ග ඵල ලාභියකු බවට පත්වීමට මෙවන් වැඩපිළිවෙල හෙවත් ක්‍රියාකාරකම් කෙතරම් දුරට උපකාරීවේද යන්න අප නැවත නැවතත් නුවණින් විමසා බැලිය යුතු කරුණකි. බුදු දහම ගැඹුරින් අධ්‍යයනය කරන්නෙකු මනාව වටහා ගතයුතු කරුණ වන්නේ එය හුදෙක් ඉහතින් සඳහන් කරන ලද්දා වූ ඉතා ළාමකවූත්,

බොළඳවූත් ක්‍රියාවන්ගෙන් ඔබ්බට ගියා වූ අතිශය ප්‍රායෝගික වැඩපිළිවෙලක් බවයි. එය එසේ නොවන්නේ නම් අද වන විට මේ දිවයින තුළ ඉදිවී ඇති මෙන්ම ඉදිවෙමින් පවතින්නාවූත්, අති විශාල බුද්ධ ප්‍රතිමාවන්, මනස්කාන්ත විහාරස්ථාන මෙන්ම පවත්වන්නාවූ මහා පිංකම් සහ මහා උත්සව යනාදී වූ නොයෙකුත් ක්‍රියාකාරකම්වල අනුහසින් මාර්ග ඵල ලාභීන් අති විශාල සංඛ්‍යාවක් මෙම දිවයින තුළ වැඩ වසනු නොඅනුමානය. එනමුදු එය එසේම වී ඇතිද? නොඑසේ නම් මෙම ඉහත කී සියලු ක්‍රියාකාරකම් හුදෙක් සැරසිලි සහ ප්‍රදර්ශනය සඳහාම නොවන්නේද? අනන්ත බුදුගුණ, පිළිමයකට රූපයකට ලඝු කිරීමෙන් සීමා නොවන්නේද? මේ පිළිබඳව විමසන විට මට සිහියට නැගෙන්නේ මා විසින් මෑතකදී කරන ලද විදේශ සංචාරයකදී මාර්ගයක් අසල සවිකර තිබූ අති විශාල දැන්වීම් පුවරුවක සඳහන් පාඨයක්ය. එහි සඳහන් වූ ඉංග්‍රීසි පාඨයෙහි සිංහල තේරුම වූයේ "බුදුන් වහන්සේ සැරසිලි සඳහා නොවේය" (Buddha is not for Decoration) යන්නයි. එනමුදු සත්‍යය වශයෙන්ම අද වන විට අප රට තුළ සිදුවන්නේ එයම නොවන්නේද?

මෙය ඔබට මැනවින් වටහා දීම, අවබෝධ කරදීම සඳහා අති පූජ්‍ය වල්පොල ශ්‍රී රාහුල මහාචාර්යපාදයන් වහන්සේ විසින් රචිත "සත්‍යෝදය" ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලද පහත ඡේදය මැනවින් ඉවහල්වනු ඇතැයි මම සිතමි.

“ශාසනය නම් විහාර පන්සල් නොව සුචරිතයයි, ප්‍රතිපත්තියයි. ප්‍රතිපත්තිය මුදලට ගත නොහැක. බොහෝ අය ශාසනය වරදවා තේරුම් ගෙන සිටිති. අනුරාධපුරයේ මහා විහාරය වැනි විහාර දහසකටවත් රුවන්වැලි මහ දාගැබ වැනි ශ්‍රේෂ්ඨ දාගැබ් දහසකටවත් බුද්ධ ශාසනය එක මොහොතක් රැකගත නොහැක. දඹදිව තිබුණු දහස් ගණන් විශාල ගොඩනැගිලි ශාසනය රැකගැනීමෙහි පොහොසත් වූවෝද? ශාසනය හුණු බදාම ගොඩවල් වැනි නොවටිනා දෙයක් නොවේ. ශාසනය නම් ශීලයයි, සමාධියයි, ප්‍රඥාවයි. සම්මාදම් කරගත් මුදලින් මේවා ගත හැකිද? විහාර, පන්සල් කොපමණ තිබුණත් ඒ හේතුවෙන් ශාසනයේ දියුණුවක් නැත. එකම විහාරයක් හෝ පන්සලක් නැතත් යම් දිනක මනුෂ්‍යයා තුළ ගුණධර්මයෝ වෙත්නම් එදින ශාසනය ජීවමානව පවතියි.”

අද වනවිට අප රට තුළ පවතින්නේ මෙයම නොවන්නේද? රට තුළ නොයෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් වල යෙදී සිටින්නාවූ මංකොල්ලකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් මෙන්ම රට කරවන්නාවූ පාලකයන්ද අප මහා ශාස්තෘන් වහන්සේ මෙන්ම දහම සහ සංඝයා ඔවුන්ගේ කූට අභිමතාර්ථයන් ඉටුකරගැනීමේ අරමුණින් භාවිත නොකරන්නේද? නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියාකාරකම් කරන්නවුන් යහමින් මිල මුදල් යොදවමින් මහා උත්සව, පිංකම් සහ අති විශාල වූ බුදු පිළිම ඉදිකරමින් තම

සැබෑ ස්වරූපය සමාජය ඉදිරියේ වසන් කරමින් සිටී. පාලකයන් සැබැවින්ම ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල වූ ශ්‍රද්ධාවෙන් ක්‍රියාකරන්නේ නම් රටවැසි අප සැවොම ඉතා වාසනාවන්තය. එනමුදු සත්‍යය වශයෙන්ම ඔවුන් කරනුයේ අතිශය ඉහළ ගණයේ රඟපෑමක යෙදෙමින් ජනතාව මුළාකරමින් සිටීමක් නොවේද? ඔවුන් මහා නායක හිමිවරුන් මුණ ගැසෙති. ඉන් පසුව ජන මාධ්‍යයට ප්‍රකාශ නිකුත් කරති. මෙවන් ක්‍රියාවන් බුදු දහමෙහි විග්‍රහ කරනුයේ සත්ත්වයා සංසාරයට බැඳ තබන සීලබ්බත පරමාසයෙහි යෙදී සිටීම ලෙසිනි. අති පූජ්‍ය වල්පොල ශ්‍රී රාහුල ස්වාමීන් වහන්සේ විසින් රචිත "සත්‍යෝදය" ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලද පහත ඡේදය කියවීමෙන් ඔබට එය මැනවින් පැහැදිලි වනු ඇත.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ

"ගිහි පැවිදි දෙපක්ෂයම එකතුවී තථාගතයන් වහන්සේගේ නෛර්යාණික ධර්මය වෙළඳාමක්, මුදල් ඉපයීමේ මාර්ගයක් කරගෙන සිටිති. ඇතුළත ගුණධර්මයක් ගැන බලාපොරොත්තුවෙන් බණ කීමක් හෝ ඇසීමෙක් නැත. ධර්මය කණපිට පෙරළා ගෙන ක්‍රියා කෙරෙති. අද ගිහි පැවිදි දෙපක්ෂයම සාමාන්‍යයෙන් බෞද්ධ ප්‍රතිපත්තියෙහි නොව සීලබ්බත පරමාසයෙහි යෙදී සිටිති. සත්ත්වයන් සංසාරයට බැඳ තබන දස සංයෝජනයන්ගේ තුන්වැන්න සීලබ්බත පරමාසයයි. එනම් වැඳුම් පිදුම්, පිංකම්, උත්සව, පෙරහර, බෝධි පූජා වැනි බාහිර පුද සිරිත් වත් පිළිවෙත්

ආදිය උසස් ලෙස, අවශ්‍ය ලෙස, අගය කොට සළකා එහි ඇලී ගැලී සිටීමයි. මෙය නූගත්, අන්ධබාල, පෘථග්ජනයාට ස්වාභාවික දෙයකි. දැනට බෞද්ධ යන නමින් කරන වැඩවලින් සියයට අනූවකටත් වඩා සීලබ්බත පරමාසයයි. අද මේ කරන වැඩ පිළිවෙළින් බෞද්ධයන්ට කිසිත් සහනයක් නොලැබිය හැකි බැව් නුවණින් බලන්නෙකුට නම් හොඳහැටි පෙනෙයි".

වර්තමාන ශ්‍රී ලාංකික බෞද්ධයා නිවැරදිව අවබෝධ කරගත යුතු තවත් එක් කරුණක් වන්නේ මහා සංඝරත්නය යනු කවුරුන්ද යන්නයි. බුදු දහම අවබෝධ කරගැනීම සඳහා කළ්‍යාණ මිත්‍ර සේවනය මහඟුම සම්පතයි. කළ්‍යාණ මිත්‍රයන් නම් මහා සංඝරත්නයම නොවන්නේද? එනමුදු අද අප මහා සංඝරත්නය ලෙස හඳුන්වනුයේ කහ සිවුරක් හැඳගත් බෞද්ධ ස්වාමීන් වහන්සේට පමණක්ම නොවේද? එය එසේනම් නිවන් මාර්ගයට පිවිස සිටින්නා වූ මෙන්ම දහම සමාජයට බෙදා දෙන්නා වූ ගිහි පින්වතුන් හඳුන්වන්නේ කවුරුන් විලසින්ද? සංඝරත්නය නමදින (ඒ හා සමවන) ගාථාවේ සඳහන් වන්නේ "අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවක සංඝෝ" ලෙසයි. කවුරුන්ද මේ අට වැදෑරුම් පුද්ගලයින්? එය පහළ ජේදයේ මහාචාර්ය වල්පොල ශ්‍රී රාහුල හිමියන් විග්‍රහ කළ අයුරින් සිව් වැදෑරුම් මඟ ඵල හතර හා ඒ කරා යන මාර්ග හතරෙහි සිටින ගිහි පැවිදි පුද්ගලයන්ය. තම තමන් තෝරාගත්තාවූද, තම තමන්ටම හිතවත් වූ සංඝයා වහන්සේලා සරණ

ගොස් සිටින්නා වූද, ගිහි පින්වතුන් සිටින්නා වූ අද වන් දිනක මෙය නම් ඉතා සංකීර්ණ තත්ත්වයකි. එනමුදු නිවැරදි සංඝ රත්නය යනු කවුරුන්දැයි හරිහැටි අවබෝධ කරගැනීමට පහත සඳහන් උපුටා ගැනීමම ප්‍රමාණවත් වේ යැයි සිතමි.

“ සංඝරත්නය ගණිනු ලබන්නේ ගුණයෙන් මිස ඇඳුමින් නොවේ. ඇඳුම කුමක් වුවත් ගුණයෙන් යුත් පුද්ගලයා ශ්‍රාවක සංඝරත්නයෙහි අන්තර්ගත වෙයි. සෝවාන් මාර්ගය, සෝවාන් ඵලය, සකෘදාගාමී මාර්ගය, සකෘදාගාමී ඵලය, අනාගාමී මාර්ගය, අනාගාමී ඵලය, අර්හත් මාර්ගය, අර්හත් ඵලය යන මේ අට අවස්ථාවන්හි සිටි පුද්ගලයෝ අෂ්ඨ ආර්ය පුද්ගලයෝයි. මේ අට දෙනා මහා සංඝරත්නයයි. “පුද්ගලයා ගිහි වුවත්, පැවිදි වුවත් මෙහිදී එයින් කම් නැත. ගණිනු ලබන්නේ ගුණය පමණකි.” ”

(***සත්‍යෝදය*** - පූජ්‍ය වල්පොල ශ්‍රී රාහුල මහාචාර්යපාදයන් විසිනි)

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

සතං සමාගමෝ හෝතු

නිර්වාණ අවබෝධය සිදුවන තුරු පැතිය යුතු එකම පැතුම කළණ මිතුරු ඇසුරයි.

මිනිසා නිරන්තරයෙන්ම ද්‍රව්‍ය, පුද්ගල සිද්ධි සමග අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වමින් ජීවිතය ගෙවන නමුත් ඒවා කෙලෙස තමන් ස්පර්ශ කරන්නේද යන්න ගැනවත් අවධානයක් නොපවතින බවක් හැගේ. ජීවත්වීම තුළ ජීවත්වනවාද යන්න පවා අප හට ඇතැම් විට නොදැනෙන තරම්ම අප සංකීර්ණය. ඝන තිර රාශියකින් වැසී ගත් රූකඩ බඳුය. එවැනි රූකඩයක් තුළ සිටින තමා කවුරුද යන්න මිනිසෙකුට දැනගත හැකිනම් එය කෙතරම් නම් භාග්‍යයක්ද? එහිලා මාගේ අදහස නම් එවැනි වෙනසකට නව දැක්මක් නැතහොත් අධ්‍යාත්මික දෘෂ්ටියක් අපට අවශ්‍ය බවයි. නමුත් ලැබූ සහ ලබමින් සිටින අත්දැකීම් නම් අධ්‍යාත්මික දෘෂ්ටියකින් තොරව ඉහත කී රූකඩ රූපයෙන් මුක්ත වීමට දරණ ස්වයං උත්සාහය වනාහි කොහොල්ලෑ බබා හමුවට ගිය හාවාට සිදුවූ දෑමය.

නමුත් යමෙකුට කළ්‍යාණ මිත්‍ර සේවනයක් ලැබෙන්නේ නම් නිශ්චිත වශයෙන්ම නවමු දැක්මක් සහිත නව මං පෙත් විවර වනු වළක්වනු නොහැකිය. සැබැවින්ම කළ්‍යාණ මිත්‍රයකුගේ මුවින් නිරන්තරයෙන් පිටවනුයේ අනෙකාගේ යහපත පිණිස වන වදනක්මය. සත්‍යය වශයෙන්ම

කල්‍යාණ මිත්‍රයෙක් ලෙස මා දකිනුයේ ලොව පරම සත්‍යය අසන්නට දැනගන්නට දකින්නට සලස්වන උත්තමයෙක්මය.

විශ්ව ගම්මානයේ මායාවට හසුව ලොව පරම සත්‍යය නොව, අසත්‍යයම සත්‍ය ලෙස ප්‍රකටව පවතින යුගයක කල්‍යාණ මිත්‍රයෙක් හමුවීම භාග්‍යයකි.

සැබැවින්ම මාගේ ජීවිත අත්දැකීම නම් සංසාර කුසල් බලගැන්වී මා ලැබූ කල්‍යාණ මිත්‍ර සේවනය තුළ මා හට සද්ධර්මය ශ්‍රවණය කිරීමටත් එය ජීවිතයට ගලපා ගැනීමටත් හැකිවීම තුළ මා මින් පෙර සඳහන් කළ ඝන තිර පටල ක්‍රමයෙන් දුහුල් වී ශාන්ත වූ රශ්මි දහරාවන්ගෙන් ජීවිතය ඒකාලෝක වන බවත්, උපතේදී යමකු තුළ පවතින්නේ යැයි සිතිය හැකි සරල බව කරාම නැවත ගමන් ආරම්භ කර ඇති බවත්ය.

ජාති ආගම් බේදයකින් තොරව මිනිසා, මිනිසා ලෙස ජීවත්වීමේදී පැවැතිය යුතු සත්‍යය කෙරෙහි එනම් ආදරය, මෛත්‍රිය සහ කරුණාව පෙරදැරි ජීවිතයක් ලබනුයේ කෙසේද? තමා තුළ අභ්‍යන්තර සාමය පුහුණු කරනුයේ කෙසේද යන්න අප උගත යුත්තේ කල්‍යාණ මිතුරු ඇසුරකින්මය.

උපතේ සිට යදම් ලූ ජාතිය, ආගම, කුලය වෘත්තීය ආදී සියලු බැමි වලින් නිදහස් වීමට හැකිවනුයේ පරම සත්‍යය, සත්‍යය ලෙසින් අවබෝධ කරගත හැකි වූවෙකුට පමණි. මෙකී සත්‍යය ප්‍රායෝගිකත්වයට මුසුවූ කල්හි

දැනෙන සැහැල්ලුව කිසිවකුටත් විස්තර කිරීමට අපහසු වනු ඇත. එතෙක් බාහිර ලෝකය කරා යොමුවූ සාපේක්ෂ දෑස නිරපේක්ෂ වනුයේ නිරුත්සාහිවමය. යමෙකුට නිරපේක්ෂ දෑසක් හිමිවනුයේද ඔහු සැබෑ සිහියකින් මනා අවබෝධය ලද්දේ වෙයි. නොනිත් තරඟයක නිරත සමූහය තුළ ඔහු කෙතරම් නම් සාමකාමීද? කෙතරම් නම් පරාර්ථකාමීද? එවන් වූවෙකු සමස්තය එකක් බවත් එකම සමස්තයක් ඇති බවත් මොනවට වටහා ගනී. එලෙසම එවැන්නෙකුට අනෙකා තුළ පහසුවෙන් දියවී යා හැකිය. යමෙකුට තමන්ගේ ජීවිතය ඒ තැන කරා ගෙන ඒමට හැකි නම් මිනිසෙකු ලෙස අවකාශයෙන් මෙන්ම විශ්වයෙන් ලද ප්‍රාණයට පුද කළ හැකි උතුම්ම සම්මානයත් එය යැයි සිතමි. එවිට අප නිරන්තරයෙන් ආරක්ෂා කිරීමට උත්සාහ දරණ ප්‍රාණ අතිපාතනය නොකිරීමේ (ආරක්ෂා කිරීමේ) ශික්ෂා පදය නිරුත්සාහීවම ආරක්ෂා වේ. මෙසේ උතුම් වූ ප්‍රාණය අප අතින් නිරුත්සාහිවම අර්ථ සම්පන්න ලෙස ආරක්ෂා නොවන්නේද? එවිටයි අපට වැටහෙනුයේ අපගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය එය බව. නමුත් මේසා අතිශයම ගැඹුරු වූත්, ඒසා ම සරල වූත් මෙකී සත්‍යය අප සෙව්වේ කොහේද? පල්ලියේද, පන්සලේද, කෝවිලේද, කිසි දිනෙක ඔබට හෝ මට මෙම සත්‍යය එකී කිසිදු භූමියකින් සොයා ගත නොහැක. එසේ වන්නේ ඇයිද අපට සොයා බලන්නට හෝ හැකියාවක් හෝ නැති වන තරමට මෙකී භූමීන්

සත්‍යය භූමිකාවෙන් බැහැර වූ වෙනත් භූමිකාවන්ට ජීවිය දීමට උත්සාහ දරන්නේ බාහිරයට යොමුවූ සාපේක්ෂතාවය තව තවත් තහවුරු කරමින් නොවේද? ඉදින් සත්‍යය සොයා ගමන් ඇරඹීමේ නිමේෂය කළ්‍යාණ මිත්‍ර සේවනය සොයා ගමන් ඇරඹීමේ නිමේෂය... තීරණය කළ යුත්තේද අපමය.

අප සත්‍යය අත්දකින කල්හි අවබෝධය අත්දකින කල්හි මනා සිහිය අත්දකින කල්හි අපට අතිශය සමීප සමාජය කෙතරම් නම් අසරණ තත්ත්වයකට පත්ව ඇත්දැයි මනාවට වැටහේ. ඔවුන්ගේ ජීවිත බොහෝමයක් සත්‍යයයේ සේයාවකදු මතු වී නොඑන තරමට භෞතිකයේ පාලනයට නතුවී හමාරය. ආත්මාර්ථකාමී බව ඔවුන් වසා සිටින වළාවන් බඳුය. මොවුන් තුළ නිදන්ගතව ඇති සත්‍යයයේ බීජය පෝෂණය කරවාලිය හැක්කේ සත් පුරුෂයෙක් වූ කළණ මිතුරෙකුටම පමණි.

උත්තම වූ සත්පුරුෂ සේවනය තුළ යමෙකු ශ්‍රවණය කරන දෑ අවබෝධ කරගන්නට තරම් කුසලයෙන් පූර්ණ වූයේ නම් ඔහු තුළ ඇති ආශ්‍රව දුරුවන්නේ හිරු දකින පිණි සේය. මෛත්‍රිය, මුදිතාව, කරුණාව රැස් විහිදුවන්නේ උදෑසන හිරු දුටු සියපතක් ලෙසමය. රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් සත්‍යයට පිටුපා සිටින්නවුන්ගේ ක්‍රියාවන්, සිතුවිලි නිසා මේ ධරණී තලය කෙතරම් නම් අධ්‍යාත්මිකව දූෂණයට ලක්වන්නේද? මෙහිලා අපගේ දායකත්වය කෙබඳු වේ දැයි සිතීමෙන්වත් අප මේ ධරණී තලයට

කෘතවේදී වන්නේද? ආධ්‍යාත්මික දූෂණය නවතාලන්නට නම් පළමුව තමා තුළ තමා නිදහස් වීම ආරම්භ කළ යුතුමය. තමා තුළ නිදහස් වූවකු කෙතරම් නම් මෛත්‍රී සහගතද? මුදිතා ගුණයෙන් පූර්ණද? කරුණාවෙන් අනූනද? එවැන්නවුන් මේ ධරණී තලයට මුදාහරින ශක්ති ධාරාවෝ හේතුවෙන් ආධ්‍යාත්මික දූෂණය තුලනය වී පවතින සෙයක් දැනේ. තමා තුළ තමා නිදහස් වීම ආරම්භ කළ යුත්තේ ශ්‍රී සද්ධර්මය අර්ථ පූර්ණව ශ්‍රවණය කිරීමෙන්මය. වර්තමානයේ එසේ ශ්‍රවණය කිරීමට හැකිවන්නේ උතුම් වූ ආර්ය ශ්‍රාවක කළ්‍යාණ මිත්‍ර සේවනයක් ලදහොත්ම පමණි. ඉදින් තමාගේ පූර්ණ නිදහස් වීමේ ගමන් මාර්ගයට පිලිවිසිමේ නිමේෂය කාලය ඉක්ම යන්නට පෙර සොයා යාමට ඔබට හැකිවන සේ ඔබගේ සංසාර කුසල් පූර්ණ වී බලගැන්වේවා!

© මානව ධර්මය හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

හරිමග

ලොවම දිනුවද නොලැබෙන සැබෑ සතුට ලැබිය හැකි එකම මඟ .

මා ජීවත් වූ ජන සමාජය විසින් දයාද කළ ජාතික, ආගමික, සංස්කෘතික දේශපාලනික මූලයන්ට සාපේක්ෂව වෙර වීරිය යොදා ගොඩ නැඟූ ජීවිතය තුළ මම තෘප්තිමත් නොවූයෙමි. නමුත් සමාජය මා සාර්ථක පුද්ගලයෙකු බව අගයන්නට විය. සමාජය සාර්ථකත්වය මනින මාන තුළ අප සොයන සැබෑ සතුට අන්තර්ගත වේද? එසේ නොවන බව පසක් වූවත් සංකීර්ණ දිවි පැවැත්ම තුළ එවැන්නක් සොයා යාමට හැකිද? මා නිරන්තරයෙන් පිළිතුරු සොයමින් සිටි මෙවැනි ප්‍රශ්න ගණනාවකි. වනන්තර, ගල් ගුහා වැනි ස්ථානවල පාරිශුද්ධවූ සතුටකින් සිටින මිනිසුන් ගැන මා අසා තිබුණි. ඔවුන් පාරිශුද්ධ වූ සතුටක හිමිකරුවන් බව බොහෝ පොත්පත්වලද ලියැවී තිබුණි. පාරිශුද්ධ වූ සතුටක් කෙරෙහි මාගේ සිහිනය ජීවිත කාලය පුරාවටම යථාර්ථයක් නොවනු ඇතැයි මම සිතුවෙමි.

දිනෙක මම එය එසේ නොවන බව හොඳින් වටහා ගතිමි. කළණ මිතුරු ඇසුරක් තුළ තහවුරු කරගත් යථාභූත ඥාණ දර්ශනය දකින ලෙස පිහිටුවා ගත් ඍජු අවධානය සහිතව එදිනෙදා වැඩ කටයුතු සියල්ල සිදු කළ යුතු අතර සතිමත්ව නිවහන (ශරීරය) තුළ ජීවත්වීමද පුහුණු විය යුතුය. මෙම පුහුණුව පවුල් ඒකකය තුළද රැකියා ස්ථානය තුළද, ජන සමාජය තුළද

මැනවින් සිදුකිරීමට නුවණැත්තන්ට හැකිය. මේ සඳහා විශේෂ ඇඳුමක, විශේෂ ස්ථානයක අවශ්‍යතාවක් නොමැත. සෑම දිනකම දවස පුරාම අඛණ්ඩව සිදුකළ යුතු පුහුණුවක් තුළින් සාමය සතුට හා පාරිශුද්ධත්වය ජීවිතයට එකතු වන්නේ නිරායාසයෙනි. තමා අතහැර සියල්ල දැකිය හැකි ප්‍රඥාවද පහළ වනු ඇත. ස්වයං මර්ධනයකින් තොරව ආධ්‍යාත්මික ගුණ වගාව ජීවිතය පුරාවටම පිහිටනු ඇත.

ආධ්‍යාත්මික වැඩපිළිවෙළකට අවතීර්ණය වීමට ප්‍රථම බාහිරට අපව ඇද බැඳ තබන දම්වැල් වලින් නිදහස් විය යුතුය. එය තනිව සිදු කරගැනීමට අපහසු වනු ඇත. සාර්ථකව එය සිදු කරගැනීමට සිය යදම් බිඳ ගත් කළ්‍යාණ මිතුරෙකු ඇසුරු කළ යුතු වේ. දේශන වලට සවන් දීමත් සරල අභ්‍යාස නිති පුහුණු වීමත් හේතුවෙන් පූර්ණ යටහත් භාවය අප තුළ ඇතිවන්නේය. මෙම පූර්ණ යටහත් භාවය හදවතකින් හදවතකට දහම සම්ප්‍රේෂණය වීමට දොරටු විවර කරනු ඇත.

ආධ්‍යාත්මික සතුට

ඔබගේ නිවහන තුළ වළ දමා ඇති මහා නිධානය ගොඩගැනීමට අවශ්‍යද? .

ආධ්‍යාත්මය හා සතුට පිළිබඳ මම දන්නා කරුණු බිඳක් ඔබ හමුවේ තබන්නම්. පළමුව අපි ආධ්‍යාත්මය යනු කුමක්දැයි සොයා බලමු. ආධ්‍යාත්මය යනු අපගේ අභ්‍යන්තරය පිළිබඳව විද්‍යාත්මක සොයා බැලීමකි. අප බාහිරව පවතින නොයෙකුත් ද්‍රව්‍ය, පුද්ගලයින් හා සිද්ධි පිළිබඳව සොයා බලනවා විනා කිසියම් හෝ දිනයක අපගේම අභ්‍යන්තරය පිළිබඳව සොයා බැලුවාද?

අප නිරන්තරයෙන්ම පෙළඹී සිටින්නේ බාහිර ලෝකය සමග ජීවත්වීමටයි. දවසින් ඉතාම සුළු කාලයක් හෝ අප, අප ගැනම සිතා බලනවාද? එයින් හැඟෙන්නේ අප අපටම ආදරය නැති බවයි. අප ආදරය කරන්නේ ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධි වටා ගොඩ නැගුනු බාහිර ලෝකයකටයි. ඒ ලෝකය තුළ අප සැබෑ සතුටක් අත්විඳිනවාද? මට හැඟුනු දෙය නම් සැබෑ සතුට ඇත්තේ අප තුළම අප අභ්‍යන්තරයේ බවයි. එසේ නම් සතුට සොයා අප අපේම අභ්‍යන්තරය ගවේෂණය කළ යුතුය.

© මානව ධර්ම සහ ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

මෙම අභ්‍යන්තර ගවේෂණයෙහි නිරතවීමට නම් එහි වටිනාකම දැන සිටිය යුතුයි. අභ්‍යන්තර ගවේෂණය පුහුණුවකි. එම පුහුණුවේ අවසානය නිර්වාණ අවබෝධයයි. මෙම ආධ්‍යාත්මික විද්‍යාව හැදෑරීමෙන් ගැටුම් සහගත, පීඩාකාරී, අපේ නොමඟ ගිය ජීවිත සුමඟට හරවා එහි පීඩාකාරී බව

අඩුකර සතුට උදාකර දෙයි. එමගින් ජීවිතයේ දුක් කම්කටොළු වලින් ගැලවී යාමටත්, යථාර්ථය හඳුනාගැනීමටත් හැකිවේ.

විශේෂයෙන් මෙය හැදෑරීමෙන් දුකින් පිරීගිය මේ සසර ගමන කෙටිකරගත හැක. එපමණක් නොව විරිය වඩා භව බණ්ඩනයද සිදු කළ හැක. මෙම භව බණ්ඩනය සිදුකර නිවන් දැකීම තරම් සතුටක් අපට තවත් කොහි ඇද්ද?

මේ භවය තුළ මොහොතකුදු අප සැප වින්දත් එහි කෙළවර දුක රැඳී ඇත. අප දැනගත යුතු වැදගත්ම කරුණක් නම් සැප පිටුපස නිරන්තරයෙන්ම දුක පවතින බවයි. නමුත් ඔබට තමාගේම ආධ්‍යාත්මය අවබෝධ කරගැනීම තුළින් සියලු දුක් නැතිකරගත හැකිය.

ආධ්‍යාත්මික ගවේෂණය තුළින් මම හඳුනාගත් තවත් යමක් ඔබට පැවසීමට කැමැත්තෙමි. එනම් අප සෑම මොහොතකම සිටින්නේ අතීතයේ හෝ අනාගතයෙහිය. අප විසින් පෙර මතකයන් හෙවත් ප්‍රපංචයන් මොළය ඇසුරු කරගත් මතක ගබඩාවෙහි තැන්පත් කරගෙන ඇත. අපි ඒවා නැවත නැවතත් සිහිපත් කරමින් වටිනා කාලය මිඩංගු කරමින් භවය, ලෝකය ඉදිරියට පවත්වාගෙන යමින් සිටින්නෙමු. එම අතීතයේ මතක සටහන් ඔස්සේ අපි අනාගතය ගැනද සිහින දකින්නෙමු. මොහොතකුදු අප මේ මොහොතේ නොඑසේ නම් වර්තමානයෙහි රැඳී සිටියාද? අපි මේ මොහොතේ සිටිමින් අපගේ එදිනෙදා වැඩකටයුතු සිදුකළා නම්, අනවශ්‍ය

ප්‍රශ්න වලින් මිදී එම කටයුතු ඉක්මණින් හා වඩාත් නිවැරදිව නිමාකර ගත හැක.

අප වර්තමාන ලෝකයේ, පවුල් ඒකකයක් ලෙසින් ස්වාමි පුරුෂයා හා භාර්යාව වශයෙන් දුවා දරුවන් ඇසුරේ සිදුකරන ජීවන අරගලය හමුවේ මෙවැනි පුහුණුවක යෙදිය හැකි දැයි ඔබ කල්පනා කරනු ඇත. ඔබගේ ජීවිතය එක් දෙයක් ලෙසත්, මෙම පුහුණුව බාහිරව පවතින තවත් දෙයක් ලෙසත් නොසළකා ජීවිතයේ සෑම මොහොතකම පුහුණුව තුළම ජීවත්වන්න. මුළු ජීවිතයම පුහුණුවකි. මම එය කර බැලුවෙමි. එය කළ හැකි දෙයකි.

පවුල් ජීවිතය තුළ සිදුවන විවිධ හැලහැප්පීම්, මානසික බිඳවැටීම්, දරුවන්ගේ අධ්‍යාපන හා සෞඛ්‍ය ආදී ප්‍රශ්න හමුවේ නොසැලී සිටීමට මට ශක්තිය දුන්නේ මෙම ආධ්‍යාත්මික පුහුණුවයි. සැමියාත්, දරුවනුත් තමාත් අතර ඇත්තේ පුහුණුවෙන් බැඳුනු ජීවන රටාවකි. අපි ගැටළු විසඳාගන්නේ ඒ අනුවයි. ජීවිතයේ සතුටු දනවන මොහොතක් වුවද අප ගත කරන්නේ පුහුණුව තුළමයි. එවැනි අවස්ථාවල වැරදි නිගමන වලට නොඑළඹී ජීවිතය මංමුළා නොවීමටත්, දුක නම් වූ යථාර්ථයෙන් බැහැර නොවීමටත් මෙම පුහුණුව මට බොහෝ සෙයින් උපකාරී වෙයි. ඒ හැමටත් වඩා පුහුණුව තුළින් ලබන එම අවබෝධය නිසා මාගේ පවුල තුළ සතුට හා සාමය පිරී ඇත. අවසානයේ මෙම සියලු දේත් සමගම මම මගේ ජීවිතයද දකින්නේ පුහුණුවක් ලෙස පමණි.

වර්තමානයේ ගිනි ගොඩක ජීවත්වෙමින් මතු භවයේ සතුටින් සිටීමට යැයි කියමින් පින් රැස්කිරීමට මහන්සි වනවාට වඩා මෙම ජීවිතය සාර්ථකව හා සතුටින් ගතකිරීමට මෙම පුහුණුව බොහෝ සෙයින් ඉවහල් වෙයි. එපමණක්ද නොව මෙම පුහුණුව නොකඩවා සිදුකිරීමෙන් අපට මාර්ග ඵලයකට වුවද පත්විය හැක. මාර්ග ඵලයකට පත් නොවූවත්, යටත් පිරිසෙයින් මේ ජීවිතය සතුටින් ගතකිරීමේ වාසනාව ඔබට අනිවාර්යයෙන් උදාවෙයි. ඉතින් අපගේ ජීවිතයේ එදිනෙදා වැඩකටයුතු කරගනිමින්ම පුහුණුව තුළින් එම ගමන යා හැකිව තිබියදීත්, ඔබ බාහිර ලෝකයම බදාගෙන සිහි විකල්වී දඟලන්නේ ඇයි? මේ මොහොතේ පටන් නිවැරදි සිහියෙන් පුහුණුව තුළ කටයුතු කරන්නේ නම් අපට මේ ජීවිතයේ සතුටත්, පරම සතුට වන නිවනත් බොහෝ දුර නොවේ

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ඉතින් එන්න.... අපි අපේ ඇතුලාන්තය ගවේෂණය කරමු. ආධ්‍යාත්මයට පිය නඟමු. ඒ සඳහා ඔබට දිරිය ශක්තිය හා නුවණ ලැබේවා !

විශ්ව නියාම

සොබාදහම අවබෝධයෙන් මායාවන්ගෙන් ගැලවීම සඳහා.

අප ජීවත්වන්නේ අනන්ත වූ විශ්වය තුළය. තවද විශ්වයට පොදු වූ විශ්වය පුරා පැතිර ඇති විශ්ව ධර්මතාවයන් පවතී. සත්ත්වයා බිහිවන්නේ පෝෂණය වන්නේ පාලනය වන්නේ මෙම විශ්ව දහමට අනුවය. විශ්ව දහම අප වෙත ලඟාවෙන්නේ අප ජීවත්වන සොබා දහම තුළින්ය. එනම් අප වටා ඇති පරිසරය තුළින්ය. විශ්ව දහම සියලු සත්ත්වයන් හට සර්ව සාධාරණ වන අතර, කිසිවකු කිසිවිට විශේෂ කොට නොසලකා එයට ආවේණික ලෙස කටයුතු කරයි.

අප එන්නේ කොහි සිටද? අප යන්නේ කොහාටද? ජීවය කුමක්ද? මරණය කුමක්ද? උපතත් මරණයත් අතර අපගේ ජීවිතය කුමක්ද? විශ්ව අවශ්‍යතාව කුමක්ද? අප මෙලොව බිහිවූයේ ඇයි? යන මූලික ගැටළු සඳහා පිළිතුරු සත්‍යය දහම තුළ ඇත. සත්‍යය වශයෙන්ම අප සැමවිටම අනුගමනය කළ යුත්තේ දැනට මෙලොව පවතින ආගමක්, දර්ශනයක් හෝ ඉතිහාසයක් නොව සත්‍යය දහමය. ලොව පහළ වූ විවිධ ශාස්තෘවරුන් තමා අවබෝධ කරගත් පරිදි සොබා දහමට අනුකූලව දේශනා කළ අතර තථාගතයන් වහන්සේ විශ්වයේ සත්‍යය දහම දැක දැනගැනීමෙන් බුද්ධත්වයට පත්වූ සේක.

විශ්ව දහමේ සුවිශේෂී ගුණාංගයන් වන ද්විත්ව ස්වභාවය නිසා විශ්වය තුළ ප්‍රකෘතිය මෙන්ම විකෘතියද හටගන්නේය. උපත සමඟ මරණයත්, ආදරය සමඟ වෛරයත් ඇත්තේ මේ ස්වභාවය නිසාය. අටලෝ දහමේ යස අයස, නින්දා ප්‍රශංසා, දුක සැප, ලාභ අලාභ, ද්විත්ව ස්වභාවය මිනිසා දැනගන්නා, විඳගන්නා අයුරු තහවුරු කරයි.

විශ්වයේ සත්‍යය දහම තේරුම් ගැනීමට නම් අප සොබා දහම තේරුම් ගත යුතුය. මන්ද විශ්වයේ සත්‍යය දහම අප වෙත ලඟාවනුයේ මායාකාරී සොබා දහම හරහායි. මායාකාරී සොබා දහම මූලිකව ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධි ලෙස හඳුනාගත හැකි අතර, මේවා ඇතිවන හේතූන් වන නියාම ධර්ම 05 ක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

(c)
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ

01 ඍතු නියාමය - වර්ෂාව, සුළඟ, උෂ්ණත්වය හා පාරිසරික හා දේශගුණික විපර්යාස සිදුවන්නේ මෙම නියාමය නිසාය.

02 බීජ නියාමය - ගස් වැල් පවා පරම්පරාවක් ලෙස පවතින්නේ බීජ නියාමය නිසාය.

03. කම්ම නියාමය - කර්ම ඵල මෙයින් උපදී. පුද්ගලයා චේතනා මුල් කරගෙන කළ කර්මයන් අනුව විපාක ලැබීම කම්ම නියාමයයි.

04. ධම්ම නියාමය - විශ්වයේ සියලු ගති ලක්ෂණයන් ධම්ම නියාමයන්ය.

05. චිත්ත නියාමය - සිතේ යෙදෙන චෛතසිකයන් හේතු කරගෙන හේතුවක ඵලයක් ලෙස සිත් පරම්පරාවකට අනුව ක්‍රියාත්මක වීමයි.

ඉහත නියාම පහෙන් පැහැදිලි වනුයේ විශ්වය තුළ සිදුවන සෑම දෙයක්ම සිදුවනුයේ හේතුවක ඵලයක් ලෙස හෝ සත්ත්ව ක්‍රියාකාරකමක් නිසාය. මෙම නියාම එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හේතුකොට ගෙන විපාක සකස් වේ.

සත්ත්ව කළලය බිහිවන්නේද, කළලය ක්‍රමයෙන් වැඩෙන්නේද, ශරීරය පද්ධතියක් ලෙස වැඩෙන්නේද සොබා දහමේ පවතිනා ජීව සාරය උපයෝගී කරගෙනය. සත්ත්වයාට අවශ්‍ය සියලු දෙය සොබා දහමෙන් සපයන අතර, ඉන් ප්‍රධාන ලෙස කුසට ආහාර, ගතට වස්ත්‍ර, හිසට සෙවණක්, ලෙඩට බෙහෙත් යන සියලු දේ සොබා දහම නොමිලේ සපයන අතර මිනිසාගේ මෝහය මත සිදුවන තරඟය හේතුවෙන් සොබා සම්පත් සඳහා මිලක් නියම වී ඇත. ඔබ පරිභෝජනය කරන ඕනෑම දෙයක මූලික ආරම්භක පදනම වී ඇත්තේ ස්වාභාවික සම්පත්ය.

ඔබ වෛර කරන්නා තුළද ඔබ තුළද ඇත්තේ එකම ජීවයයි. එය සමස්ත විශ්වයේම ජීවයයි. ඔබ අප්‍රිය කරන පුද්ගලයා ද ඔබද අත් විඳින්නේ

එකම සතුටයි. එය විශ්වයේ සතුටයි. ඔබ නොවන අන් අය තුළද ඔබ තුළද හටගන්නේ එකම ආදරයයි. එය විශ්වයේ සමස්ත විශ්වයේම ආදරයයි. මෙම විශ්වයේ ජීවය, සතුට හා ආදරය මෙන්ම දුකද මගේය, ඔබේය කියා සිතීම අනුවණකමකි. එමෙන්ම මෙම විඥාණයද ඔබේය මගේය කියා වෙන් කළ නොහැක. එය සියලුම සත්ත්වයන්ට පොදුවේම පහල වනු ඇත. මෙම විශ්ව යථාර්ථය තුළ අප දියවී නොයන තෙක් විශ්වයේම ශක්තිය යොදවමින් පෞද්ගලිකත්වය සංස්කාර කරන්නේය. සියලු සංස්කාර සත්‍යය නොවන බැවින් අනිත්‍ය වන්නේය. බිඳෙන, පෙරළෙන ලෝකය ලෙස මෙම සංස්කාර පවතිනු ඇත. පෙණ පිඩක් වන් රූපය මත, දිය බුබුලක් වැනි වේදනාවක් විඳ, මිරිඟුවක් වූ සංඥාවකින් දැන හඳුනාගෙන, කෙසෙල් කඳක් සේ අරටුවක් නැති සංස්කාර බිහිකිරීමට සමත් වන්නේ විඥාණයේ මායාකාරී හැසිරීමයි. විඥාණයේ මායාව තුළ පොදු මෙන්ම සමාන දෙයක් පෞද්ගලික මෙන්ම අසමාන ලෙස දැක හඳුනාගෙන චේතනා සංස්කාර කර එය විඥාණික කිරිම සිදුකරයි. සැබෑවටම මෙම ක්‍රියාවලිය ඔබ සහ ඔබේ නොව, සොබා දහමේ විශ්ව නියාමයයි. මෙය සොබා දහමට අතහැර දැනට ඔබ ලෙස ගෙන සිටින සියලු දෙයින් ඔබ නිදහස් වන්න. මුළු ජීවිත කාලයටම ඔබ සාක්ෂිකරුවකු වන්න. බලා සිටින්න නිගමන වලින් තොරව, සැනසීම සහ සාමය පමණක් ඉතිරිවන තුරු.

උඩුගම් බලා

ළමා වියෙන්ම ඇරඹිය හැකි සසර සැඩ පහර පරදවන සව්මා වායාමය.

සත්‍යය මාර්ගයෙහි ගමන් කිරීම උඩුගම් බලා පිහිනීමක් ලෙස මම දැනගතිමි. මෙය මෙසේම දැනගෙන සිටියත් බොහෝ අය මෙම උඩුගම් බලා යාම ආරම්භ කරනුයේ ජීවිතයේ සැඳෑ සමයේය. ඊට ප්‍රමාද වැඩි බව මට වැටහුණි. මක්නිසාද යත් සැඳෑ සමයට පැමිණෙන විට සංසාරික ප්‍රවාහය තුළ බොහෝ දුර පහළට ගසාගෙන විත් හමාරය. එබැවින් මම ශිෂ්‍ය අවදියේදීම උඩුගම් බලා පිහිනන්නට අධිෂ්ඨාන කළෙමි. ඒ සඳහා බොහෝ නිර්භීත විය යුතුය. සැනසීම ගෙන දෙන සත්‍යය ඇත්තේ කඳු මුදුනෙහි නම් මා එහි යා යුතුය. ප්‍රමාද වීම තුළ අප ඉලක්කයෙන් දුරස් වන්නේය. ආරම්භ කළ යුත්තේ හෙට නොව අදය.

සත්‍යය අවබෝධය කුඩා අපටත් කළ හැකි දෙයකි. මෙය බොහෝ ගැඹුරු ලෙස බොහෝ අය සිතා සිටියත්, ගැඹුරක් ලෙස පෙනෙන්නේ සරල වූ සත්‍යය වසා සිටින මිථ්‍යාවේ සන වැස්ම නිසාය. කුඩා මිතුරනේ, ඔබ ඔබට ආදරය කරයි නම් සත්‍යය මාර්ගය තුළ අවංක වන්න.

ජීවිත පොත

සෑම පුද්ගලයෙකුම කියවිය යුතු වටිනාම පොත එයම පමණයි.

ජීවිතය යනු උපතේ සිට මරණය දක්වා අප විසින් ලබාගන්නා වූ අත්දැකීම් සම්භාරයයි. එම අත්දැකීම් සම්භාරය එක් එක් මිනිසා විසින් තම ජීවිතය පිළිබඳව ලියන ලද පොතක් ලෙස දැකිය හැක. එසේ බලන විට එකිනෙකට වෙනස් වූ ජීවන පොත් විශාල ප්‍රමාණයක් ලියැවී ඇති බව පෙනී යයි.

දිනක් මම මගේ ජීවිත පොත සමීපව නිරීක්ෂණය කළෙමි. මෙහි ප්‍රධාන පරිච්ඡේද හතරක් මම දුටිමි. ඒවා නම් කය, වේදනාව, චින්තනය, ධර්මතා යන පරිච්ඡේදයන්ය. මේවා මගේ ජීවිතයේ අන්තර්ගතය ලෙස මම දුටිමි. පුදුමය නම් මේවා සෑම මිනිසෙකුගේම ජීවිතවල අන්තර්ගතය ලෙස මට වැටහීමයි. මිනිසුන් වන අප හැමටම ඇත්තේ එකම ජීවිත පොතකි.

සත්‍යය අවබෝධය ලැබීමට අප විසින් බොහෝ පොත් පත් කියවිය යුතු යැයි මිනිසුන් සිතා සිටිති. ඒවායෙහි හරි වැරදි සොයමින් විවාද වලද පැටලී සිටිති. තවත් සමහරුන් වටිනා යැයි සම්මත දහම් පොත් පත් අන් අයගෙන් වසන් කොට සඟවාගෙන සිටිති. තවත් සමහරෙක් තමා ලියූ පොත කියවන්නට බලකර සිටිති. සමහරු පොත් පාඩම් කරති. සමහරු පොත්වල ඇති දෑ දරා සිටී. සමහරු පොත්වල ඇති දෑ සංසායනා කරති. සත්‍යය අවබෝධයට නම් මේ කිසිවක් කිරීමෙන් එලක් නොවන්නේය. අප විසින්

සමීපව කියවිය යුත්තේ තමාගේම ජීවිත අන්තර්ගතය ලියැවී ඇති තමාගේම පොතයි.

පොත මත සිහිය පිහිටන විට පෙනී යන්නේ මේ මගේ පොත නොව හුදු පරිච්ඡේද හතරක් පමණක් බවය. සමස්තයක් ලෙස මිනිස් සමාජයම මෙම පරිච්ඡේද හතර තුළින් දැකගත හැකිවනු ඇත. අතීතයේ සිටි මිනිසුන්ගේද අනාගතයෙහි බිහිවන මිනිසුන්ගේද වර්තමානයේ සිටින මිනිසුන්ගේද ක්‍රියාකාරිත්වය දහම ලෙස වැටහෙනු ඇත.

තවත් පුදුමයට කරුණක් වන්නේ මෙම පොත ලියූ තැනැත්තෙකු නොමැති වීමයි. සැප විඳීම සඳහා බොහෝ වටිනා දේ සොයමින් ලෝකයේ ඇවිද ගිය මා හට යමක් අවබෝධ විණි. අජර අමර වූ සැපයක් ලඟා කරගත හැකි වටිනාම දේවල් හතරක් මා තුළම සැඟවී ඇති බව මම දුටිමි. ඒ අන් කිසිවක් නොව කය, වේදනාව, චිත්තනය හා ධර්මතාවන් වන මගේ ජීවිතයේ අන්තර්ගතයයි.

ජීවිතය නමැති පොතෙහි, පරිච්ඡේද කියවා අවසන් වන විට අපට දැනුම වෙනුවට සුතමය ඥාණය ඉක්මවා ගිය ප්‍රඥාව පහළවනු ඇත.

එවිට තවත් බොහෝ පොත් කියවා බැලීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇත.

අප සියලු දෙනාට අද දවසේ කියවීමට ඇත්තේ එදා සිදුහත් තවුසා විසින් තමා තුළ කියවූ ජීවිත පොතමය.

එතෙරවීම

යතේ ගසාගෙන සැඩ රළ සසර ගඟේ

සිතේ නිවුම එතෙරට මඟ නිවන් මඟේ.

ඇරඹී බිළිඳෙකු ලෙසින් - පසු කරමින් ළමා විය .....
සේම තරුණ විය .... - ඇදී ගොස්ය ජීවිතය මහළු විය තෙක් ....
අත්දකිමු මරණය අවසන .... වැළකිය නොහැක එය එනමුත්.....

රූපයම සොයයි ඇස වර්ණවත් - ශබ්දයම සොයයි කණ මිහිරි වූ
එලෙසමය ඉඳුරන්ද අනෙකුත් .... - හසුව ඇත සැඩ පහරකට
ගසාගෙන යන වේගවත් ..... - නැවතුනෙමි මඳක් ....
බැලුවෙමි හැරී - දුටුවේ හිස්බවයි ......
බහුලය කටයුතු ..... සැණකෙළිය උත්සව .....
සමාජ කටයුතුය .... බැඳුනු නිල තල
ගමනේය ජීවිතය ..... නොමැතිව නිමාවක් ....
සෙව්වෙමි අස්වැසිල්ලක් - දහම් තොටුපළෙහි නැවතී ...
හිස් බවය එතැනත් - නැත කිසි දහමක්
නමුත් ඇත ප්‍රතිමා ගොඩනැගිලි

© මානව ධර්මය හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ගොඩ නැඟූ පරයන ලෙස එකිනෙක
ඇත නෙක විසිතුරු වෘත - නොවදාළ බුදු හිමි කිසි දින .....

බැලුවෙමි හැරී නැවතත් ...... - පිටත නොව මා දෙසම ....
වින්දෙමි මේ මොහොත ...... - හිඳගෙන මා තුළම
දුටුවේ සිත කයයි - බිඳී විසිරෙන නිරතුරුව
හමුවිය අස්වැසිල්ලක් - පසක් විය සත්‍යයය ......
ඇස කණ නොවෙයි ඒ - සිතමය නොහික්මුණ
සොයන්නේ ඇලෙන්නේ - ලෝකයෙහි දුක තුළ ....

©

පසක් විය යළිත් - නොවෙනස් ලෙසම ..... සැක නැතිව
එක දෙයයි ඇත්තේ - වටහ ගැනුමට ලොව තුළ .....
තම තමාමයි ඒ - එතෙර වීමට සැඩපහරින් සසර ....
අවදි වෙයි ප්‍රඥාව එවිට .....

එතෙරවීම .... එය ඔබ තුළමය
නිවීම ඔබ තුළමය ....

පාරිශුද්ධත්වය හා සතුට

දැනුම ඉක්මවූ ප්‍රත්‍යක්ෂය තුළ සදාකාලික සැපයෙන් නිවී සැනසීමට.

පාරිශුද්ධත්වය හා සතුට අත් දැකීමට මිනිසා තුළ සහජ අවශ්‍යතාවක් ඇත්තේය. එම ආධ්‍යාත්මික අවශ්‍යතාව ප්‍රාථමික යුගයෙහි ජීවත්වූ මිනිසාගේ පටන්ම තිබූ අවශ්‍යතාවක් බවට සාධක දක්නට ඇත. ශුද්ධ වූ සැපයක් අත් දකින්නට අවශ්‍යතාව මිනිසා තුළ හටගෙන ඇත්තේ කුමන හේතුවකින් ද? එය හුදු මානසික සාධකයක් නොව, සතුටින් පිරී ගිය පාරිශුද්ධ ස්වභාවයත්, විශ්වය සතුව තිබීමයි. මිනිසාගේ ගැඹුරු ආධ්‍යාත්මික තෙරපුමකින් මෙම ස්වභාවය පිළිබඳව සොයා බැලීම සඳහා උත්තේජනයක් ලබයි. විද්‍යාව හා තාක්ෂණය දියුණු මෙම යුගයේද ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් ආගමක් තුළ රැස්වන්නේ මෙම අවශ්‍යතාව ඉටුකර ගැනීමටය. සැබවින්ම මෙම ශුද්ධ වූ සැපය අත් නොදකින මිනිස් ජීවිතය නිරර්ථකය. ළාමක මෙන්ම අසංතෘප්තය.

අප ජීවත්වන මෙම යුගයේ මිනිසුන් මෙම ශුද්ධ වූ සැපය ප්‍රාර්ථනා කරමින් ආගම් තුළ පනවා ඇති වතාවත් වල යෙදෙයි. බොහෝ පිරිස් විසින් පුද පූජා, වන්දනා, සජ්ඣායනා, ප්‍රතිමා පිදීම්, යාඥාවන්, විනය කරුණු මත ස්වයංව මර්දනය වීම් වැනි ක්‍රියාකාරකම් තුළ තම ධනය, කාලය හා ශ්‍රමය වැය කරයි. මේවා කිරීම තුළද යම් තාවකාලික පාරිශුද්ධ සුඛ සහගත හැඟීමක් ඇති වන බව සැබෑවකි. එය ස්වයං මෝහනයෙන් හුදු මනසේ

හටගන්නා මනෝ භාවයක් පමණි. එය ළාමක මෙන්ම නොගැඹුරු චිත්ත ස්වභාවයකි. තමාට බැහැරින් හමුවන වස්තුවක්, රූපයක්, ශබ්දයක්, පිරිසක් ඊට ආධාර කර ගැනීමෙන්ම එම ක්‍රියාවේ නොපැසුණු බව ප්‍රකට කරයි. මෙම සතුටින් පිරී ගිය පාරිශුද්ධත්වයට පත්වීමට කිසිදු බාහිර වස්තුවක හෝ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක අවශ්‍යතාවක් නොමැත. කළ යුත්තේ තමා විසින්ම තමා දෙසට නැඹුරුවූ නිගමන වලින් තොරව සමීප නිරීක්ෂණයක අඛණ්ඩවම යෙදීමයි. විශ්වය ලෙස ක්‍රියාත්මක වන්නේ ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන සතර මහා ධාතුන්ගෙන් ජනිත වන රූප ධර්ම සහ සතර මහා ධාතුව ස්පර්ශයෙන් හටගන්නා නාම ධර්මවල (විඤ්ඤාණය) සංකළනය වීමකි. මෙම නාම ධර්ම සහ රූප ධර්ම ක්ෂණයක් ක්ෂණයක් පාසා පෙර නොතිබී හටගෙන, කිසිවක් ඉතිරි නැතිව නැතිවී යන නෛසර්ගික ස්වභාවයක් මත පිහිටා ඇත. හේතුවක ඵලයක් ලෙස නිර්මාණය වන නාම සහ රූප ධර්ම වලට ඉතා කුඩා (මැනිය නොහැකි) ජීවිත කාලයක් ඇත. රූප ධර්ම වල ජීවිත කාලයට සාපේක්ෂව නාම ධර්මවල ජීවිත කාලය ඉතා කුඩාය. අකාලික වේගයකින් උපදින මැරෙන මෙම සත්‍යය ස්වභාවයට එරෙහිව නාම සහ රූප ධර්ම ජීවිත කාලයක් ඇති කරගන්නේ මෝහයෙන් මත්වීමත්, සංස්කාර නමැති ආබන්ධන ශක්තියත් හේතුවෙන්ය. මෙසේ සංඛ්‍යාත දෙකකින් ක්‍රියාත්මකව පවතින නාම සහ රූප ධර්ම වල ජීවිත කාල අතර සාපේක්ෂතාවක හටගැනීම සිදුවෙයි. මෙම හේතුව නිසා නාම ධර්ම වන

විඥ්ඥාණයට, රූප ධර්ම වල යථා ස්වභාවය දැකගැනීමට නොහැකිවනු ඇත. විඥ්ඥාණය විසින් පසිඳුරන් භාවිත කර පරීක්ෂණයක නියැලී වැරදි නිරීක්ෂණයක් තුළ (ක්ෂණ අතර සාපේක්ෂතාවය හේතුවෙන්) වැරදි නිගමනයක් (චේතනාවක්) සංස්කාර කරනු ඇත. මෙම අත්දැකීම අවිද්‍යාත්මකය. නාම සහ රූප යනු අවකාශ දෙකකින් ජනනය වන ක්‍රියාකාරීත්ව දෙකකි. මේ ක්‍රියාකාරීත්ව දෙකෙහි සාපේක්ෂභාවය තුන් වන ක්‍රියාකාරිත්වයකට අවකාශය ඇති කරයි. මෙම තුන් වන අවකාශය කෙලෙස් නැමති ආබන්ධන ක්‍රියාකාරිත්වය ජනනය කරවයි. මේ හේතුවෙන් නාම ධර්ම හා රූප ධර්ම අන්‍යෝන්‍ය වශයෙන් සංයෝජනය වෙමින් මනෝමය විඥ්ඥාණික ස්වරූපයක් වන මමත්වය (මම) නමැති ක්‍රියාකාරීත්වය උපදවයි. මෙම සාපේක්ෂ ක්‍රියාවලිය තුළ උත්තේජනය වන තණ්හා, දිට්ඨි, මාන නමැති ක්ලේශයන් විසින් මාන එකොළහකින් යුත් පුද්ගලයා සහ ලෝකය අතර සබඳතාවය (ආශ්‍රව ධර්ම) ගොඩනැගෙයි. අභ්‍යන්තර-බාහිර, ඕලාරික-සුකුම, හීන-ප්‍රණීත, අතීත, අනාගත, වර්තමාන, දුර-ළඟ යනු ලෝකය ලෙස පෙනෙන එකළොස් මානයන්ය. මෙය හුදු ලෞකිකත්වයයි. ලෞකිකත්වය තුළ පුද්ගලයෙකු සහ ලෝකයක් (ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධි) ඇති ලෙසද, ඒ කොටස් දෙකම නැති ලෙසද හඟවමින් සිදුවන විඥ්ඥාණයේ මායාකාරී හැසිරීම තුළ මනෝමය සත්ත්ව ස්වභාවය සාංසාරික වනු ඇත. එනම් මෙම විඥ්ඥාණික උප කොටස, කුඩා කල සිට වර්ධනය වන සහ යම් දිනක සිදුවන

මරණය කරා ගමන් කරන සත්ත්වයෙකුගේ භවයකට (මතකයට) සාපේක්ෂව චක්‍රීය වනු ඇත. මෙම චක්‍රය බිඳීම නොහොත් භව බණ්ඩනය සඳහා අවිද්‍යාව දුරුවන පරිදි සත්‍යය දැකිය යුතුය. එම සත්‍යය දැකීමට උදව් කරන්නේ කළ්‍යාණ මිත්‍රයෙකි. කළණ මිතුරාට ශ්‍රද්ධාව නමැති ඇදහිල්ල පිළිබඳව පැහැදිලි කර දිය හැකිය. ජීවත්වන පුද්ගලයෙකු පරිහරණය කරන ලෝකයක් ඇති බව හා නැති බව ලෙස ගොඩනැගී ඇති මායාකාරී ව්‍යාජ දර්ශනය ඉවත් කරමින් පෙර නොඇසූ විරූ දහමක් පිළිබඳව වූ සත්‍යය දර්ශනයක් ශ්‍රද්ධාව හෙවත් ඇදහිල්ල මත පිහිටුවීම කළ යුතු වේ. එම සත්‍යය දර්ශනය මත ඔබ කොතෙක් දුරට සතිමත් වන්නේද, ආශ්‍රව ක්ෂය වීම එයට සමානුපාතික වනු ඇත. නොපිහිටා, වැයම් ද නොකර කෙලෙස් ප්‍රහාරණය සිදුවන අතර වායාම-සති පිහිටවිය යුත්තේ යථාභූත ඥාන දර්ශනය තුළ අඛණ්ඩව ජීවත්වීමටය. පාරිශුද්ධ වූ සතුට කරා විඤ්ඤාණයේ ක්‍රමික පරිවර්තනය සැබෑවටම දැනෙනු ඇත. සත්‍යය දැකීම තුළ කෙලෙස් ක්‍රියාත්මක වීමට අවකාශය නොමැති වෙයි. සත්‍යය තුළ සත්ත්වයා නොපවතී. යථාභූත ඥාන දර්ශනය තුළ ක්‍රමයෙන් මනස භවයට (මතකයට) නිරපේක්ෂ වේ. එනම් අතීතයට සහ අනාගතයට සාපේක්ෂව නොවී නිගමන වලින් තොර සොයා බැලීමක නිරතවනු ඇත. මෙය විදර්ශනාවයි. අවසානයේ පූර්ණත්වය (බුද්ධ, ධම්ම සහ සංඝ) තමා තුළ ප්‍රත්‍යක්ෂ වෙමින් සතුටින් පිරී ගිය පාරිශුද්ධත්වය සාක්ෂාත් වනු ඇත.

මෙසේ දුක නැති කරගන්නා මඟ මැනවින් පැහැදිලි කර ඇති ධර්මය පවතින යුගයක අප සියලු දෙනා දුකින් ජීවත්වීම අභාග්‍යයකි. භාග්‍යවතුන් වහන්සේ කියා දුන් මඟ අපට නොපෙනෙන්නේ කුමක් නිසාද? අප යා යුත්තේ කවුරු කියන මාර්ගයේද? පළමුව පැවසිය යුත්තේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනය සාමාන්‍ය මිනිසුන්ට නොතේරෙන ලෙස ලියා ඇති බැවින් අපට තේරුම්ගත් අයෙකුගේ (ඇත්ත ඇති හැටියටම කියන) සහයෝගය අවශ්‍ය වේ. මෙම කටයුත්තෙහි නිරත වී සිටින්නන් දෙස බලන විට අපට පෙනෙන කරුණක් නම් ඔවුන් අතරද, මතවාද, භේද සහ විවේචන පවතින බවයි. ඔවුන් තම තමා නිවැරදි බව පවසමින් ධර්ම යුද්ධයක නිරතව සිටියි. ඔවුන්ගේ අනුගාමිකයින් අන් අය වැරදි බව පවසමින් තම ගුරුවරයා පමණක් නිවැරදි බව තහවුරු කරමින් තම කල්ලියට, කණ්ඩායමට පිරිස රැස් කරයි. කළණ මිතුරෙකු සේ පෙනී සිටින අතර තම හිතවතුන් කල්ලියක, කණ්ඩායමක, ආයතනයක සාමාජිකයෙක් බවට පත්කර අවසානයේ පොත් සහ දෘඩ තැටි ජාවාරමකට යොදවයි.

ආගමික සංස්ථාව නිතරම පරමාදර්ශ උලුප්පා පෙන්වමින් අපට ඒවා වෙත අනාගතයේදී කෙදිනක හෝ පැමිණෙන ලෙස කියා සිටියි. මෙම කිසි දිනක යථාර්ථයක් නොවන අනාගතයේදී කිසිවෙකුත් සත්‍යය දකීවිද? මෙම මනෝමය පාරිශුද්ධ භාවයන්ට ආරූඪ වූ, ආවේශ වූ නළුවන් පිරිසක් අපට

දැකගත හැකිය. එසේම ටික කලකින් එම සුදු පිරුවට අන්දවාගත් මනෝමය ප්‍රපංචයේ අස්ථායි තෙරපුම විසින්ම ඔවුන්ගේ වැදගත් චරිත කෙළෙසා දමයි. ඇතැම් ධර්ම කථිකයන් පවා ඔවුන් නොදත් දෙය විමසූ විට ද්වේශ සහගතව හැසිරෙන අයුරු දැක ගත හැක. මෙම පුද්ගලයන් දකින දකින අයට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් තමා ධාර්මික බව පෙන්වයි. ලෝභ, ද්වේෂ, මෝහ ගැන වැදි බණ දෙසමින් තම දේශනාවලට අභියෝගයක් වන විට ඒවා මතම හැසිරෙයි. තවත් සමහරෙක් කථා කිරීමට සහ ලිවීමට උපකරණයක් ලෙස භාවිත වන භාෂාව එහි රීති උල්ලංඝනය කරමින් විඛණ්ඩනය කරමින් ධර්මය තේරුම් ගැනීමට උත්සාහ දරයි. ධර්මයෙහි අර්ථය ගෙන දෙන නිරුක්තිය පැහැදිළි වන්නේ සාමාන්‍ය විඥ්ඥාණික ස්වභාවයෙන් ඔබ්බට අනාවරණය වන ශුද්ධ ඥාණ තුළ බව ආධ්‍යාත්මික පුද්ගලයන්ට පමණක් අත්විඳිය හැකි කරුණකි. වචන විසන්ධි කොට ගොඩනගන භාෂාමය කතන්දරයක් සහිත නිගමනයකට ධර්ම මාර්ගය හෙළිකළ නොහැක. නිගමන යනු මෝඩයන් දිගේලි කරන කණුවකි. ආර්ය පරීක්ෂණය වන්නේ තමා තමාව සමීපව දකිමින් තමා තුළ ආරම්භ කරන පරීක්ෂණයකි. තමා ලෙස හැගෙන සියලු ස්වරූපයන් මත සිදුකරන නිරන්තර පරීක්ෂණයක් තුළ සතිමත් නිරීක්ෂණය කිරීමක් (නිගමන වලින් තොරව) අවසාන ප්‍රත්‍යක්ෂය තෙක් නොවැටී නොනැවතී සිදුකිරීම භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන් විද්‍යාවයි (ක්‍රමවේදයයි). මෙය ශුද්ධ විදර්ශනාවයි. මෙම පරීක්ෂණය සියලු

ජීවිත ක්‍රියාකාරකම් වලට සමාන්තරව නිහඬව සිදුවන අභ්‍යන්තර ක්‍රියාකාරකමකි. එය භෞතිකය, භාෂාව, චින්තනය, වේදනාව සහ ධර්මතා යන සියල්ලටම සමාන්තරව ක්‍රියාත්මක වන්නකි. ඉහත සියල්ලම ඔබ නොවන ලෙස දර්ශනයක පිහිටා සතිමත් විය යුතුය. එනම් යථා භූත ඥාණ දර්ශනය මත සතිමත් විය යුතුය.

අප කළ්‍යාණ මිත්‍රයකු සෙවීමේදී, විමසීමේදී අත්‍යවශ්‍යයෙන්ම සොයා බැලිය යුතු කරුණක් ඇත. එනම් මෙම තැනැත්තා උන්මත්තකයෙකු නොවන්නේද යන වගයි. සෑම පෘථග්ජනයෙකුම උමතු බවකින් පෙළෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. භාග්‍යවතුන් වහන්සේ දෙසූ මෙම කරුණ අපට කිසිසේත්ම නොසළකා සිටිය නොහැක. අප යම් විටක නිරෝගී ලෙස දකින පුද්ගලයන් ඇතැම් කාරණා තුළ මානසික වශයෙන් සමබර නොවන බව අපට පැහැදිලිය. ධර්මය දේශනා කරමින් ධර්මය තුළ හැසිරෙන බව පෙන්වන සමහර පුද්ගලයින් දේශපාලනය ගැන කථා කරන විට මූලධර්මවාදී ලෙස හැසිරෙනු ඇත. විටක ජාතිවාදී වෙමින්, ආගම් වාදී වෙමින්, කුල වාදී වෙමින් නිකායක හෝ සභාවක ආධිපත්‍ය ගැන කථා කරමින් උමතු භාවය ප්‍රකට කරයි. උමතු පුද්ගලයා එක් අංශයකදී බුද්ධිමතෙකු ලෙස ක්‍රියා කළද අනෙකුත් බොහෝ අවස්ථාවලදී සම බර නොවනු ඇත.

මෙහි ඇති අති භයානක ස්වභාවය වන්නේ උන්මත්තකයින් හට

සමාජය තුළ ඕනෑම ස්වරූපයකින් පෙනී සිටීමට හැකි වීමයි. සමාජ සේවකයන්, විමුක්ති නායකයින්, දේශපාලනඥයින්, ආගමික නායකයින්, ආධ්‍යාත්මික ගුරුවරුන්, කම්කරුවන්, අධ්‍යාපනඥයින් වැනි පිරිස් තුළ ඕනෑ තරම් උන්මත්තකයින් සිටීමට හැකිය.

මෙම උමතුවේ තවත් ලක්ෂණයක් වන්නේ සමාන කරුණු මත උමතු වුවන් එකට එකතුවීමයි. ස්වල්පව උමතුව ඇති අය විශාල වශයෙන් උමතු වුවන් වෙත ආකර්ශනය වේ. මෙම කාරණය තුළ දැවැන්ත නායකයින්, පාලකයින් සහ විශාල අධිරාජ්‍ය පවා බිහිවීමට ඉඩ ඇත.

උමතුභාවයේ ඇති තවත් ප්‍රධාන ලක්ෂණයක් නම් ඔවුන් හැමවිටම අනන්‍යවීමට උත්සාහ දැරීමයි. අනන්‍යවීම යනු තමා නොවන යමක් තමා ලෙස පිළිගෙන කටයුතු කිරීමයි. උන්මත්තකාගාරවල බොහෝ විට දැකිය හැකි දෙයක් ඇත. ඒවා තුළ මිනිසුන් හමුවන්නේ නැත. බොහෝ ප්‍රසිද්ධ පුද්ගලයින් තමා බව කියන ජනකාන්ත නළු නිළියන් තමා බව කියන, දෙවියන්ගේ පණිවිඩකරුවන් ලෙස සිතන, තමාට ප්‍රතිකාර කරන වෛද්‍යවරයාගේද ගුරුවරයා ලෙස සිතන රෝගී අසරණයින් අපට දැකිය හැකිය. නූතන ජන සමාජය තුළද, ඍෂිවරු තමන් යැයි කියාගන්නා විවිධ දෙවිවරුන්ගේ දූ පුතුන් තමන් යැයි කියාගන්නා එකල දුටුගැමුණු වැනි රජවරුන් තමා යැයි සිතා සිටින බුදු සමයේ වැදගත් චරිත වලින් එකක් තමා

යැයි සිතා කටයුතු කරන ගිහි, පැවිදි බොහෝ අය අපට හමුවෙයි. තවත් බොහෝ අය මම මුස්ලිම්ය, මම දෙමළය, මම සිංහලය ආදී වශයෙන් සිතයි. මෙයද සමාජයේ බහුලව දක්නට ලැබෙන අනන්‍යය වීමකි. එහිදී සිදුවන්නේ සමාජය නිර්මාණය කළ චරිතයක් තුළට පිවිසී එය තමා ලෙස ගෙන කටයුතු කිරීමය. මෙහි ප්‍රතිඵලයක් ලෙස තමාට තමාගේ සත්‍ය ස්වභාවය නොපෙනී යයි. කුමන ආකාරයකට හෝ අනන්‍ය වීම පෘථග්ජන උමතුවේ ස්වභාවයයි. නීරෝගී සිත තමා තමා ලෙසම දකින අතර අනන්‍යය වීම වෙනුවට මනුෂ්‍යයත්වය තුළ සමානාත්මතාවය අත් විඳී. එම අත්දැකීම මත ක්‍රියාත්මකද වේ. මෙසේ යථාර්ථය දකින සිහියෙන් යුතු නීරෝගී සිත හුදු ශරීරයද, වේදනාවද, චින්තනයද, ධර්මතාද මම ලෙස ගෙන අනන්‍ය නොවනු ඇත. මෙම දර්ශනය තුළ සතිමත් වීමෙන් අභිජ්ජා දෝමනස්ස දුරුවී පාරිශුද්ධ වූ සතුට අත්විඳිය හැක. මෙසේ මෝහය තුළ උමතු වූ පුද්ගලයා කවුද? සම්මා සතිය තුළ (සතර සතිපට්ඨානය තුළ) උමතු බව සිඳගත් පුද්ගලයා කවුද? තෝරාගැනීම ගැටළුවකි. මෙය කිසි දින විසඳිය නොහැකි ගැටළුවකි. එනමුත් අපට අපගේම කායික, මානසික, චර්යාත්මක ක්‍රියා දාමයන් තුළ උමතු බව ප්‍රකට වන්නේ දැයි මැනවින් නිරීක්ෂණය කළ හැක. අප විසින් කළ යුතු වන්නේ යථාභූත ඥාණ දර්ශනයෙහි පිහිටමින් අපගේ ජීවිතයේ අන්තර්ගතය වූ කය, සිත, වේදනා සහ ධර්මතා මත අනන්‍ය නොවන පරිදි සතිමත්ව

ජීවත්වීමයි. සතුටින් පිරිගිය පාරිශුද්ධත්වය අත්විඳීමට ඒකායන මාර්ගය මෙය වනු ඇත.

මෙම ලිපියෙහි අඩංගු කරුණු කැඩපතක් ලෙස භාවිත කරමින් ඔබ ඔබවම දකින්න. දහම් ඇස පහළ කරගන්න. එසේ නොවී ඔබ අපහසුතාවයට පත්වන්නේ නම්, මට සමාවෙන්න.

සමස්තයක් ලෙස මානව වර්ගයා දෙස බලන විට ආරම්භයේ පටන්ම මේ දක්වාම ඔවුන් ජීවත්වී ඇත්තේ කුමන මානසික ස්වභාවයකින්ද? ශරීරය හා සබැඳුන ශරීරයම අනන්‍ය කරගත් කයේ මරණය පමණක් දකින සිතක් සමග ඔවුන් ජීවත්වී ඇත. බුදු සමය තුළ මෙය වෙනස් වුවද නැවතත් එය එසේම සිදුවෙමින් පවතී. විද්‍යාව හා තාක්ෂණය මත වර්තමානයේ අත්විඳින භෞතික සුවය ලබාගැනීමට මිනිසා පරිණාමය වූයේ ඉතා දුෂ්කර මාර්ගයක ගමන් කරමින්ය. ස්වභාව දහම පාලනය කිරීමට ගත් පියවර හේතුවෙන් මිනිසා අද ආරම්භයටත් වඩා අසරණ වී ඇත. නූතන මිනිසා භාවිත කරන ජාතික, ආගමික, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික ක්‍රමෝපායන් තුළ සමාජගත දැවෙන ප්‍රශ්න වලට විසඳුම් සොයා ගැනීමට නොහැකි වී ඇත. තවමත් මිනිසුන් අවිද්‍යාව ඉක්මවා යන්නට, ගැටුම ඉක්මවා යන්නට, දුක ඉක්මවා යන්නට අපොහොසත්ව සිටී. එසේ වී ඇත්තේ නූතන ශිෂ්ටාචාරය මනසේ පටු බව තුළ සිරවී ඇති බැවින්ය. මීළඟ ශිෂ්ටාචාරය මිහි මත

බිහිවන්නේ අවිද්‍යාව ඉක්මවා ගිය, ගැටුම ඉක්මවා ගිය, දුක ඉක්මවා ගිය ගැඹුරු විඤ්ඤාණික තලයක් ඇසුරු කරන මිනිසුන් ගෙනි. වර්තමානයේදී ඉතා සුළු පිරිසක් සම්ප්‍රදාය නමැති ගොහොරුවෙන් ගැලවී මරණය, අවිද්‍යාව, ගැටුම සහ දුක ඉක්මවා ගිය සුන්දර ජීවන තලයකට මනස නිදහස් කරන්නට වෙහෙසෙති. පාරිශුද්ධ වූ සතුට අත්විඳින නව ශිෂ්ටාචාරයක ආරම්භය මෙය විය හැකිය. එය යථාර්ථයක් කරගැනීම සඳහා තනි තනිව වෙහෙසීම ඔබ සැමගේ යුතුකමකි.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ශ්‍රද්ධාවෙන් අචල ශ්‍රද්ධාවට

බුදුන් දැකීම යනු පරම සත්‍යය දැකීමයි. එහි පළමු පියවර ශ්‍රද්ධාවයි.

ශ්‍රද්ධාව යන්නෙන් සරළව හැඳින්වනුයේ දහම කෙරෙහි අප තුළ පවත්නා භක්තිය (faith), විශ්වාසය (belief), පක්ෂපාතීබව (trust) හෝ සැක නැති බව (confidence) ලෙසය. එය තවදුරටත් ධර්මයට අනුව විග්‍රහ කළහොත් ශ්‍රද්ධාව යනු “ශ්‍රද්ධාති තථාගතස්ස බෝධි” නම් වේ. එනම් අප මහා තථාගතයන් වහන්සේ අවබෝධ කළා වූ, සාක්ෂාත් කළා වූ අවකාශයේ උතුම් සම්බෝධිය පිළිබඳව ඇති පැහැදීමයි. පෙර නොඇසූ විරූ දහමක් ලෙස බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ සදහම් මාර්ගයෙහි අවසාන ඵලය වූ උතුම් සම්බෝධිය පිළිබඳව ඇතිකරගත් ගැඹුරු විශ්වාසය, ඇදහිල්ල, ශ්‍රද්ධාව ලෙස හැඳින්විය හැක. මායාවෙන් වැසී ගිය යථාර්ථය නොදැක, නොදැන ශාස්තෘවරයා දේශනා කළ නිසාම පිළිගෙන සත්‍යවාදීව කටයුතු කිරීම (මාර්ගය වැඩීම), සත්‍යවාදී දැක්ම තුළ ජීවත්වීමේ ඇරඹුම ශ්‍රද්ධාවයි. එසේම කිසි දිනෙක ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයක් ලෙස ලබාගත නොහැකි උතුම් සම්බෝධිය කොන්දේසි විරහිතව පිළිගැනීමට, ඇදහීමට, ශ්‍රද්ධාව යැයි කියනු ලැබේ. වර්තමාන යුගයේ බොහෝ අය දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සහිත අසූවක් වූ අනු ව්‍යාංජන ලක්ෂණ සහිත තෙසැත්තෑ ඥාණ පිහිටා ඇති නව

අරහාදී ගුණයන්ගෙන් සමන්විත පුද්ගලයෙකු කෙරෙහි පැහැදීමක් විශ්වාසයක් ගොඩනඟා ගැනීම ශ්‍රද්ධාව ලෙස හඳුනාගෙන ඇත. සත්ත්ව ස්වභාවය ඉක්මවා ගිය, පුද්ගලභාවය ඉක්මවා ගිය අවකාශයේ පරම සත්‍යය "බුද්ධ" නම් වේ. එම පරම සත්‍යය නිරුක්ති කොට මානසික තලයට හඳුන්වා දෙන්නේ ශ්‍රී සද්ධර්මය ("ධම්ම") මඟිනි. එම අවබෝධය හේතුවෙන් සංවර වන සිතක්, කයක්, වචනයක් වේ නම් එය "සංඝ" වන්නේය. එනම් එහි සඳහන්ව ඇත්තේ පරම සත්‍යයෙහි ගුණයන්ය. නැතහොත් පුද්ගලයෙකු පිළිබඳ වර්ණනාවක් සිදු නොවේ.

කල්‍යාණ මිත්‍ර ඇසුරක් තුළ, සද්ධර්ම ශ්‍රවණය තුළ මෙම ඇදහිල්ල නොඑසේ නම් ශ්‍රද්ධාව පිළිබඳව අවබෝධ ඥාණය පහල කරගත හැකිය.

උතුම් සම්බෝධියෙහි ශ්‍රද්ධාව පිහිටුවාගත් අයෙකුගෙන් ප්‍රකට වන චරිත ලක්ෂණ පිළිබඳව අංගුත්තර නිකායෙහි විස්තර කොට ඇත. පහත සඳහන් එම ලක්ෂණ ඔබ තුළත් වේ දැයි පරීක්ෂා කර බලන්න.

01. සිල්වත් බව - (සත්‍යය දර්ශනය මත ශ්‍රද්ධාවෙන් ජීවත්වන විට ස්වයං ඝාතක මෙන්ම පරපීඩක මානසිකත්වය ක්‍රමයෙන් දුරුවනු ඇත.)

02. බහුශ්‍රැත බව - (දැනුමක් ලෙස නොගත් අවබෝධයත් ලෙස ප්‍රකට වන, ප්‍රකාශ වන නිගමන රහිතව පැහැදිළි වීමට යොමුවන සේ දහම හසුරුවන්නකි.)

03. කළ්‍යාණ මිත්‍ර ඇසුරට නැමුණු බව - (දහම ජීවමාන කරවන පුද්ගලයන් හා ඇසුරට ඇති කැමැත්ත)

04. කීකරු බව - (තමා අතහැර පූර්ණ ලෙස ඇතිවන යටහත් පහත් බව)

05. බ්‍රහ්මචාරී වහන්සේලාගේ කටයුතු කෙරෙහි බොහෝ විමසීමෙන් කම්මැලි නැතිව ක්‍රියාකිරීම - (සතර සතිපට්ඨානය වඩන්නන් පමණක් ආදර්ශයට ගෙන කම්මැලි නොවී වීර්යය වඩමින් ජීවත්වීම)

06. ධර්මයෙන් පමණක් සතුටුවීම - (අභිධර්මය, අභි විනය දැනගැනීමෙන් ප්‍රමෝදයට පත්වීම)

07. උපන් කුසල් වැඩි දියුණු කරගැනීමටත් නූපන් කුසල් උපදවා ගැනීමටත්, උපන් අකුසල් ප්‍රහාරණය කිරීමටත් නූපන් අකුසල් නූපදීමටත් අප්‍රමාණ වීර්යයෙන් යුතුව කටයුතු කිරීම

08. ධ්‍යාන සතර පහසුවෙන් ලබාගැනීම

09. ගමනක් ගිය කෙනෙකු සිය ගමනේ විස්තර කියන්නාක් මෙන් පෙර විසූ ජීවිත පිළිබඳ සිහිකිරීමට හැකි බව.

10. සත්ත්වයන් කර්මානුරූපව චුත වෙන ආකාරයත් නැවත උපදින ආකාරයත් දකින නුවණ ඇති බව.

11. ආශ්‍රව ක්ෂය කරගැනීමේ ඥාණය ඇති බව.

මෙසේ තථාගතයන් වහන්සේගේ අවබෝධය පිළිබඳ දෘෂ්ඨිමය වශයෙන් පැහැදිළි අදහසකින් යුතුව දුකින් නිදහස්වීම ජීවිතයට ගලපාගෙන ඇති ඉහතින් සඳහන් කළ ලක්ෂණයන්ගෙන් හෙබි තැනැත්තා බුදු දහමෙහි අචල ශ්‍රද්ධාවන්තයකුම වන්නේය. ඒ අනුව බුදු දහමෙහි අචල ශ්‍රද්ධාවන්තයකු වන්නේ කෙසේ දැයි මෙය කියවන ඔබ, තමා තුළ එම ලක්ෂණයන් ගෙන් යුත් ප්‍රබල විශ්වාසයක් ගොඩනැඟී ඇතිද? නැතහොත් බුදු පිළිම ඉදිරියේ අසූ හාර දහසේ පහන් පූජා පවත්වමින් වචනයෙන් පමණක් ශ්‍රද්ධාවන්තයකු වී "දුකින් නිදහස්වීම" ඈත ක්ෂිතිජයේ ඇති කවදාවත් ළඟාවිය නොහැකි තාරකාවක් සේ තම ජීවිතය ඒ තුළින් බැබලවීමට උත්සාහ කරන්නෙකුදැයි සිතීමට කාලය එළඹ ඇත.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

දුකෙන් මිදෙමු – සතුට ලබමු.

ඔව්. ඔබ සොයන සතුට ඔබ ළඟම ඇත. ඉතින් කුමට තවත් දුක් විඳිමුද?

ජීවිතය ආරම්භ වූ දිනයේ සිට අප සතුටු කරන්නට දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් අප්‍රමාණ වෙහෙස දරන්නට ඇත. එසේ අන් අයගේ පිහිටෙන් දෙපයින් සිටගත් අප දැනුම් තේරුම් ඇති වයසේ සිට අනාගත සතුට සඳහා කෙතරම් උත්සාහ කළේ දැයි අප විසින්ම ස්මරණය කිරීම වැදගත් වෙයි. එවිට අප විසින් අනාගත සතුට සඳහා කළ උත්සාහය, කැපවීම, ධෛර්යය මැනවින් හඳුනාගත හැකි අතර එමඟින් අප ලැබූ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ගොඩනැඟීම්, භෞතික සම්පත් සහ මානව සම්පත් ද හඳුනාගත හැකිය. මේ සියල්ල ඉතා අපහසුවෙන් සහ කැපවීමෙන් ලඟාකර ගත්තද, ඒ සියල්ල තුළද දුක, කළකිරීම, පශ්චාත්තාපය පමණක් අවසානයේ ඉතිරි වුවද, ඒ බව වටහා ගැනීමට අපහසු වන්නේ තාවකාලිකව අප කරා ගෙන එන වින්දනය, විනෝදාස්වාදය, ආශ්වාදය මගින් ඉහත සියල්ල මායාකාරී ලෙස යටපත් කිරීමට මෙම ක්‍රියාවලිය සමත්වීමයි. ඒ හේතුවෙන් අප කරා එන දැඩි දුක් දොම්නස්, අසහනකාරි තත්ත්වය යටපත් කරමින් බාහිරව පවතින ද්‍රව්‍ය පුද්ගල සිද්ධි කළමනාකාරිත්වයෙන් සතුට සෙවීමට පෙළඹෙයි.

අප ප්‍රියකරන දේවල් අපට අවශ්‍ය පරිදි නොපැවතීමත් අප අප්‍රිය කරන දේවල්ද අවශ්‍ය පරිදි හැසිරවිය නොහැකිවීම පිළිබඳවත් (අනිත්‍ය හා

අනාත්ම) අප අවබෝධ කරගත යුතුයි. ඒවා ඒවාටම අනන්‍ය වූ පරිදි වෙනස්වන ස්වරූපයෙන්ම පවතී. මෙසේ ආවේණික ස්වරූපයෙන් පවතින ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධි වෙනස් කිරීමට ගන්නා අප්‍රමාණ වෙහෙස අපට දැනෙනවාද? මෙසේ මේ ආකාරයෙන් අපට අවශ්‍ය පරිදි පැවැත්වීමට නොහැකිවීම තුළ කෙතරම් දුක් දොම්නස් පශ්චාත්තාපයන්ට අප ලක්වන්නේද? එය දුකක් ලෙස නොතේරෙන තරමට ආශ්‍රව ධර්ම අපව අභිබවා ක්‍රියාත්මක වීම හඳුනාගැනීම වැදගත් නොවන්නේද?

අද සමාජය තුළ මෙම ක්‍රියාත්මක ස්වරූපය හඳුනා නොගැනීම තුළින් පුද්ගලයන් ලෝකයට පෙනෙන්නට සුදු පිරුවට පොරවාගෙන අනුන් ගැනම සොයමින් වෛරය, ද්වේශය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, පළිගැනීම සහිත චිත්ත වේගයන් තමා තුළ පෝෂණය කරමින් කයෙන් සහ වචනයෙන් ද ක්‍රියාත්මක වීම දක්නට ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස තමාද නිදහස භුක්ති නොවිඳින අතර අනෙකාගේ නිදහසද විනාශ කිරීම දක්නට ලැබේ. මෙහි අභාග්‍ය සම්පන්න තත්ත්වය වන්නේ අතීතය සහ අනාගතය පිළිබඳ ද්වේශ සහගත සිතුවිලි මගින් උත්පන්න තීරණ ගැනීමත්, තමාගේ සිත තුළ තමා විසින්ම නිර්මාණය කළ චිත්ත රූපයන්ට පහරදීමත්ය. මෙම ක්‍රියාකාරිත්වය දුක්ඛිත ලෙස තමාගේ වර්තමාන සතුට (මේ මොහොත) සැනසීම නැතිකරයි.

මිනිසුන්ට සතුට නැත්තේ ඉමක් කොනක් නොපෙනෙන මහා බලාපොරොත්තු සාගරයක කිමිදීම නිසාවෙනි. පොළව අභ්‍යන්තරයේ පටන්

විශ්වය දක්වා දැනුම රැස්කරගෙන ඇති මිනිසා සැබවින්ම සතුටෙන් පසුවන්නේද? සමස්ත විශ්වය තුළටම යොමුවූ ඇස, කණ, නාසය, දිව, ශරීරය (පංචේන්ද්‍රිය) මගින් ගෝචර වන්නාවූ සියල්ල අන්ත දෙකක පවතින බවත්, එම අන්ත දෙක තුළ ඇලීම සහ ගැටීම ක්‍රියාත්මක වීමත් හඳුනාගත යුතුය. බාහිර සියල්ල මත නිදහසේ කටයුතු කිරීමත්, ඍජු අවධානයෙන් යුතුව නිරීක්ෂණය කිරීමත් මාර්ගයට පිවිසීමට අවස්ථාව උදාකරදෙනු ඇත.

එසේ නම් යම් කෙනෙකු සිහියෙන් මෙම තත්ත්වය තේරුම්ගෙන ලෝකය සමග දුවමින් සතුට සෙවීම පසෙකලා, තමා තුළින් ඇත්ත ඇති සැටියෙන් අවබෝධ කිරීමත් මේ මොහොතේ තමා තුළ සතිමත් වීමෙන් සත්‍යය දැකීමත්, මාර්ගයට පිවිසීම ලෙස මම හඳුනා ගතිමි. අප අභ්‍යන්තරයේ ඇති මහා ශක්තිය බාහිරින් ඇසෙන, දකින, දැනෙන ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධීන් සමග ඇතිකර ගන්නා බන්ධනයන් මගින් දුර්වල වීම අප විසින් හඳුනා නොගැනීම කණගාටුවට කරුණකි. එසේ නම් නොපමාව තමා ගවේෂණය කිරීමට නිසි පියවර ගැනීම ඉතාම වැදගත් වේ.

එසේ නම් මාර්ගය ලෙස හඳුනාගත හැක්කේ තමාගේ කය පිළිබඳව, වේදනාව පිළිබඳව, සිතුවිලි වහ වහා ක්‍රියාත්මක වන ස්වරූපය පිළිබඳව හා ධර්මතා පිළිබඳව එළඹ සිටි සිහියෙන් පසුවීමයි. අප ජීවිත කාලයක් තිස්සේ ගොඩනගා ඇති ප්‍රතිරූප (නිල, බල, ධන කුල) සමග සම්බන්ධව පවතින

නොසන්සුන් බව, නිද්‍රාශීලීබව, ද්‍රව්‍ය පුද්ගල සහ සිද්ධීන්ට ඇති කැමැත්ත, ද්වේශය ක්‍රියාත්මක වීම, සැකය (නීවරණ ධර්ම) ආදී වූ ධර්මතා පිළිබඳව සිහිය පිහිටුවීමයි.

බුද්ධ ශාසනය යනු පුද්ගලයින් අට දෙනෙකුගෙන් (සතර මඟ, සතර ඵල) ජීවමාන වන සජීවී ක්‍රියාකාරිත්වයකි. මඟ ඵල නිවන් අවබෝධ නොවූවන්ගෙන් සමන්විත වන බුද්ධ ශාසනයක් නොමැත. එය හුදු ජන සමාජයක් පමණි. එහි උපාසක උපාසිකා භික්ෂු භික්ෂුණීන් සිටිය හැක. ශ්‍රාවක මහා සංඝරත්නය බිහිවන්නේ ඉහත සතර කුලයෙනි. කළ්‍යාණ මිත්‍ර සේවනයක් තුළින් ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කොට සත්‍යය පිළිබඳවූ යථාභූත ඥාණ දර්ශනය පිළිබඳව අසා දැනගෙන එහි සතිමත්ව දිරිය වැඩීම තුළින් ඉහළ පුද්ගලයන් අටදෙනාගෙන් පළමුවැන්නා වන මාර්ගයේ සිටින්නා බිහිවනු ඇත. එවැනි පිරිස් පුබුදුවාලීමට අවශ්‍ය දහම අනුදැන නොවදාරා පින උපයාගෙන නිවන් ප්‍රාර්ථනා කිරීම තුළිනුත් දහම් දැනුම මාර්ග ඵලයක් ලෙසින් සිතමින් තමනුත් අන් අයත් රවටා ගැනීම තුළිනුත් බුද්ධ ශාසනයක් බිහිකළ නොහැක.

නිවැරදි ආධ්‍යාත්මක ප්‍රවේශයක (සතර සතිපට්ඨානය) ඇරඹුම බුද්ධ ශාසනයෙහි යළි පිබිදීම සනිටුහන් කරනු ඇත. යථාභූත ඥාණ දර්ශනය තුළ ලෝකය අතහරිමින් සිත, කය, වේදනාව, ධර්මතාව මත සතිමත් වෙමින් ඔබත් සැබෑ බෞද්ධයකු වන්න.

භව සංස්කාරය

දෙව්,බඹ,මිනිස්,ලෝ කටුක වූ සසරමය. නිවන් මඟ නම් නොවෙයි.

මනසින් උසස් වූ සත්ත්වයා ලෙස මිනිසාට තෝරාගත යුතු මාර්ග දෙකක් ඇත. එනම් සංසාර ගමන හෝ සංසාර ගමන නැවැත්වීමය. අවිද්‍යාව තුළ ජීවත්වන මිනිසා නොදැනුවත්වම සසර ගමනට එකතු වනු ඇත. අවිද්‍යාව හේතුකොට ගෙන සත්ත්වයා අනවරාග්‍ර සංසාරය තුළ විවිධ ස්වරූප යටතේ ස්ථර 31 ක් තුළ උපත සහ මරණය කැටුව ගමන් කරයි. ඒ තුළ සත්ත්වයා නිරන්තරයෙන් දුකට පත්වෙයි.

එම දුක් සහිත වූ සංසාර මාර්ගය තුළ මිනිසා විසින් රැස් කරන සංස්කාර ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. ඒවා නම්,

- අපුණ්‍යාභි සංස්කාර හෙවත් අකුසල කර්ම - මෙය පාපී මාර්ගය වන අතර, එමගින් අපායගාමී වීම සිදුවේ.
- පුණ්‍යාභි සංස්කාර හෙවත් පුණ්‍ය කර්ම - පිං කිරීමෙන් ලබන්නා වූ සංස්කාර වන අතර මෙමගින් කාම ලෝකයේ උත්පත්තිය සඳහා හේතු සකස් වේ.
- ආනින්ජාභි සංස්කාර යනු පව් හෝ පිං නොවන රූප තල හා අරූප තල වල උත්පත්තිය සඳහා හේතුවන ධ්‍යාන වේ.

මේවායින් සිදුවන්නේ භවය ගොඩනැඟීමයි. බුදුන් වහන්සේ

මොහොතක් වත් භවය වර්ණනා නොකළ සේක. එනම් ඉහත සඳහන් මාර්ග තුනම බුදුන් වහන්සේගේ ධර්මය නොවන අතර එය මාරයාගේ ගමන් මගය.

නිවන් අවබෝධය මරණයෙන් මතු හෝ මතු බුදුවන බුදුන්ගේ සමයේ ලැබීමට බලාපොරොත්තු වීම මිනිසුන්ගේ මහා මුළාවකි. මන්ද එය ලබාගත හැක්කේ තමා තුළ මේ මොහොතේදීමය.

ධර්මාවබෝධය යනු ජීවිතයෙන් පලායාම නොවේ. අභ්‍යන්තරයෙන් ඇතිවන අයිතිවාසිකමක අතහැරීම තමා තුළ සිදුවන නමුත් ඔහු විසින් වගකීම් හා යුතුකම් මැනවින් ඉටුකරනු ලබයි. එය ආත්මාර්ථකාමී හා වගකීම් විරහිත මාර්ගයක් ලෙස නූතන මිනිස් සන්තානයේ සටහන් කර ඇත. එහෙත් ධර්ම මාර්ගය යනු මානව සංහතියේ සුරක්ෂාව, සුභසිද්ධිය හා උන්නතිය සඳහා වන එකම මාර්ගය වේ.

ඌණතාවයක් වූ ජීවිතය පූර්ණත්වය කරා නිදහස් වෙමින්, අවකාශය හා සමවන අවබෝධය නිවන නම් වේ. තථාගතයන් වහන්සේ දේශනා කරන ලද්දේ ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදන ලෙසය. එහෙත් දැනට සිදුවෙමින් පවතින්නේ ද්‍රව්‍ය පූජාව සහ ආහාර පූජාව යන පුණ්‍ය මාර්ගය මිනිසා විසින් තෝරාගැනීමයි. එහෙත් එයද සංසාර මාර්ගයම වෙයි.

සීලබ්බත පරාමාසය සෝවාන් ඵලයේදී අනිවාර්යයෙන් අතහැරෙන්නකි. නිවනට යොමු නොවුණු, දිව්‍යලෝක සඳහා යොමුවුන පුදපූජා සහ බාහිර වශයෙන් සමාදන් වන ශීලයන් සීලබ්බත පරාමාසය වනු ඇත. සත්‍යය දර්ශනය මත පිහිටමින් සතර සතිපට්ඨානය වඩන්න. සැනසුම වර්තමානයෙහිම ඔබ සතු වනු ඇත.

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

මිනිසා යනු කවරෙක් ද?

රකින්නට රටක්, ජාතියක්, ආගමක්, තනතුරක්, කුලයක්, පරම්පරාවක්, නැති ඒ පරම පූජනීය ජීවියා.

කියවන්නා : ඇයි මෙවැනි මාතෘකාවක් ගැන අප සාකච්ඡා කරන්නේ ? මිනිසා යනු කවරෙක් දැයි නවීන විද්‍යාවට අනුව වර්තමානයේ හොඳින්ම හඳුනාගෙන තිබෙනවා නේද?

පිළිතුර : ඔව්... ඔබට, මට මතුපිටින් බැලූ බැල්මට නම් එසේ සිතෙනවා. නමුත් ඔබ, මම ඇතුළු බොහෝ දෙනෙක් තවමත් මිනිසා හෙවත් තමා යනු කවුරුන්දැයි හඳුනාගෙන නොමැති බවයි අපගේ මතය. ඊට හේතු ලෙස වර්තමානයේ ලෝකය පුරා ඇතිවී ඇති විවිධාකාර ගැටුම්, අර්බුද සහ මනුෂ්‍යත්වය අමතක කළ සිදුවීම් එක් උදාහරණයක් ලෙස දක්වන්නට පුළුවන්.. සම්බුදු පියාණන් ප්‍රමුඛ සියලු ශාස්තෘවරුන් දේශනා කළ මිනිසා හෙවත් තමා පිළිබඳ ගවේෂණය (ආර්ය ගවේෂණය) අද වන විට බොහෝ දෙනෙක් අමතක කර ඇති බවයි නිරීක්ෂණය වන්නේ.

කියවන්නා : ඔබ සඳහන් කරන්නේ මිනිසා යනු තවමත් හඳුනාගෙන නොමැති සත්ත්ව කොට්ඨාසයක් ලෙසද? විද්‍යාව මෙතරම් දියුණු මේ සමයේ...?

පිළිතුර : නවීන විද්‍යාව ලෙස ඔබ හඳුන්වන ඔය දේ පරම සත්‍යයම

නොවෙයි.. නවීන විද්‍යාව යනු ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංචේන්ද්‍රියන්ගේ සංවේදන අනුව පරීක්ෂණය, නිරීක්ෂණය තුළින් ගොඩ නගා ගත් නිගමන සමුදායක්. නමුත් මේ පංචේන්ද්‍රියන් ඉතාම දුර්වලයි. තත්පරයකට 50 වතාවකට ආසන්න වාර ගණනක් නිවි නිවී දැල්වෙන ප්‍රති දීප්ත පහනක් (fluorescent tube) ස්ථායීව දැල්වී තිබෙන ලෙස රැවටෙන ඇසෙන් ලබාගත් නිරීක්ෂණ ද ඔබ විද්‍යාත්මකයි කියන්නේ ? ඒ වගේම 20 - 20000 Hz පරාසයේ ශබ්ද පමණක් ඇසෙන කණ මගින් ලබාගන්නා නිරීක්ෂණ ද ඔබ විද්‍යාත්මකයි කියන්නේ ? ඉදින් මෙවන් පංචේන්ද්‍රියන් ගෙන් ලබාගන්නා සංවේදන, අරමුණු ඔස්සේ සැබෑ සත්‍යයය හඳුනාගත හැකිද? නොහැකියි.

අනෙක් අතට මිනිසාගේ භෞතික නිර්මිත අවයව සහ පද්ධතිද, ඒවායේ ක්‍රියාකාරීත්වය ද දැනගැනීමෙන්වත්, බුද්ධි මට්ටම මැනීමෙන්වත් පමණක් මිනිසා, තමා හඳුනාගත නොහැකියි. මනුෂ්‍ය ජීවිතය කියන්නේ ශරීර හෙවත් පද්ධති 03 ක ක්‍රියාකාරීත්වයක්.

©
පර්යේෂණ කේන්ද්‍රය

කියවන්නා : ශරීර 03 ක් ? මොනවාද ඒ ශරීර 03 ? මා නම් දැක ඇත්තේ එක් ශරීරයක් සහිත මිනිසුන්..

පිළිතුර : අන්න හරි.. බොහෝ දෙනෙකු මෙන් ඔබද සිතන්නේ එසේමයි. ඔබ භෞතිකව දැක ඇති සහ අත්විඳින මේ භෞතික ශරීරය (physical body) ගැනයි ඔබ මේ පවසන්නේ. ඔව්.. එය එක් ශරීරයක්. එය දහම තුළ "කරජ

කාය" ලෙස හඳුන්වා තිබෙනවා. වර්තමානයේ බොහෝ දෙනෙක් "ඇඟම තමයි මම" ලෙස සිතමින් මුළාවී සිටිනවා.

දෙවන ශරීරය අපි බුද්ධිමය ශරීරය (Intellectual body) ලෙස හඳුන්වනවා. දහමේ දී මෙය "බුද්ධි කාය" ලෙස නම් කරනවා. ඔබ ඉගෙනගත් අධ්‍යාපනික දැනුම, ශිල්පීය දැනුම, විෂය කරුණු, උපාධි, ඩිප්ලෝමා, දහම් දැනුම ආදිය මේ ශරීරය නියෝජනය කරනවා. මෙය මොළය සහ මනස ඇසුරු කරගත් ශරීරයක්..

කියවන්නා : ඊටත් අමතරව තවත් ශරීරයක් තිබෙනවා ද? ඔබ පැවසුවා ශරීර 03 ක් පවතින බව?

පිළිතුර : ඔව්.. ඔබ දැක තිබෙනවා නේද ඉතාම නිරෝගී.. කාය ශක්තිය සහිත හැඩැති ලක්ෂණ සිරුරු සහිත, එමෙන්ම ඉතා ඉහල අධ්‍යාපනයක් ලද ඇතැම් පුද්ගලයන් ඉතාමත් පහත්, නීච ක්‍රියාවල නිරතව ඇති අවස්ථා..? ඉහල පරිපාලන විධායක නිලධාරීන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, ව්‍යාපාරිකයන් විවිධ වංචා, දූෂණ අක්‍රමිකතා සහ මිනිසත් බවට නොගැලපෙන ක්‍රියා සිදුකළ අවස්ථා. සමහර මිනිසුන්ට ගේ දොර, වතු පිටි, යාන වාහන සහ මිළ මුදල් බොහෝ සෙයින් රැස්කරගෙන තිබෙන නමුත් හිතේ සතුටක් නැතිව ජීවත් වීමට සිදුව ඇති අවස්ථා ඇතිවන්නේ ඒ ඔවුන්ගේ තුන්වන ශරීරය නොදියුණු නිසා.. එය තමයි අධ්‍යාත්මික ශරීරය (spiritual body)' මෙය දහම තුළ "ධම්ම කාය" ලෙස හඳුන්වනවා.

මේ ශරීර 03 ම සමබරව සංවර්ධනය වූ සහ භාවිතා කරන මිනිසෙක් තමයි අපට සැබෑ මිනිසෙක් ලෙස හැඳින්විය හැක්කේ.

කියවන්නා : ඔබ පවසන ආකාරයට වර්තමානයේ දකින අර්බුදවලට හේතුව මිනිසුන් තුළ මේ "ධම්ම කාය" නොදියුණු වීම ද ?

පිළිතුර : සැබැවින්ම... ඒ මන්ද යත් මිනිසා තමාගේ ආරම්භක ස්වරූපය වන "මනුෂ්‍යත්වය" (huminity) ඊට පසුව එය වසා දමමින් ඒ මත පැටවූ "පෞද්ගලිකත්වය" (personality) යන කුණු ගොඩ නිසා හඳුනාගත නොහැකිව වල්මත් වී සිටිනවා.

©

කියවන්නා : එය තව දුරටත් පැහැදිළි කළොත් ?.

මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ

පිළිතුර : හොඳයි... ඔබ මවගේ කුසින් බිහිවන මොහොතේ ඔබට මේ විශ්ව විඥාණය හිමිකර දුන්නේ "මනුෂ්‍යත්වය" (මිනිස් ස්වභාවය) පමණමයි. ඒ මොහොත ගැන හොඳින් සිතා බලන්න. මෙනෙහි කරන්න. ඔබට අන් කිසිම දෙයක් විශ්වයෙන් හෝ මේ අවකාශයෙන් උරුම වූයේ නෑ. ඔබට උරුම වූයේ පරම නිර්මල, පූජනීය ස්වභාවයක්... බුද්ධත්වය කරා වුවද යා හැකි ස්වරූපයක්. ළදරු සිත තුළ වෛරය, ඊර්ෂ්‍යාව, බෙදීම්, හෙළාදැකීම් නෑ. ඊට හේතුව මේ ආරම්භක මනුෂ්‍යත්වය"(huminity) තුළ පවත්නා නිර්මල සහ පරම පවිත්‍ර වූ ස්වභාවයයි.

නමුත් ඉපදී දින 2-3 ක් ගතවීමට මත්තෙන් ඔබට ඒ පරම පූජනීය මනුෂ්‍යත්වය වසා දමන පෙර සැකසුම් කුණුගොඩක් පෞද්ගලිකත්වය ලෙසින් දෙමාපියන් විසින් පටවනවා. ඒ තමයි ඔබේ උප්පැන්න සහතිකය. එයින් මේ විශ්වයට බිහිවූ අභ්‍යන්තර සාමය, සමාදානය සපිරි බෙදීමක් හෝ වෙන්වීමක් නොමැති උත්තරීතරවූත් නිර්මලවූත් ඔබේ "මනුෂ්‍යත්වය" වසා දමමින් පෞද්ගලික නමක්, වාසගමක්, කුලයක්, පරම්පරාවක්, ජාතියක්, රටක් ආදී පෞද්ගලිකත්වය උලුප්පා දක්වන (නො)වටිනාකම් රැසක් ඔබ මත පටවනවා. සත්‍යයය නම් මේ කිසිවක් ඔබේ කැමැත්ත මත හෝ ඉල්ලීම මත පැටවූ දේවල් නොවේ. එහෙත් දැන් ඔබට ඒවා රැකගැනීම සඳහා මනුෂ්‍යත්වය අමතක කර, මිනිස් ස්වභාවයට එරෙහිව සටන් වැදීමට, ලේ වැගිරීමට සිදුව තිබෙනවා නොවේද?

එයිනුදු නොනැවතී ක්‍රමයෙන් වර්ධනය වන විට ඔබ විසින්ම තව තවත් දෑ එනම් අධ්‍යාපන මට්ටම්, තනතුරු, කුලක, පංති ආදිය පෞද්ගලිකත්වය (personality) ලෙසින් උපයා ගන්නවා. මේ පෞද්ගලිකත්වයේ තිමිර පටලය සනකම ක්‍රමයෙන් වැඩිවත්ම එයින් වැසී යන්නේ "මනුෂ්‍යත්වය" නමැති ආලෝකයයි. ඉඳින් ඔබ මේ පෞද්ගලිකත්වයේ සංකේත රැකගැනීමට තමාගේ මූලික ස්වභාවය වන මනුෂ්‍යත්වය අමතක වී වල්මත් වී සාහසික සටනක යෙදෙනවා.

කියවන්නා : ඔබ පවසන්නේ මිනිසාට රටක්, ජාතියක්, ආගමක් අනවශ්‍යය කියා ද ? මේ අදහස බොහෝ සෙයින්ම විප්ලවකාරී සහ සමාජයෙන් ප්‍රතික්ෂේපිත විය හැකි ආකාරයේ අදහසක් නොවේද?

පිළිතුර : පෞද්ගලිකත්වයෙන් වල්මත් වී ඇති සමාජයක සැබෑ සත්‍යයය වන මනුෂ්‍යත්වය සැඟවී ඇති නිසා මේ අදහස් ප්‍රතික්ෂේප වීම සරල දෙයක්. එපමණක් ද නොව මේ සත්‍යය ධර්මතාවය පෙන්වා දෙන අය ජාති ද්‍රෝහීන්, අපරාධකරුවන් ලෙස හංවඩු ගැසීමටද ලෝකය පසුබට වන්නේ නෑ. නමුත් කොතරම් වුවත් සත්‍යයය සත්‍යයයමයි. එය වෙනස් වන්නේ නෑ.

ඔබ විමසූ අයුරින් රටක් අවශ්‍ය ද? සෑම මිනිසෙකුටම මේ තමාගේ ආරම්භක ස්වභාවය හඳුනාගතහොත් රටවල් ලෙස බෙදී සම්පත් වෙනුවෙන් සටන් වැදීමට සිදුවන්නේ නෑ. එසේම මේ පෘථිවියේ පවතින සම්පත් තව වසර සිය දහස් ගණනකට මනුෂ්‍ය ජීවීන් හට ප්‍රමාණවත්. මේ රටවල් හා දේශපාලන බෙදීම නිසා සම්පත් විසංතුළනයක් ඇතිවී තිබෙනවා. එක් රටක එක් ප්‍රදේශයක ආහාර අහේනියෙන් මිනිසුන් මිය යන විට, තවත් රටෙක වෙනත් ප්‍රදේශයක මිනිසුන් ආහාර අතිරික්තයන් මිල පාලනය කිරීම සඳහා විනාශ කරනවා. මේවා මිනිසා සිය මනුෂ්‍ය ස්වභාවය අමතක කළ අවස්ථා නොවේද? මේ පෘථිවිය නමැති පස් බෝලය මත මනෝමය දේශ සීමා පනවාගෙන, ඒවා රැකගැනීමට මුග්ධ අශීලාචාර දේශපාලඥයන් පත් කර ගෙන, තමාගේ ස්වාධීන නිදහස් නිවහල් ස්වභාවයෙන් මිදී ඔවුන්ගේ සහ දේශසීමාවල වහලුන් බවට පත්වී මිනිසා, විහින් දුක් විඳින බව ඔබට නොවැටහේද?

ඊළඟට ජාතිය ගැන බලමු. තමා උපන් ජාතිය මනුෂ්‍ය බවත්, එය පරම පවිත්‍ර නිර්මල සහ පූජනීය ස්වභාවයක් බවත් අවබෝධ කර නොගන්නා මිනිසුන් ඉපදී දින දෙක තුනකින් තමා මත බලාත්කාරයෙන් පැටවූ සිංහල,

දෙමළ, මුස්ලිම්, ජපන්, අරාබි ආදී විවිධ නම් වලින් හඳුන්වන පෞද්ගලිකත්වය රකින ජාතියකට අයත් යැයි මුළාවෙනවා. තම ජාතිය මනුෂ්‍ය බව අවබෝධ වුවහොත් සියලු මිනිසුන් සහ අනෙකුත් ජීවීන් සහ සම්පත් සමඟ සහජීවනයෙන් සහ සාමයෙන් ජීවත්විය හැකි වෙනවා. එහෙත් වර්තමානයේ සිදුව ඇත්තේ එකම මනුෂ්‍ය ජාතියක උපන් සත්ත්වයන් වන අප මංමුලාවී මායාවක් වූ ගොඩනඟා ගත් ජාතිකත්වයක් උදෙසා සටන් වැද, ලේ වගුරුවා මූලික නිර්මල ස්වභාවයෙන් ඈත් වීමක්.

නිකමට සිතන්න... තම ජාතිය රැකගැනීමට සටන් වදින, ලේ වගුරුවන යම් අයෙකුට තමා උපන් ප්‍රසූතිකාගාරයේ කාර්ය මණ්ඩලයේ අත් වැරදීමකින් අන්‍ය ජාතික මවකගේ දරුවෙක්ව ඉපිද වර්තමාන මව ළඟින් අත් වැරදීමකින් තැබූවෙක් නොවන බවට ඇති සහතිකය කුමක් ද? එමෙන්ම ඊළඟ භවයේ දී තමා වෛර කරන අන්‍ය ජාතිකයෙක් වී ඉපදීමක් සිදුවේ නම් එය වැළැක්වීමට ඇති හැකියාව කුමක්ද ? ඒ නිසා මේ සත්‍යය හරිහැටි අවබෝධ කරගත යුතුමයි.

© පර්යේෂණ කේන්ද්‍රය

කියවන්නා : ඔබ පවසන්නේ මිනිසාට ආගමක් වත් අවශ්‍යය නෑ කියා ද ?

පිළිතුර : නෑ... මිනිසාට ආගමක් අවශ්‍යයයි. එය වෙනමම ගැඹුරින් සාකච්ඡා කළ යුතු මාතෘකාවක්. ආගමක් යනු වන්දනීය පූජනීය ස්වභාවයක්. එය බාහිරින් පවතින පන්සල්, පල්ලි, කෝවිල් තුළ හෝ ධර්ම චක්‍ර, කුරුස, ත්‍රිශූල තුළ හෝ පිළිම, සුරුවම්, චෛත්‍ය ආදියේ හමුවන්නේ නෑ. ඒවා තවත්

භෞතිකයන් පමණයි. ඒවාට වැඳුම් පිදුම් කිරීමෙන් තාවකාලික මානසික සුවයක් ලැබෙන නිසා මිනිසුන් ඒ මතම රැඳෙනවා. එහෙත් එය තාවකාලිකයි. නියම සදාකාලික සුවතාවය සහිත නිවී සැනසීම සෑම මිනිසෙකුගේම ගැඹුරු අධ්‍යාත්මය තුළ පවතිනවා. මා ඔබට පවසන්නේ සෑම මිනිසෙකුගේ ම ආගම "හෘද සාක්ෂිය" ලෙසින් තමා තුළම පවතින බවයි. ආගමකින් අපේක්ෂා කරන්නේ සත්‍යයය කුමක්දැයි හඳුනාගැනීමක් සහ එතුළින් නිවී සැනසෙන අයුරු පහදා දීමක්. ඔබ ඕනෑම කාර්යයක් සිදුකිරීමට පළමු සිතිවිල්ල ඇතිවන විටම මේ පොදු අභ්‍යන්තර ආගම වන "හෘද සාක්ෂිය" ඔබ නිවැරදි කිරීමට හෝ එම සිතිවිල්ලේ සැබෑ ස්වරූපය මේ යැයි වටහා දීමට උත්සාහ ගන්නේ නැද්ද? එහෙත් ඔබේ කුහක පෞද්ගලිකත්වය සහ ලෝකයේ ඇති ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධි වලට ඇති තෘෂ්ණාව හෙවත් දැඩි ඇලීම ඒ ආගමට ("හෘද සාක්ෂියට") එරෙහිව වැඩ කිරීමට පොළඹවනවා නොවේ ද?

මේ බැව් බුදුන් වහන්සේ සෑම මනුෂ්‍යයෙක් තුළම "නිවන" පවතින බව දේශනා කර තිබෙනවා. සුවාසූ දහසක් ධර්මස්කන්ධය තුළ උන්වහන්සේ දේශනා කර ඇත්තේ බාහිර ලෝකය ජය ගැනීම පිළිබඳවද? උන්වහන්සේ දේශනා කර ඇත්තේ මනුෂ්‍ය ජීවිතය සම්බන්ධවයි... ආර්ය ගවේෂණයෙන් ප්‍රබුද්ධනය කර ගත හැකි, ලෝකය උත්තරණය කළ හැකි මනුෂ්‍ය ජීවිතයේ ගැඹුරු සත්‍යයය පිළිබඳවයි.

ඒ නිසා මේ මුළාවන්ගෙන් සහ වර්තමාන ආගමික පූජ්‍ය, පූජක යැයි කියාගන්නා තම පැවැත්ම උදෙසා බෙදීම් නිර්මාණය කර, කල්ලි කණ්ඩායම් තුළින් නිර්මල වූ සියලු ශාස්තෘවරුන් දේශනා කළ එකම දහම විකෘති කරන්නන්ගේ ග්‍රහණයෙන් මිදීම ඔබේ වගකීමයි.

ඔබ පවසන ආගම් බෞද්ධාගමික, ක්‍රිස්තියානි, ඉස්ලාම්, හින්දු ආදී ලෙස බෙදී ඒවා රැක ගැනීම සඳහා ලේ වගුරුවමින් සටන් වැදිය යුතු ඒවා නම් එවැනි ආගමක් මිනිසාට අවශ්‍ය නෑ. එය කිසිඳු ශාස්තෘවරයෙක් අනුමත කළ තත්ත්වයක් ද නොවේ.

කියවන්නා : අප පමණක් මෙසේ සිතුවහොත් වෙනත් ජන කොටසක් හෝ ආගමික කණ්ඩායමක් ඒ අයුරින් නොසිතා ක්‍රියා කිරීමෙන් අප විනාශ වී ඒ අය ලෝකය ග්‍රහණය කර ගනීවි යැයි බියක් බොහෝ දෙනා තුළ පවතිනවා ?

පිළිතුර : එසේ සිතීම බුදු සම්ඳුන් ඇතුළු සියලු ශාස්තෘවරුන්ගේ දහමට පටහැනියි. අප විසින් අවකාශයේ ගොඩ නඟනු ලබන සිතුවිලි ක්ෂේත්‍රයකයි අන් අය හැසිරෙන්නේ. ඇත්තටම මෙහි ඔබත් නෑ. මමත් නෑ. අන් අයත් නෑ... ඇත්තේ එකිනෙක හා සම්බන්ධව ක්‍රියාත්මක වන රැහැනක් වැනි චෛතසික සමුදායක්.. මේ රැහැනේ අප වෙලී සිටින තාක් කල් අන් අයද එල්ලී සිටිනවා. අප මේ රැහැනෙන් නිදහස් වී එය අත හැරි විට ඔවුනට එල්ලී සිටීමට රැහැනක් නොමැති වෙනවා. එවිට ඔවුනට නිදහස් වීමට අවශ්‍ය "අවකාශය"ලැබෙනවා. මෙහිදී "අවකාශය" ලෙස මා හැඳින්වූයේ රූප කළාප හැඟවෙන - මතුවෙන (යථාභූතය සහ රාශිභූතය) සිදුවන අවකාශයයි. එවිට ඔබ සඳහන් කරන අන් අයටද මේ පරම සත්‍යයයෙන් මිදී මුලාවට යා නොහැකි වනවා සහතිකයි.

කියවන්නා : ඔබ පවසන දේ සත්‍යයය බව වැටහුනත් ඒ අනුව සිතමින් ක්‍රියාත්මක වීම අසීරු බවෙක් දැනෙනවා ?

පිළිතුර : ඔව්. බොහෝ දෙනෙකුට මෙය අවබෝධ වුවත් සම්මතය බිඳ දැමීමට තරම් එඩිතර වන්නේ නෑ. බියයි. එනමුදු විශ්වයේ සත්‍යය දෙකක් නෑ. ඇත්තේ එක සත්‍යයයි. ඒ නිසා ඔබගේ ආරම්භක ස්වභාවය වන මනුෂ්‍යත්වය හඳුනාගත යුතුයි. එය කලින් පැවසූ සේම පරම පවිත්‍ර පූජනීය ස්වභාවයක්. කිසිදු බෙදීමක් ඒ තුළ නෑ. සිතන්න, ඔබේ සිරුර තුළට එක් මිලිමීටරයක් ඇතුළුවන්න. පල්ලි, පන්සල්, කෝවිල් එහි හමුවේද? සිංහල, දෙමළ, මුස්ලිම් අනන්‍යතාවයක් එහි හමුවේද? ගොවි, රදළ, රජක, බත්ගම්, චණ්ඩාල ආදී කුල ගෝත්‍ර හමුවේද? විධායක, පරිපාලන, වෛද්‍ය, කම්කරු රැකියා හෝ උපාධි, අට පාස්, ආචාර්ය-මහාචාර්ය තත්ත්ව හමුවේද?

පරමාර්ථ ධර්ම සහ හීනාර්ථ පිළිබඳව හදාරන්න. භෞතිකව මූල ද්‍රව්‍ය - අණු - පරමාණු -උප පරමාණුක අංශු - ශුද්ධාෂ්ඨක - රූප කලාප දක්වා බෙදීයන භෞතික ශරීරයක් සහ චිත්ත, චෛතසික සහ නිබ්බාණ පමණයි ඇත්තේ.

සිරුරේ භෞතික අවයව වල ඉහත කිසිදු බෙදීමක් නෑ. ලෝබ, මෝහ, ශ්‍රද්ධා, ප්‍රීති ආදියේ ද ඉහත බේදීම් අනුව වෙන්වීම් නෑ. ඉතින්, ඔබට මෙය දකින්නට හැකිනම් "සමස්ථය එකයි - එක සමස්ථයයි" ලෙස, එවිට කිසිදු බෙදීමක් නොමැති තැන මෛත්‍රිය නිසඟයෙන් උතුරා යනවා. එවිට දුර සිටින, ළඟ සිටින, හිතවත්, අහිතවත්, පියාඹන, බඩගාන ආදී ලෙස සත්ත්වයන් බෙදමින් මෛත්‍රී මන්තරය ආයාසයෙන් මැතිරීමේ අවශ්‍යතාවයක් මතු වන්නේ නෑ.

කියවන්නා : අවසන් වශයෙන් ඔබ පවසන්නේ ?

පිළිතුර : මිනිසා යනු එනම් තමා යනු කවරෙක් දැයි හඳුනාගැනීමට හෘද සාක්ෂියේ ආගම ඔස්සේ ආර්ය ගවේෂණය සිදුකරමු. මේ ගවේෂණය අවසානයේ ඔබට - මට අවසන් ප්‍රත්‍යක්ෂය වූ අප තුළම පවතින සදාකාලික සැපය වූ, අජර, අමර නිවී සැනසීම ලැබෙනු ඇත. සම්මා දෘෂ්ඨිය මේ මගේ ආරම්භයයි.

ඔබට තෙරුවන් සරණයි ! සම්මා දෘෂ්ඨිය පහල වේවා !! නිවනින් නිවී සැනසේවා !!!

මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

සාමය

පුද්ගලභාවය එකිනෙකා තුළ දියවී ගිය තැන නිමාවෙයි. ගැටුම. එයයි සාමය

"සාමය" වර්තමානය ලෝකයේ විවිධ රටවල වෙසෙන ජනතාව නිරන්තරයෙන් කථා බහ කරන සෑම මනුෂ්‍ය සිතක්ම අපේක්ෂා කරන දෙයක් බව නොරසහකි. එහෙත් සැබෑ සාමය යනු කුමක් දැයි මිනිසුන් හඳුනාගෙන ඇත්දැයි සැක සහිතය. ඊට හේතුව සාමය ආරක්ෂා කරන මිනිසා සාමය උදෙසා මේ වන විට ගෙන ඇති ක්‍රියාකාරකම්ය. සාමය උදෙසා වෙහෙසෙන මිනිසා ඒ සඳහා යොදාගෙන ඇති ප්‍රතිකර්ම හාස්‍ය ජනකය. උදාහරණ ලෙස සාම සාධක හමුදා සහ ඒවායේ අවි ආයුධ තර කිරීම්, සම්බාධක පැනවීම් ආදිය යි. එසේ නම් සැබෑ සාමය හඳුනාගැනීමේ අවශ්‍යතාවය වර්තමානයේ අප හමුවේ පවතී.

සාමය යනු එක අයෙකු අනෙකාව පිළිගැනීමයි. ලෝක ස්වභාවය වන්නේ විවිධත්වයයි. විවිධත්වය තුළ තරඟකාරිත්වය නිර්මාණය වේ. තරඟකාරිත්වය තුළ ගැටුම නිර්මාණය වේ. ගැටුමේ කෙළවර යුද්ධයයි. ඕනෑම බිහිසුණු යුද්ධයක් පළමුව හට ගන්නේ මිනිසාගේ සිත තුළය. සාමය ගෙන ආ යුත්තේ ද මූලිකව යුද්ධය - ගැටුම හට ගත් මිනිස් සිත තුළින්මය. යුධ පිටියට සාමය ගෙන ආ නොහැක. අද දවසේ අපට දක්නට ලැබෙන්නේ යුධ පිටිය

සාමකාමී කිරීමට ප්‍රයත්න දරන්නා වූ පිරිසකි. ඒ නිසයි පෙර කී සාම සාධක හමුදාවක් භාවිත කිරීමට සිදුව ඇත්තේ.

ජන සමාජය සකස් වී ඇත්තේ එක් එක් පුද්ගලයා අනෙක් පුද්ගලයන් මත පවත්වන සබඳතා මතය. සාමය යනු එකෙක් අනෙකාව පිළිගැනීමයි. ඒ සඳහා එක් එක් පුද්ගලයාගේ අභ්‍යන්තර චෛතසික මට්ටමේ ක්‍රියාකාරිත්වය වෙනස් විය යුතුයි. මෙසේ අභ්‍යන්තර චෛතසික මට්ටමේ ක්‍රියාකාරිත්වය වෙනස් වීමට නම් සංකල්ප මත හටගත් වැරදි දෘෂ්ටීන් විනිවිද සත්‍යය දර්ශනයට පත්වීම සිදුවිය යුතුයි. එවිට පුද්ගලයා තුළ ක්‍රියාත්මක වන චෛතසික මඟින් අභ්‍යන්තර සාමය හට ගනු ඇති.

අභ්‍යන්තර සාමය හට ගැනීමත් සමඟ පුද්ගල සාමය ඇති වීම හා පවුල් ඒකකයද සාමකාමී වීම සිදුවේ. එවැනි පවුලකට සිය අසල්වැසියන් මත ප්‍රේමණීය පිළිගැනීමත් මිත්‍රශීලී පිළිගැනීමත් නිසගයෙන්ම ඇති වේ. පවුල් ඒකක අතර ගොඩනැගෙන එම සාමකාමිත්වය සමස්ථ ජන සමාජයම සාමකාමී නොකරන්නේ ද? මෙසේ පුද්ගල චිත්ත සන්තානය තුළ අභ්‍යන්තර සාමය ගොඩනැගෙන තුරු, සමස්ථය එකයි - එක සමස්ථයයි ලෙස දකිනතුරු ලෝක සාමය යනු සිහිනයක් පමණි.

සෑම විටම තමා තුළ මේ මොහොත අත් නොවිඳින පුද්ගල විඥානය නිතරම බියෙන් පසුවේ. භීතිය අමතක කරගනු වස්, රැකවරණය තහවුරු

කරගනු වස් කණ්ඩායමක්, කල්ලියක් ගොඩනගා ගැනීමට උත්සාහ කරයි. මෙසේ ගොඩනගා ගත් කල්ලි, කණ්ඩායම් විසින් තනාගත් ප්‍රඥප්තීන්ට ගරු කිරීමටත් ඒවාට අනුගත නොවන්නන් මර්දනය කිරීමටත් දඬුවම් හා නීති ඔවුන් විසින්ම පනවාගෙන ඔවුන්වම පාලනය කර ගැනීම සිදුකරනු ලබයි. මෙසේ ගොඩනගා ගත් කණ්ඩායම් අතර ගොඩනැඟෙන්නා වූ තරඟකාරිත්වය, ගැටුම නිර්මාණය කර එය යුද්ධය නිර්මාණය කරා ගෙන යනු ලැබේ.

අභ්‍යන්තර සාමය ඇති කර ගැනීමට නම් ඔබට හමුවන ද්‍රව්‍ය, පුද්ගල සිද්ධි දෙස සැමවිටම පළමුවෙන්ම දුටු දෙයක්, හමු වූ දෙයක් ලෙස දැකීම වැදගත් වේ. සත්‍යය වශයෙන්ම අපට හමුවන්නේ එවැනි නැවුම් පුද්ගලයන්ය.

පූර්ව නිගමන වලින් හා විනිශ්චය කිරීම් වලින් මිදී සියළු දෙනා ඇසුරු කර ඇති නම් අනිවාර්යයෙන්ම සමස්ථය එකයි - එක සමස්ථයයි යන දැක්ම ඇති කර ගත හැකි වේ. එවිට අභ්‍යන්තර සාමය ඇති වේ. එයට පූර්ව මතිමතාන්තර හා මතකයන් වලින් දූෂණය නොවූ නැවුම් මිනිසුන්, ද්‍රව්‍ය ආදිය අපට හමුවනු ඇත. එවිට මෙම සිත තුළ ඇති වන අභ්‍යන්තර සාමය මුළු විශ්වයටම සාමය උදාකරනු ඇත. තමා තුළ සිදී යන ගැටුම ලෝකය තුළ ඇති ගැටුම ද හමාර කරනු ඇත. සියලු දෙනාම තමා හා සමානව දකින විට තරඟකාරිත්වය අතුරුදහන්ව සාමය ද උදාවනු ඇත.

තොටුපල

උතුම් නිර්වාණය පෙනෙන මානයට පැමිණ ඇත. කුමට තොටුපොලෙන් ආපසු හැරී යමුද?

මිනිසා යනු ස්වාභාවිකවම කුතුහලයෙන් පිරුණු ජීවියෙකි. ස්වභාව ධර්මය යනු කුමක්ද? එහි සංසිද්ධීන් සිදුවනුයේ කෙසේද? මේ ලෝකය යනු කුමක්ද? මෙවැනි ගැටළු සඳහා පිළිතුරු මිනිසා විසින් අනාදිමත් කාලයක පටන් සොයමින් සිට ඇත. ලෝකයේ මේ තාක් සිදුවී ඇති භෞතික මෙන්ම තාක්ෂණික සංවර්ධනයටද, එවැනිම වූ මිනිස් හස්තයෙන් සිදුවී ඇති හා සිදුවෙමින් පවත්නා විනාශයන්ට ද මිනිසාගේ මෙම සහජ කුතුහලය හේතුවී ඇත. නමුත් වඩාත් වැදගත් කරුණ වනුයේ මිනිසා ස්වකීය කුතුහලය ඔස්සේ තමාගෙන්ද, භෞතික සංවර්ධනයෙන්ද ඔබ්බෙහි වූ තවත් යම් කිසිවක් අනාදිමත් කාලයක පටන් සොයමින් සිට ඇත. මිනිස් විඥ්ඥාණයෙහි ඉතා ගැඹුරින් තැන්පත් වී ඇති එම කුතුහලය නම්, මේ ලෝකයෙහි සත්‍යයය නැතහොත් යථාර්ථය කුමක්ද? යනුයි.

එම ලෝක සත්‍යයය නැතහොත් යථාර්ථය සොයමින් වල්මත් වී සිටින මිනිස් ප්‍රජාව නිවා සනහාලමින්, ගාම්භීර වූ එම පරම සත්‍යයය ලොවට අනාවරණය කරනුයේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් විසිනි. උන් වහන්සේ විසින් දේශනා කරන එම දහම් මාර්ගය අනුගමනය කිරීමෙන් උත්සාහවන්තයෝ මෙම දුක් සහිත ලෝකයෙන් මිදී පරම සැපයට පත්වෙති.

එම ප්‍රායෝගික දහම් ගඟුලට පිවිසීම සඳහා තොටුපලක් අවශ්‍ය වෙයි. ඒ සඳහා ඇති තොටුපලක් නම් ශීලයයි. නමුත් ගැටළුව වනුයේ වර්තමාන ලෝකයේ ශීලය යන නාමයෙන් ක්‍රියාත්මක වනුයේ නිවැරදි ශීලයමද යන්නයි.

වර්තමාන බෞද්ධ සමාජයේද පංච ශීලය, දස ශීලය, උපෝසථ ශීලය ආදී නොයෙකුත් නම් වලින් හැඳින්වෙන ශීලයන් භාවිතා කරනු අප දකින්නෙමු. ඒ තුළ සැබෑවටම ඇත්තේ යම් චර්යා ධර්ම පද්ධතියකට එසේත් නැති නම් හොඳ යැයි සම්මත හැසිරීම් රටාවකට මිනිසා බලයෙන් අනුගත කිරීමකි. ලොව ඇති සියලු ආගම්, පුද පූජා, යාතිකා,' යාඥා සහ සජ්ජායනා මෙන්ම මෙම ශීල ව්‍රත වටා ගොඩනැගී ඇත. වර්තමාන ලෝකයේ සියලුම ආගම් තුළ ක්‍රියාත්මක වන මෙම සියලු ශීල ව්‍රත ක්‍රම සඳහා පදනම වී ඇත්තේ මිනිසා අභ්‍යන්තරයේ නිරන්තරයෙන් පවතින භීතියයි. මිනිසා තමාගෙන් පිට කිසියම් වූ ගුප්ත දෙයක්, දෙවි කෙනෙක් හෝ පරම නිදහසක් අනාදිමත් කාලයක පටන් සෙවීමට ඔහු තුළ නිරන්තරයෙන් පවතින මෙම භීතිය ද හේතුවක් වී ඇත.

මිනිසාගේ මුල් යුගවලදී මෙම භීතිය නිසාම ගස්, ගල් එමෙන්ම ගුප්ත ස්ථාන ආදිය ඇදහීමටත්, වන්දනාමාන කිරීමටත් හුරුපුරුදු වී සිටී. මිනිසා පසුකාලීනව ආගම් බිහිවීමත් සමඟම ශාස්තෘවරුන් විසින් දේශනා කළදේට

පටහැනිව ආගමික පූජකයන් විසින් නිර්මාණය කළ ශීල ව්‍රත අනුගමනය කිරීමට ගොස් තත්ත්වය වඩ වඩාත් අවුල් සහගත කරගෙන ඇත. අවාසනාව වනුයේ ධර්ම මාර්ගයට අවතීර්ණ වනවා යැයි කියමින් මෙම වැරදි ව්‍රත අනුගමනය කිරීමෙන් ධර්ම මාර්ගයෙන් දිනෙන් දිනම ඈත්වීමයි.

ආගමික පූජකවරුන් විසින් ඔබට ශීලය යනුවෙන් හඳුන්වා දෙනුයේත් ඒ සඳහා ඔබ යොමුකරනුයේත් කෙසේද? අවුරුද්දේ විවිධ මාසවල, විවිධ දින වල හොඳ යැයි සම්මත හැසිරීම් රටාවකට හෝ චර්යා ධර්ම පද්ධතියකට අනුගත කරවීම නොවේද? ඔබ ඔබ දෙසම බලන්න. ඔබ ශීලය යනුවෙන් කරමින් සිටිනුයේ කුමක්දැයි හොඳින් බලන්න. අවුරුද්දේ සියලුම දින වල උදේ හවස එවැනි හැසිරීම් රටාවකට හෝ චර්යා ධර්ම පද්ධතියකට අනුගත වෙමියි ප්‍රතිඥා දීම ශීලයක්ද? කිසිසේත් නැත. එය වනාහි ආගමක් ගොඩනඟා ගැනීමට සහ පූජක පැලැන්තියක පැවැත්ම උදෙසා ඔවුන් විසින් ඔබගේ භීතිය ප්‍රයෝජනයට ගැනීමකි.

එවැනි ක්‍රියාමාර්ගයක් තුළින් සිදුවනුයේ ඔබගේ ආශාවන් මැඩලීමක් හා සිතුවිලි පාලනය කරගැනීමක් පමණි. එනම් ශීලය මැයෙන් ඔබ කරනුයේ මර්දනයකි. එය ඔබගේ ස්වභාවිකත්වය ඉක්මවූ කෘත්‍රිම තත්ත්වයකි. එයින් ඔබට සිදුවනුයේ කෘත්‍රිම ශික්ෂණය හා අනුගතවීම හේතුකොට ගෙන ඇතිවන අඳුරු හා පීඩිත මනසක හිමිකාරයෙකු වීමටය. එවැනි මනසක්, එවැනි

ශීලයකින් මිදී බාහිර ලෝකයට පලායාමට සූදානමින් සිටින ඒ සඳහා ප්‍රයත්න දරන මනසකි. ලොව සියලු ආගමික පූජකයින් විසින් නිර්දේශිත ශීලය ඔබව අවසානයේ රැගෙන යනුයේ එවැනි සාමාකාමීත්වයෙන් තොර මනසකටය. එසේ නම් එවැනි මනසක් සහිතව ඔබට සත්‍යය මාර්ගයට පිවිසිය හැකිද?

එසේනම් සැබෑ ශීලය යනු කුමක්ද? සැබෑ ශීලයෙහි පදනම ආදරයයි. සැබෑ ශීලය නම් තමාගෙන් පිටත ඇති ව්‍රතයකට තමාට හැකි පහසු විටෙක අනුගත වීමත්, තමාට නොහැකි අපහසු විටෙක ඉන් මිදීමත් නොවේ. සැබෑ ශීලය නම් ශීලය ඔබ තුළට පමුණුවාගෙන නිරතුරුව ශීලයෙහි පිහිටා ශීලය තුළ වාසය කිරීමයි. එනම් ශීලයත් ඔබත් දෙදෙනෙකු නොව එකෙකු වීමයි. ඔබ ස්වයං ශික්ෂණයකට පත්වනුයේ එවිටය.

භීතිය නොව ආදරය පදනම කරගත් විට සැබෑ ශීලය ඔබ තුළ පහල වනු ඇත. “මම සතුන් නොමරමි” යැයි ශීලයක ඔබ පිහිටියේ නම්, එසේ විය යුත්තේ සතුන් මැරීමෙන් ඔබ අපායට යාවි යැයි බියෙන් නොව, අනුන්ගේ ජීවිතයද තමාගේ ජීවිතය මෙන් ඉතා වටින්නේ යැයිද, හිංසාව වනාහි පිළිකුල් කළ යුතු දෙයක් යයිද නුවණින් විමසා අවබෝධ කරගැනීමෙනි. එසේ අවබෝධ කරගැනීමෙන් සිතුවිලි මර්දනයකින් තොරව ආදරය ඔබ හදවතෙහි පහල වනු ඇත. ඒ ආදරය ඔබේ මනසෙහි නොව ඔබේ හදවතෙහි, ඔබේ අභ්‍යන්තරයෙහි ගැඹුරු පතුලෙහි තැන්පත් වන නිසා ඔබ විසින් කිසිදු

සතෙකුගේ ප්‍රාණය නැසීමට කිසිදා නොපෙළඹෙනු ඇත. ඒ සඳහා ඔබට විශේෂිත සිල් පදයක් සමාදන් වීමට හෝ උච්චාරණය කිරීමට අවශ්‍ය නොවනු ඇත. ඔබ තුළ ආයාසයකින් තොරවම එම ආදරය, එම හැඟීම, ශීලය පහල වනු ඇත. ශීලය ඔබම බවට පත්වී ඇත. ශීලය නම් ඔබයි, ඔබ ශීලයයි. එසේ පිහිටන ශීලය ඉතා බලවත් එකකි. තමා අතහැර අන් සියල්ලටම ආදරය කිරීමට එම ශීලය ප්‍රබලය. ඇත්ත වශයෙන්ම ආදරය කිරීම නොව හුදෙක් ආදරය පමණක් එහි ඉතිරි වේ. (ආදරය කරනවා යනු පුද්ගලයකු සිදුකරන ක්‍රියාවකි, එය චින්තනයේ ප්‍රතිඵලයකි, එක් ක්ෂණයකදී එම ආදරය වෛරය බවටද පරිවර්තනය විය හැක.) එනම් ශීලය යනු හුදෙක් ආදරයම වේ. ආදරය යනු සමස්ථයයි. ඔබ තමා අතහැර අනුනට ආදරය කරයි නම්, තමා අතහැරෙන ප්‍රඥාව ඔබ තුළ පහළ වී ඇත. එනම් ධර්ම මාර්ගය ශීලයෙන් ආරම්භ වී ආදරය ඔස්සේ ප්‍රඥාවෙන් අවසන් වී ඇත.

දහම් ගඟුලට පිවිසිය හැකි අනෙක් තොටුපළ වනුයේ ප්‍රඥාවයි. ලෝකයා දැනුම, බුද්ධිය ප්‍රඥාව වැනි දෑ ගැන කථා කරයි. ඒ පිළිබඳ තර්ක විතර්ක ඉදිරිපත් කරයි. සැබැවින්ම දැනුම, බුද්ධිය, ප්‍රඥාව යනු එකක්මද? ලෝකයා මෙය හඳුනාගෙන ඇත්තේ එකම දෙයක් හැඳින්වීම සඳහා භාවිත කරනු ලබන වචන ත්‍රිත්වයක් ලෙසය. මේ පිළිබඳව මනා සිහි නුවණින් විමසා බැලිය යුතුව ඇත. දැනුම යනු කුමක්ද? එය ඔබ අත්විඳි අත්දැකීම්

ගොන්නකින් බිහිවන්නකි. ඔබ මතකය ලෙස ගොඩගසා ගත් මති මතාන්තර හා දත්ත ගොන්නකි. දැනුම කාලය හා අවකාශය සමඟ සහසම්බන්ධය. ඒ හා සමඟ වෙනස්වන සුළුය. එමෙන්ම එය සාපේක්ෂ වූ දෙයකි. එය ඔබේම අත්දැකීම් වලටත් අන් අයටත් කාලයටත් සාපේක්ෂය. එනම් දැනුම තුළ "ආත්මය" හා "මම" ඇත. දැනුමින් ඔබට බොහෝ සෙයින් සන්නද්ධ විය හැක. ආචාර්ය, මහාචාර්ය වැනි තනතුරු තානාන්තර ලැබ සමාජ යේ උසස් ලෙස වැජඹිය හැක. ත්‍රිපිටකධාරී විය හැක. සූත්‍ර ලක්ෂ ගණනක් වුව කටපාඩම් කොට දැනුම ලෙස රැස්කළ හැකිය. පාලි සිංහලයට පෙරලන්නෙකු ද විය හැකිය. නමුත් ඔබ සත්‍යයෙන් බොහෝ ඈතය. වර්තමාන ලෝකයේ ආගමික සමාජය තුළ අපට දැකගත හැක්කේ එවැනි පිරිස්ය.

බුද්ධියද එවැනිම වූ දෙයකි. බුද්ධිය චින්තනයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. මූලික න්‍යාය ගැන දැනුවත් වූ පසු ඔබට අළුත් ගණිත ගැටළුවක් දුන් විට ඔබගේ මොළය හා මනස භාවිත කොට එනම් චින්තනය ක්‍රියාත්මක කොට ඔබට එම ගණිත ගැටළුව විසඳිය හැකිය. එය ඔබ සතු බුද්ධියයි. තර්කනය යනු චින්තනයේම විකාශනයකි. බුද්ධිය ද පුද්ගල බද්ධ වූ දෙයකි. එමෙන්ම එය සීමිත වු දෙයකි. ඔබට බුද්ධිය මෙහෙයවා යම් යම් නිගමන වලට එළඹිය හැකිය. ඔබ යම් නිගමනයකට එළඹි වහාම ඔබ සොයාබැලීමෙන්, විමර්ශනයෙන් ඉවත්වී සත්‍යයෙන් ඈත්වීමට පටන්ගනී.

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ සංරක්ෂණ කේන්ද්‍රය

නමුත් ප්‍රඥාව මේ සියල්ලටම වෙනස්ය. ප්‍රඥාව යනු වර්තමාන පූජක පැලැන්තිය සිදුකරන ත්‍රිපිටකය හා අනෙකුත් ධර්ම ග්‍රන්ථ කටපාඩම් කිරීමත් තර්ක විතර්ක ඉදිරිපත් කරමින් තම පාණ්ඩිත්‍යය හා මමත්වය හුවා දැක්වීමක් නොවේ. ප්‍රඥාව යනු පූර්ණ අවබෝධයට පත්වීමයි. ප්‍රඥාව අවදි කිරීමට නම් පූර්ණ ලෙස නිදහස් විය යුතුය. තවදුරටත් චින්තනයේ වහලෙක් නොවිය යුතුය. සියල්ල අතහැර සමස්තය දෙස අවධානය යොමුකළ යුතුය. මේ සඳහා ඔබ කළ යුත්තේ ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. ඔබ තුළ සිදුවන සත්‍යය ක්‍රියාකාරීත්වය කුමක්දැයි ඔබගේ අභ්‍යන්තරයට .. මූලයටම ගොස් ඍජු අවධානයෙන් බැලීමයි. එමෙන්ම බාහිර ලෝකයේ පවතින ද්‍රව්‍ය, පුද්ගල සහ සිද්ධි දෙස ඒවායෙහි මතුපිට ස්වභාවය නොව ඒවායෙහි මූල ස්වභාවයට ගොස් බැලීමයි. එනම් සියලු දෙයකම ඇති බව ලෙස විද්‍යාමාන වන එලයත් නැති බව ලෙස අවකාශය තුළ සැඟව යන හේතුවත් දෙස තීක්ෂණ අවධානයෙන්, සිහියෙන් පසුවීමයි. එවිට මතුපිට මනසට නොව ගැඹුරු අභ්‍යන්තරයට දැනෙන ඥාන මත, ඔබ කෙමෙන් අවබෝධත්වය (නිරුක්තිය) කරා පියනගනු ඇත. මේ ලෝකයෙහි ඇති මායාව විනිවිද ඇත්ත ඇති සැටියෙන් දකිනු ඇත.

එතෙක් කල් ඇති දෙයකැයි හැඟුනු ආත්මයක් හා මම යන ස්වභාවයකින් තොරව අසීමිත සත්‍යය හා ඒකාත්මික වනු ඇත. මුළු මහත්

සමස්තයම එකක් බව දකිමින් පූර්ණ අවබෝධත්වයට පත්වනු ඇත. (එනම් බුද්ධ, ධම්ම, සංඝ තමා තුළ පිහිටයි.) මහා ප්‍රඥාව වනුයේ එයයි. එය පිටින් ලබාගත හැකි දෙයක් හෝ තර්කයෙන් ගොඩනඟා ගත හැකි දෙයක් නොව, එය ඔබ තුළ පහල වන්නකි.

එම මහා ප්‍රඥාව පහලවන්නා තුළ ඉන්ද්‍රිය සංවර ශීලය නිතැතින්ම ක්‍රියාත්මක වේ. පරිපූර්ණත්වය තුළින් පහල වන මහා කරුණාවත්, මුදිතාවත් ඔහු තුළින් උතුරා යයි. නිරපේක්ෂ ආදරය නිතැතින් පහල වෙයි. මෙසේ යම් කෙනෙකුන් මේ ලෝකය තුළත් තමා තුළත් යථා ස්වභාවය එනම් ඇත්ත ඇති සැටියෙන් දකිමින් සිටීමේදී ඔහු තුළ ප්‍රඥාව පහල වී ආදරය, කරුණාව, මුදිතාව උතුරා ගලා යයි.

දහම් මඟ වඩන උත්සාහවන්තයා ශීලයෙන් පටන්ගෙන ආදරයේ හා කරුණාවේ පූර්ණත්වයට පත්ව ඇත්ත ඇති සැටියෙන් දකින ප්‍රඥා සම්පන්න තත්ත්වයට පත්වීමත් සහ ප්‍රඥාව වඩමින් ආරම්භ කොට ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කරමින් ආදරය හා කරුණාවේ පූර්ණත්වය සහිත පූර්ණ අවබෝධත්වයට පත්වීමත් යන කවර තොටුපලකින් ධර්මයට අවතීර්ණ වූවත් ඔහු කළ යුතු වැඩ කොටස පූර්ණ ලෙසම අවසන් කර දුකින් මිදීම සිදුවෙයි.

තරුණයා හා පෞරුෂය

කිසිදා සංවර්ධනය කරගත නොහැකි නමුදු මතුකර ගත හැකි ඔබේ පෞරුෂය.

උපන් දා සිට මරණය දක්වා වූ මේ ගමනේ, තරුණයකු හෝ තරුණියක ලෙස ගෙවන කාල වකවානුව ජීවිතයේ සුවිශේෂී පරිච්ඡේදයකි. අප ගත කළ එම කාල වකවානුව, ජීවිතය සැහැල්ලුවෙන් ගත කළ, නවමු අත්දැකීමෙන් පිරි හා උද්යෝගයෙන් පිරි කාලයක් බව මාගේ අදහසයි. නමුත් වර්තමානයේ දී වේගයෙන් දියුණු වන භෞතික සමාජ වටපිටාව තුළ කවමදාකවත් නොවූ පරිදි, තාරුණ්‍ය දැඩි තරඟකාරී හා වෙහෙසකර වූ සීමා බන්ධන වලින් කොටුකර ඇති බව පෙනේ.

තරුණ අවධිය තුළ දී, කුඩා දරුවකුව සිටි කාලයට වඩා, ජීවිතය අත්හදාබැලීමෙන් හා සමාජය සමඟ වෙනස් ආකාරයකට ගනුදෙනු කිරීමෙන්, තරුණයාට ඔහුව තීව්‍ර ආකාරයෙන් දැනෙන්නට වීම සුවිශේෂී කාරණයකි. තරුණයා විවිධ ආකාරයෙන් සමාජය තුළ ඉස්මතුවීමට වැඩි කැමැත්තක් දැක්වීම හා සමාජය වෙනුවෙන් පෙනී සිටීම තුළින් අන් අයට ඔහුව ප්‍රක්ෂේපනය කිරීම තරුණයා තුළ සිදුවන ස්වාභාවික සංසිද්ධියකි. තවද, තම ජීවිතය පිළිබඳව ස්වයං තීන්දු තීරණ වලට එළැඹීම තුළින් ඔහු ස්වාධීන පුද්ගලයෙකු බව සමාජයට හා තම වැඩිහිටියන්ට කියාපෑමෙන්,

තමා වෙනම වූ පුද්ගලයෙකු බව ඉස්මතු කරවයි. නමුත්, සමාජය, සංස්කෘතිය, ආගම, ජාතිය, අධ්‍යාපනය හා පවුල් පසුබිම වැනි නොයෙකුත් ආකාරයේ තත්ත්වාරෝපණයන් තුළින් පුංචි අවධියේ සිට තමාව හඳුනාගත් තරුණයා විවිධාකාර වූ පුද්ගලභාවයන් තමා තුළ වර්ධනය කරගෙන, එය තමාගේ පෞරුෂය ලෙස හැඳින්වීම විශාලම මුලාවයි. මේ කාරණයට හේතුව නම්, බහුතරයක් වැඩිහිටියන් විසින් තමාට ඇති දැක්ම හා ආශාව අනුව, තම දරුවන්ව විවිධ ඉලක්ක හා අරමුණු ලඟාකර ගැනීම සඳහා තරඟයකට යොමු කිරීම තුළින්, තමාගේ තත්ත්ව ස්වභාවය අමතක වී, තරුණයෙකු වන විට ජීවිතයද තරඟයක් බවට පත් විමයි. එවිට තරුණයා වටහාගෙන ඇත්තේ ජීවිතය යනු තරඟයක් බවත්, එය හොඳින් හෝ නරකින් ජයග්‍රහණය කළ යුතු බවත්ය. තවද, එවැනි තරඟකාරී මනසක් නිර්මාණය කරනු ලබන්නේ තම පුද්ගලභාවය විසින් බව ඔවුන් නොදනී.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

සමාජය තුළ අද පවතින විශාල ආගමික ප්‍රබෝධය තුළ, තරුණයා විසින් දර දිය ඇදීම කාගේත් සතුටට කාරණයක්. පූජනීය ස්ථාන තුළ සංවිධානය කරන්නාවූ නොයෙකුත් ආකාරයේ සංස්කෘතික හා ආගමික කටයුතු, තරුණයාගේ මූලිකත්වයෙන් සිදුවිම තුළ, තරුණයා යහපත් පුද්ගලයකු වී ඇති බව බහුතර මතයයි. සැබැවින්ම සමාජ පෙරළියකට

තරුණයා මුල පිරිය යුතුය. නමුත් අප සමාජය තුලම ක්‍රියාත්මක වන අපරාධ, මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, සොරකම්, තම ජීවිතය විනාශකරගැනීම් හා මත්ද්‍රව්‍ය වෙළඳාම් යන නොයෙකුත් සමාජ අපචාර සඳහා තරුණයාගේ දායකත්වය ඉහලින්ම ඇති බව නොරහසකි. එසේ නම් තරුණයා යහපත් දරුවකු බවට පත් කිරීමට ගත් සමාජ වෑයම සාර්ථක වී ඇත්ද? සත්‍ය නම් හුදු සංස්කෘතික හා ආගමික කටයුතු තුලින් සිදු කර ඇත්තේ තව තවත් තරුණයාගේ පුද්ගලභාවයන් තීව්‍ර වූවා මිසක, පෞරුෂය මතු කරගන්නා මාර්ගය කියා දී, ඔහුව ඒ සඳහා යොමු නොකිරීමයි. තමා තුළ වූ අව්‍යාජ මනුෂ්‍යත්වය නොදැකීම තුළ, ඔහු සිහියක් නැති පුද්ගලයකු බවට පත්වීමෙන්, මිනිස් වර්ගයා හා සොබා ධර්මයට විනාශය පමුණුවා ඇත. මේ සිදුවන විනාශයන් සඳහා, දැන් තරුණයාට දෝෂාරෝපණය කර පලක් නැත. බුදුන් වහන්සේ හා ජේසුස් වහන්සේ දේශණා කර තිබෙනවා "ඔබ වපුරන්නේ මොනවාද? එය ඔබ නෙලාගන්නා බව". එසේනම් තරුණයා තුළ පවතින පෞරුෂය මතුකර ගන්නේ කෙසේද? ඔහු තුළ ඇති මහා පෞරුෂය වූ මනුෂ්‍යත්වය ළගාකර ගැනීමට නම්, පරිපූර්ණ ජීවිතයක් ගොඩනගා ගත යුතුය. ඒ සඳහා තමාගේ ජීවිතය විනිවිද දැකිය යුතුය. අප සැමදෙනා තේරුම්ගත යුතු කරුණ නම්, ජීවිතය යනු, ශාරීරික, බුද්ධිමය හා අධ්‍යාත්මයේ නියම වූ සංයෝගයයි. මේ ත්‍රෛයි කාරණා සෑම පුද්ගලයකුම

තුළ නිවැරදි ආකාරයෙන් වර්ධනය වුවහොත්, එය මනුෂ්‍යත්වයෙන් පරිපූර්ණ ජීවිතයක් බවට පත්වනවා නොඅනුමානයි. එම ජීවිතයම තමා පුද්ගලයකුගේ අව්‍යාජ පෞරුෂත්වය.

අපගේ බුද්ධිමය ජීවිතය වර්ධනය සඳහා, නිදහස් අධ්‍යාපනයෙන් ලැබෙන පිටිවහල ඉතාමත් අගය කළ යුතුය. නමුත්, මෙම අධ්‍යාපන ක්‍රමවේදය තුළ ඇති, තරඟකාරී හා ඉලක්ක පසු පස හඹා ගොස්, දරුවකුගේ වර්ධනය මැනීම ඉතාමත් අසාර්ථක ක්‍රමවේදයකි. ලොව බොහෝ රටවල් මෙම ක්‍රමවේදයෙන් මිදී, නව ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර බොහෝ කල්ය. මෙම රටාව තුළ, දරුවා කුමකට නිතැතින්ම සමත්ද, යන්න සොයා බලා, ඔහුගේ හදවතට එකඟව තීන්දු තීරණ ගැනීමට සැලැස්වීම සඳහා පවතින ක්‍රමවේදයේ ඇති ඉඩකඩ ඉතා සීමිතය. ඔහු තරුණයෙකු වූ කල්හි, සමාජය විසින් පිළිගත් වෘත්තීය හා සමාජ තත්ත්වයන් හෙබවූවත්, තරඟයක් තුළින් නිර්මාණ වූ ඔහු සමාජයට ප්‍රකාශ කරන්නේ ආත්මාර්ථය, ඊර්ශ්‍යාව හෝ සමාජයට ඇති වෛරයයි. මන්දයත් තරඟයක් තුළින් බිහි වූ මනසකින් කෙදිනකවත් මනුෂ්‍යත්වයක් බලාපොරොත්තු විය නොහැක.

අපගේ ශාරීරික වර්ධනයෙහි ලා, අපගේ දෙමාපියන් හා වැඩිහිටියන් විසින් සිදුකරන අනුපමේය කැපකිරීමේ ණය කෙදිනක ගෙවා

නිම කිරීමට හැකි දැයි මම නොදනිමි. නමුත් අප ජීවිත කාලය පුරාවටම, විශේෂයෙන්ම තරුණ අවධිය තුළදී දකින්නට ලැබෙන කාරණය නම්, ශරීරයේ බාහිර පෙනුමෙන් පුද්ගලයන්ගේ පෞරුෂය තීරණය කරයි. මෙම තත්ත්වය අප මානව වර්ගයා තුළ දක්නට ලැබෙන ඉතාම පහත් ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැක. ශරීර ශක්තිය, ශරීරයේ පැහැය හා සමාජය විසින් දී ඇති ශරීර වටිනාකම් මත, තරුණ තරුණියන් තමන්ට ස්වභාව ධර්මයෙන් ලැබුණු ශරීරය ප්‍රතික්ෂේප කරමින් සිටී. ඒ පිළිබඳව කනස්සළු වෙමින් සිටී. උපන්දා පටන් විවිධ වූ තත්ත්වාරෝපනයන්ට භාජනය වී, තම මනස තුළ සාදාගත් රාමුව තුළින් තමාව හා අනෙකුන්ව විනිශ්චය කිරීම පුද්ගලභාවයේ ලක්ෂණයන්ය. ඒ නිසාම තමා විසින් කුමන හෝ කාරණයක් සාධාරණීයකරණය කර ජාතීන් වශයෙන් හෝ තනි තනිවම මිනිසුන් මරා දැමීම, දූෂණය කිරීම හෝ ඔවුන්ව විනාශ කිරීම සිදු කරයි. නමුත් මනුෂ්‍යත්වය නැමැති පෞරුෂය අනෙකාව විනාශ කිරීමට පුද්ගලයෙකුව කිසිම දිනක පොළඹවනු ලබන්නේ නැත.

වැදගත්ම කාරණය වන්නේ ශාරීරික හා බුද්ධිමය ජීවිතයන් වර්ධනය, අධ්‍යාත්මික ශරීරයේ වර්ධනය තුළින් සිදුවන බවයි. එසේ නොවුනහොත් සිදුවන්නේ, ත්‍රී රෝද රථයක් රෝද දෙකකින් ධාවනය කිරීමට උත්සහ කිරීමක් වැනිය. කාලාන්තරයක් මුළුල්ලේ, ආගමික සංස්ථා

හා පූජකයින් විසින් අධ්‍යාත්මික ජීවිතය හුදු චාරිත්‍ර හා සංස්කෘතික සංදර්ශන වලට පමණක් සීමා කර ඇත. අප ශාස්තෘවරුන් විසින් දේශිත අධ්‍යාත්මික ජීවිතය වන්නේ පුද්ගලභාවයන් අතහැර, ඇතුළාන්ත ජීවිතය ගතවන සෑම විටම අනුන්ව විනිස්චය නොකර, තමාගේ වරද පමණක් දැකීමයි. ජීවිතය ගතවන සෑම මොහොතකම සිහියෙන් වාසය කරමින්, මනුෂ්‍යත්වය තමන්ගේ ජීවිතය තුළින් පිළිඹිඹු කිරීමයි. මෙසේ දිවිය ගත කිරීමට පටන් ගතහොත්, මනුෂ්‍යත්වයේ බීජය අප තුළ රෝපණය වී, එය මහා වෘක්ෂයක් ලෙස වැඩෙන්නට පටන් ගනීවි. එවිට පුද්ගලභාවයන් තුළ සිරවී සිටින තරුණයා, මනුෂ්‍යත්වයේ ප්‍රතිමූර්තියක් බවට පත්වනු ඇත. මෙයින් ගම්‍ය වන කාරණය නම්, අධ්‍යාත්මික ජීවිතය සංවර්ධනය නොවී, ශාරීරික හා බුද්ධිමය ශරීර තුළින් පමණක් අපගේ මනුෂ්‍යත්වය මතුකර ගත නොහැකි බවයි. තරුණයෙකු වන ඔබටත්, ඔබගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් කරගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා දැන්ම එඩිතර වන්න, තවද අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ, ඒ අසිරිමත් බුද්ධත්වය සාක්ෂාත් කරගනු ලැබුයේ, තමන් වහන්සේගේ සියලු පුද්ගලභාවයන් සුනුවිසුණු කරමිනි. එතුමා සියලු මානවයාට, මේ උතුම් සත්‍යය ළඟාකර දුන්නේ, ජවසම්පන්න තරුණයෙකුව සිටිය අවධියේය. දස දහස්සී ලෝක ධාතුවෙහි මහා පෞරුෂය "බුද්ධ" විය.

ඔබේ පෞරුෂය සංවර්ධනය කර ගන්නා ආකාරය පාසලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ වෙනයම් පාඨමාලාවක් හදාරන විට, ඔබ ඉගෙන ගන්නට ඇති. ඔබ හොඳින් පරික්ෂා කර බැලුවහොත් ඔබට පෙනේවි. එය පුද්ගලභාවයන් වර්ධනය කර ගන්නා ආකාරය බව. "පර්සනැලිටි" යන ඉංග්‍රිසි පදය බිඳී එන්නේ, "පර්සනා" යන ලතින් වචනයෙනි. එහි අදහස වන්නේ වෙස් මුහුණු පැළඳීම යන්නයි. අපගේ තත්ත්ව සොභාවය තේරුම් නොගෙන, අප විසින් ආරූඪ කරගත් චරිත රඟපෑමක නිරත වීම පෞරුෂය නොව, පුද්ගලභාවයන් ඉස්මතු කිරීමක් බව දැන් ඔබට වැටහෙනවා ඇත. ඔබට කියා දී ඇති පරිදි, තමන්ගේ ජීවිතයට වීරයෙක් සිටිය යුතු බවත්, ඔහුව අනුගමනය කර, තමන්ගේ ජීවිතයත් ඒ ආකාරයෙන් හැඩගස්වා ගන්නා ලෙසය. ඔබ අනුගමනය කරන වීරයන් කවුරුන්ද?. මේ ලෝක ඉතිහාසය දෙස බැලුවොත් ඔබට පෙනේවී, සමාජය විසින් පිළිගනු ලබන බහුතරයක් වීරයින් තමන්ගේ පුද්ගලභාවයන් සංවර්ධනය කරගත් චරිතයන් මිස, ඉතාමත් අල්ප පිරිසක් පමණක්, තමන්ගේ අභ්‍යන්තර ගවේශනය කර, නියමවූ මනුෂ්‍යත්වය ලොවට කියාදුන් බව. අප විසින් දන්නා හෝ නොදන්නා, ජීවිතයේ සැබෑ සතුට ළඟාකරගත් අධ්‍යාත්මික ගුරුවරු ඔවුන්ය. මගේ අදහස නම් ඔබේ ජීවිතයේ වීරයන් විය යුත්තේ, එම අධ්‍යාත්මික ගුරුවරු වන ගෞතම

බුදුන්වහන්සේ, ජේසුස් වහන්සේ, නබි නායක තුමා, ශ්‍රේෂ්ඨ යෝගීවරු, ලා ඔට්සු තුමා හෝ ලෝකයේ පහල වී සිටි මුනිවරුයි. නමුත් බුදුන් වහන්සේ පවා ප්‍රකාශකර තිබෙනවා, "මාව දකින්න අවශ්‍ය නම්, මාගේ ධර්මය දකින්න කියා", එයයි, පුද්ගලභාවයක් නැති ශ්‍රේෂ්ඨ උතුමකුගේ වදන්.

අධ්‍යාත්මික ජීවිතය ගවේශණය සඳහා ජීවිතයේ යෝග්‍යම හා අවශ්‍යම කාල වකවානුව වන්නේ, තරුණ වියයි, එය ඔබට සුවිශේෂියි. ඒ සඳහා, ඔබගේ වෘත්තිය සමාජ තත්වය, පවුල් පසුබිම, ඔබගේ කුලය, ඔබගේ ආගම, ඔබගේ අතීතය හෝ වෙනත් කිසිදු සුදුසුකම් අවශ්‍ය නොවේ. එයට අවශ්‍යවන එකම සුදුසුකම ඔබ මනුෂ්‍යයෙකු වීම හා ඒ සඳහා ඔබට ඇති කැමැත්තයි. තවද තරුණයින්ගේ ජීවිතයේ ඇති සුවිශේෂි ගුණයක් වන්නේ පවතින ලෝකය, තිබෙනවාට වඩා හොඳ තැනක් කිරීමටය. තරුණයාට සමාජ අසාධාරණය වෙනුවෙන් වෙනස් කිරීමට යාම තුළය. ඔවුන් තම ජීවිතයෙන්ද වන්දි ගෙවා ඇති බව ඉතිහාසය අපට පසක් කරයි. නමුත් ලෝකය වෙනස් වී ඇතිද? එය අද වන විට තිබුණාට වඩා වෛර්‍ය, ඊර්ශ්‍යාව, තෘෂ්ණාව, ක්‍රෝධය, වේදනාව හා දුක රජ කරන පාරාදීසයක් වී ඇත. මෙයට හේතුව කුමක්ද? සිදු වූයේ ලෝකය වෙනස් කිරීමට ගිය තරුණ පරපුර සඳහා මුලින්ම තම ඇතුළාන්තයේ තිබූ පුද්ගලභාවයන් විනාශ කරගෙන මනුෂ්‍යත්වය වූ නියම

පෞරුෂත්වය දැකීමට අවශ්‍ය මඟ පෙන්වීමට ගුරුවරු නොමැති වීමයි. ඔවුන්ට මඟ පෙන්වූයේ පුද්ගලභාවයන් ඇති හිස් මිනිසුන් පිරිසකි. ඔබ නිවැරදි මාර්ගය සොයාගතහොත් ඔබගේ ඇතුලාන්තය දැක එහි ඇති පුද්ගලභාවයන් වලින් මිදී ඔබගේ තත්ත්ව ස්වභාවය මනුශ්‍යත්වය වූ පෞරුෂය ඔබ විසින්ම මතු කරගනීවි. එවිට සදාකල් සතුටින් සිටින රහස ඔබ සොයාගනු ඇත. මන්ද ජීවිතය අප තුළ අප විසින් මේ සියළු දේ කරනුයේ සතුට සඳහාය. ඔබගේ මනුෂ්‍යත්වය ඔබ විසින්ම මතක් කරගත් විට ඔබේ පවුල තුළ ඔබ සේවාවන් සපයන ආයතනය තුළ ආගමික ස්ථාන පරිසරය තුළ රට තුළ හා මුළු ලෝකයම තුළ මනුෂ්‍යකම රජකරනු ඇත. ප්‍රථමයෙන් ඔබ අභ්‍යන්තරයෙන් වෙනස් වූ විට එය ගින්නක් බවට පත් වී ලෝකයම වෙනස් කරනු ඇත. එවිට ඔබ විශ්වාස කරගෙන සිටි ඔබගේ පුද්ගලභාවය පෞරුෂය නොවන බව ප්‍රත්‍යක්ෂ කරගනු ඇත.

©
මානව ධර්මය හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

කළයුත්ත

කිසිවක් නොකර දැක දැනගැනීම.

කියවන්නා : දහම් අවබෝධය සඳහා පෘතග්ජන අප සූදානම් විය යුත්තේ කෙසේ ද? ගිහි ජීවිතයේ දහසකුත් එකක් වගකීම් දරමින් මේ සඳහා සූදානම් වීම නිරර්ථක නොවේ ද?

පිළිතුර : කිසිසේත් නැහැ. දහම් අවබෝධය සඳහා ඔබට අමුතු සූදානමක් අවශ්‍ය වන්නේ නැහැ. එසේම ඒ සඳහා ගිහි ජීවිතයෙන් හෝ එහි වගකීම් වලින් පලා යා යුතුත් නැහැ. ඇත්තෙන්ම ගිහි ජීවිතය හා එහි ඇති අනේක විධ වගකීම් මේ සඳහා වඩාත් හොඳ මෙවලම් ලෙස ඔබට යොදාගත හැකියි. බොහෝ දෙනෙක් සිතා සිටිනවා පූජ්‍ය හෝ පූජක තත්වයට පත්විය යුතුයි කියා දහම් අවබෝධය පිණිස. එය මිථ්‍යාවක්. ඒ සඳහා වනගත විය යුතුත් නෑ. හිසේ ඇති කෙස්, අඳින ඇඳුම හෝ දවස පටන් ගන්නා ආහාර වේල් ගණන් වැනි සාධක ඒ සඳහා බාධාවන් වන්නේ ද නෑ.

කියවන්නා : ඔබ සියලුම පැවිදි උතුමන් හා පුජකතුමන් උපහාසයට ලක් කරනවා ද?

පිළිතුර : නැහැ. කිසිවිටෙක ඒ උතුමන් අප උපහාසයට ලක් කරන්නේ නැහැ. ඇත්තෙන්ම ශ්‍රමණ ව්‍රත සම්පූර්ණ කරන උන්වහන්සේලා ගිහියන් වන අපට වඩා ශ්‍රේෂ්ඨයි. ඔවුන්ගේ කැපවීමට අප වන්දනා කරනවා ගෞරවයෙන්. අප පැවසු දෙය හොඳින් වටහා ගන්න. පැවිදි හෝ පූජක භාවය පරාර්ථ චර්යාව වඩාත් පුළුල්ව කරගෙන යාමට වැඩි කාලයක් කැප කිරීමට හැකියාව නිසා ඉතා වැදගත්. පූජ්‍ය හෝ පූජක බව ධර්මාවබෝධයට අනිවාර්යෙන් සපිරිය යුතු අංගයක් නොවේ. නමුත් අප පවසන්නේ මග පල නිවන් සඳහා ආර්ය මහා සංඝරත්නයට ඇතුළු වීමට ගිහි තත්ත්වය කිසිදු බාධාවක් නොවන බවයි.

©

කියවන්නා : ඔබ එය තිර ලෙස පවසන්නේ කෙසේ ද?

මානව ධර්ම හා ආධ්‍යාත්මක විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

පිළිතුර : අප එය පවසන්නේ හේතු රාශියක් ඇතිව නමුත් ඔබට බෞද්ධ ඉතිහාසයේ සරල උදාහරණයකින් එය පහදන්නම්. ඔබ දන්නවා ද බුදු සසුනේ අග්‍ර මහා උපාසිකාව වන විශාඛාවන් ? ඇය සෝතාපන්න (සෝවාන්) යන පළමු මාර්ග ඵලයට එළඹියේ වයස අවරුදු 07 දී බව සඳහන්. නමුදු ඇය තුරුණු වියේ දී විවාහ වනවා. දරුවන් ලබනවා. සිටු සැප විඳිමින්, මේල පලඳනා පළඳිමින් භෞතිකය පරිහරණය කරනවා. ස්වාමියා අන්‍යාගමිකයෙක් නමුත් ධර්මාවබෝධයට මේ කිසිවක් බාධා වන්නේ නෑ.

සෝතාපත්න විශාඛාවන් සෝතාපත්න වූ පසුත් ලෝකය පරිහරණය කළා නම්, තවමත් මග පල නොලැබූ අපට දහම් මඟට පිවිසීමට ගිහි ජීවිතය හා ලෝකය පරිහරණය බාධාවක් වන්නේ කෙසේ ද?

කියවන්නා : නමුත් බොහෝ දෙනා ධර්මානුකූල කටයුතු වලට යොමු වීමට වගකීම් බාධාවක් ලෙස පවසමින් ඒ සඳහා ජීවිතයේ සැදෑ සමය වන තෙක් බලා සිටිනවා නේද ?

පිළිතුර : ඇත්තෙන්ම.... එය ඉතා ශෝචනීය තත්ත්වයක්. වැරදි අවබෝධයක් නිසා සිදුව ඇති දෙයක්. දහම් අවබෝධය සඳහා මනා සිහි නුවණක් ඇවසිමයි. ගත සිත දුබලව වාරු නොමැතිව ජවය ශක්තිය සිඳී යන සැදෑ සමය දහම් අවබෝධයට සුදුසු කාලය නොවේ. දහම් අවබෝධය සඳහා වීර්යය වැඩීම කළ යුත්තේ සවිබල ඇති සමයේමයි. එසේම වගකීම් බාධාවක් වන්නේද නැහැ. වගකීම් හා කාර්ය බහුලත්වය බාධාවන් වන්නේ ඒ සඳහා අප අනුගමනය කරන ක්‍රමවේද වල ඇති වරදක් නිසා විය යුතුයි. දහම් අවබෝධය සඳහා වැදගත් වන කාරණා ගිහි - පැවිදි ඕනෑම පුද්ගලයෙකු තුළ සෑම මොහොතකම අත් විඳිය හැකියි.

කියවන්නා : දහම් අවබෝධය සඳහා වැදගත් වන කාරණා. ඒ මොනවා ද?

පිළිතුර : ඔව්. දහම් අවබෝධය සිදු වන්නේ බාහිර ලෝකයේ ඇති කිසිදු භෞතිකයක් හෝ පුද්ගලයෙක් වන්දනාමාන කිරීමෙන් යැයි සිතීම තරම් මුළාවක් තවත් නෑ. දහම් අවබෝධය කළ හැක්කේ තමාගේම ගැඹුරු ආධ්‍යාත්මය තුළට පිවිසීමෙන් පමණයි. දහම තමා තුළට පමුණුවාගෙන තමා තුළින්ම දැකීම එන දහම ඕපනයික කර ගැනීම එය අවබෝධයට ඇති එකම මාර්ගයයි. මේ සඳහා වැදගත් වන්නේ කාරණා 04 ක්... ඒ තමාගේ සිරුර, වේදනාව, සිතුවිලි හා ධර්මතා යන සතරයි. මේ කරුණු සතර ගිහි පැවිදි ජාති, කුල මල ආගම් පංති භේදයක් නොමැතිව ඕනෑම අයෙකු තුළ අනිවාර්‍යයෙන් පවතිනවා. ඉතින් මේ කාරණා සතර දෙස නිගමන වලින් තොරව අවසාන ප්‍රත්‍යක්ෂය තෙක් එළඹ සිටින සිහියෙන් බලා සිටීමට දහම අවබෝධයට ප්‍රමාණවත්.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ

කියවන්නා : ඔබ පවසන මේ කාරණා සතර දෙස සතිමත්ව බලා සිටීමක් ගැන බුදුන් වහන්සේගේ දේශනාවේ සඳහන්ද? නැත්නම් එය ඔබේ පෞද්ගලික අදහසක් ද?

පිළිතුර : ඔබ මෙන්ම බොහෝ දෙනෙක් මෙසේ සරලව දහම පැහැදිලි කළ විට පිළිගන්නට මැළිවෙනවා. සංකීර්ණ ගැඹුරු නොතේරෙන පාලි භාෂාවේ වචන භාවිතා නොකළ විට.. බුදුන් වහන්සේ සතර සතිපට්ඨානය

ලෙස හැඳින්වුයේ මේ කාරණා සතර තමයි. සිරුර ගැන අවබෝධයෙන් සතිමත්ව විදර්ශනා කිරීම ''කායානුපස්සනාව'', වේදනාව ගැන සතිමත්ව විදර්ශනාව ''වේදනානුපස්සනාව'' එසේම සිත පිළිබඳව "චිත්තානුපස්සනාව" හා ධර්මතා පිළිබඳව ''ධම්මානුපස්සනාව'' යනාදී වශයෙන් දැන් ඔබට පැහැදිලිද මෙය බුද්ධ දේශනාව බව.

කියවන්නා : පැහැදිලියි. දැන් මට මතු වන ප්‍රශ්නය නම් ඔබ පවසන ආකාරයට මේ කාරණා සතර ඕනෑම පුද්ගලයෙකු තුළ පවතින නමුත්, බොහෝ දෙනෙකු දහම් අවබෝධය තවමත් අසීරු කාර්යයක් ලෙස සලකන්නේ ඇයි?

©

පිළිතුර : එය තේරුම් ගැනීමට අසීරු කාරණයක් නොවේ. ඊට හේතු වන්නේ මේ කය, වේදනාව සිතුවිලි හා ධර්මතා ගැන සතිමත්ව විදර්ශනා කිරීමට බාධාකාරී වන, එනම් නිවන් මග අවුරන ''නීවරණ'' ධර්ම පහක් ඇත. ඒවා නම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන - මිද්ධ, උද්ධච්ච කුක්කුච්ඡ හා විචිකිච්ඡා යන පහයි. මේවා සැබැවින්ම අකුසල් ලෙසද හඳුන්වා දිය හැකියි.ආර්ය ගවේෂණය සඳහා සතර පතිට්ඨානය වඩන පුද්ගලයෙක් තුළ මේ නීවරණ ක්‍රියාත්මක වීමෙන් නිවන් මඟට බාධා වෙනවා. මේ නීවරණ වලින් මිදීම කුසල් සම්පාදනය එනම් ''කුසලස්ස උපසම්පදා'' ලෙස හඳුන්වනවා. එයට වීර්යය අවශ්‍යයයි. බොහෝ දෙනෙකුට නැත්තේ ද එයයි.

කියවන්නා : කුසල් සහ පින් යනු එකම දෙයක් ද? නැතහොත් වෙනස් කාරණා දෙකක් ද?

පිළිතුර : කුසල් හා පින් යනු සම්පූර්ණයෙන්ම වෙනස් කාරණා දෙකක්. කුසල් යනු ඉහතින් අප සඳහන් කළ පංච නීවරණ වලින් මිදීම සහ බෝජ්ජංග වැඩීමයි. කුසල් වැඩීම ඍජුවම නිවන් මඟට හේතු වෙනවා. නමුත් පින් රැස්කිරීම සසර මඟ දික් කර ගැනීමට හේතුවක් වෙනවා. පින් රැස් කරන්නේද අවිද්‍යාව නිසාමයි. අවිජ්ජා පච්චයා සංඛාරා - අවිද්‍යාව හේතුවෙන් සංස්කාර ධර්ම හටගන්නවා. එසේ හටගන්නා සංස්කාරයන්ගෙන් එක් වර්ගයක් තමයි පින්. (පුණ්‍යාභි සංස්කාර)

කියවන්නා : ඔබ පින් රැස් කිරීම වරදක් ලෙසද දකින්නේ ?

පිළිතුර : නෑ. අප පින් රැස් කිරීම වරදක් ලෙස දකින්නේ නෑ. නමුත් පින් රැස්කිරීම, භව බන්ධනය තුළින් නිර්වාණ අවබෝධයට ඉවහල් වන්නේ කුසල් වැඩීම හා අකුසල් දුරු කිරීම පමණයි. නමුත් නිවන් අවබෝධය සඳහා යමෙකුට කුසල් වැඩීම අසීරු නම්, නීවරණ හෙවත් අකුසල් දුරුකිරීමට වීර්යය වැඩීම කිරීම අපහසු නම්, එවන් අයට සතර අපායෙන් මිදී ඝෝර වූත් කටුක වූත් මේ සසර ගමනේ තාවකාලික සුවයක්, සැපයක් විඳීමට එනම් දෙව්, බඹ හෝ මිනිස් ලොව සැප විඳීමට මේ පින් රැස් කිරීම වරදක් නොවේ. නමුදු අප වෑයම් කළ යුත්තේ සසර ගමන නිමා කිරීමට බව අමතක කරන්න එපා. දෙව් මිනිස් සැප කෙලවර අමා මහ නිවන ගැන සිතීම අපරාධයක්.

කියවන්නා : ඔබගේ මෙම පැහැදිලි කිරීම අනුව සතර සතිපට්ඨානය වැඩීමට සාමාන්‍ය ජීවිතයේ කටයුතු අතරදීත් හැකියාව පවතිනවා. එහෙම නේ ද?

පිළිතුර : පැහැදිලිවමම. ඔබට දෛනිකව සිදුකරන සෑම ක්‍රියාවක්ම සතිමත්ව සිදුකරන විට, ඔබගේ සිරුර ගැන එහි ක්‍රියාකාරීත්වය ගැන සතිමත්ව සිටින විට සිතිවිලි, වේදනාව හා ධර්මතා ගැන සතිමත්ව නිගමන වලින් තොරව විදර්ශනා කරන විට ඔබ යථාභූත ඥාණ දර්ශණයට පත්වෙනවා. ඒ සමඟම ඉන්ද්‍රිය සංවර ශීලය නිසඟයෙන්ම ඔබ තුළ පිහිටනවා. එවිට ඔබට සුදු වත් හැඳ, ආයාසයෙන් කය, වචනය සංවර කරගෙන ශීලය රඟපෑම් කිරීමේ අවශ්‍යතාවක් නොමැති වනවා. ඔබ දහම් මාර්ගයට නිසඟයෙන්ම ප්‍රවේශ වනවා ඔබටත් නොදැනීම.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

කියවන්නා : නිවන් මඟ මෙතරම් පහසු නම් වර්තමාන මිනිසුන් විවිධ ආගමික ක්‍රියාවන්හි යෙදෙන්නේ ඇයි?

පිළිතුර : නොදැනුවත් කම සහ එවැනි නොදැනුවත් ආගමික අනුගාමිකයන්ගේ පෙළඹවීම. බොහෝ ආගමික නායක පූජ්‍ය පූජක දෙපක්ෂයම නොදන්නා කම හෝ තමන්ගේ පැවැත්ම උදෙසා ආගමික සංස්කෘතික ක්‍රියාකාරකම් දහම් මාර්ගය ලෙස පෙන්වා දෙනවා. එම මිථ්‍යාවේ ඇලී ගැලී අනුගාමිකයන් බාහිරින් ඇති භෞතියකන් එනම් පිළිම, සුරුවම්, ඉදිකිරීම් ආදියට නමුත් නිවන /නිවීම ඇත්තේ තමා තුළම ඔබ ඔවුන් දන්නේ නෑ. එය අනුකම්පා කළ

යුතු තත්ත්වයක්. නිවන ඉලක්ක කරගෙන සිදුකරන අභ්‍යන්තරික නොවන සියළු බාහිර පුද පූජාවක් පිළිවෙත් අයත් වන්නේ සීලබ්බත පරාමාසයට.

කියවන්නා : ඔබ පවසන්නේ නිවන සාක්ෂාත් කර ගැනීමට කුමක් කළ යුතු ද?

පිළිතුර : ඔබ කිසිවක් කරන්නට එපා. ඔබ නිගමන වලින් තොරව සියළු දේ දෙස බලා සිටින්න. කය, සිතුවිලි, වේදනාව හා ධර්මතා යන කරුණු සතර හැරෙන්නට වෙන කිසිවක් ජීවිතයේ නෑ. ඒ දෙස සතිමත්ව බලාසිටින විට ඒවා තමන් නොවන බව ඔබට පසක් වේවි. ධාතු මනසිකාරයෙන් විභජ්ජවාදීව යෝනිසෝමනසිකාර කරන විට සක්කාය දිට්ඨියෙන් ඔබ මිදේවි. එවිට දහම ගැන ඔබට කිසිදු සැකයක් නොමැතිව විචිකිච්ඡාවෙන් ඔබ නිදහස් වේවි. මේ දෙකෙන් මිදුණු කළ කුමට විමුක්තිය පතා විවිධාකාර වෘත අනුගමනය කරන්න ද? ඔබ සීලබ්බත පරාමාසයෙන් ද මිදේවි. මේ තුනෙන් මිදීම යනු පළමු මාර්ගඵලය වන සෝතාපන්න බව ඇසීම කෙතරම් භාග්‍යවන්ත ද? මේ නිවන් මග නොවේද?

නෙක්ඛම්මය

ඔබ අතහැරිය යුත්තේ මොනවාද? එය කළ යුත්තේ කෙසේද?

වර්තමානයේ තරමක ප්‍රබෝධයක් හා සත්‍යයාවබෝධයක සුභ නිමිති පහළ වී තිබෙනු දැකිය හැකි වුවද, ඇතැම් බොහොමයක් පුද්ගලයන්ගේ මතය සම්බුදු පියාණන් දෙසූ ලෝක දහම දුක, කළකිරීම මත පවතින සෘණාත්මක වූ දහමක් ලෙස වීම අභාග්‍යයට කරුණකි. එමෙන්ම විවිධ සාකච්ඡා වලදී අප අත්විඳින අත්දැකීම් වන්නේ ධර්මාවබෝධය හා මාර්ගඵල නිවන් කරා යෑම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන බවත්ය. එසේ සියල්ල හැරගොස් ආත්ම ගණනක මහා වෑයමක් අවසානයේ දෙව්මිනිස් සැප කෙළවර ලබාගත හැකි සැපතක් වන නිවන් සැප (අවකාශයේ උතුම් සම්බෝධිය) සාක්ෂාත් කර ගැනීම මේ භවයේ දී නම් කළ නොහැකි, බුදුන් වහන්සේ කෙනෙකුගේ බණ අසා පමණක් කළ යුතු ඉතා අසීරු කර්තව්‍යයක් බවයි. මෙසේ ඉතා ප්‍රායෝගික මෙන්ම පහසුවෙන් අවබෝධ කළ හැකි දහමක් ලෙසින් සම්බුදු පියාණන් දේශනා කළ දහම, එම දේශනා වල වචනාර්ථ පටු වාසි තකා වර්තමානයේ ඇතැම් භික්ෂූන් හා වෙනත් පිරිස් වෙනස් කොට වෙනස් සංකල්ප බවට පත් කරමින් දේශනා කිරීම නිසා ප්‍රායෝගික නොවූවත්, ඉතා අසීරු යැයි හැඟෙන ඉලක්කයක් අනියත වූත්

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

දහමක් බවට පත්කොට තිබීම කොතරම් අභාග්‍යක් ද? එවන් වෙනස් කළ සංකල්පයක් වූ නෙක්ඛම්මය "නික්ම යෑම" හඳුන්වා දීම අපගේ මෙම ලිපියේ අරමුණ වේ.

නෙක්ඛම්මය යන වචනය ඇසූ පමණින්ම ඔබ සතු සියල්ල හැර දමා වනයකට හෝ යම් හුදකලා හිස් තැනකට පිටත් විය යුතු යැයි හැඟීමක් ඔබ සිතේ උපදින බව මම දනිමි. එය පුදුමයට කරුණක් නොවන්නේ ඉහතින් පැහැදිලි කළ පරිදි සම්බුදු පියාණන් දෙසූ දහම විකෘති කළවුන් අපට උගන්වා ඇත්තේ එසේ වීමයි. නමුත් මෙහිදී මම ඔබට අවධාරණය කරමි. නෙක්ඛම්මය යනු "පරිහරණයෙන් බැහැර වීම" නම් නොවේ.

එසේ නම් නෙක්ඛම්මය යනු කුමක්ද? ඔබ අතහැරිය යුත්තේ මොනවාද? එය කළ යුත්තේ කෙසේද? මගේ වෑයම වන්නේ මේ දෙස නිවැරදි දෘෂ්ටියකින් හා වෙනත් කෝණයකින් බැලීමට ඔබව පෙළඹවීමයි. මෙය මීට පෙර කිසි දිනක ඔබ නොදුටු කෝණයක් විය හැකිය. කිසිවෙකුගෙන් නෑසූ ආකාරයේ සංකල්පයක් විය හැකිය. එහෙත් සියලු ශාස්තෘවරුන් දෙසූ සත්‍යය දහමක් වේ නම් එය ප්‍රායෝගික හා යථාර්ථවාදී අවසන් ප්‍රත්‍යක්ෂයක් සහිත විය යුතුය. එසේ නම් අත් නොහැරිය යුතුද?

සම්බුදු හිමියන් ප්‍රමුඛ සියලු ශාස්තෘවරුන් දෙසූ අයුරින්ම "අත්හැරීම" කළ යුතු යැයි මමද ඔබට පළමු කොටම යෝජනා කරමි. නමුත් ඔබ අත්හල

යුත්තේ ඔබ වටා ගොඩනැඟී ඇති භෞතිකය "පරිහරණය" කිරීම නොවේ. ඔබ වටා ඇති භෞතිකය පරිහරණය නැවැත්වුවහොත් ඔබ ජරා, අපවිත්‍ර අප්‍රිය සහගත නිඝන්ඨ යාචකයෙක් සහ උන්මන්තකයෙක් බවට පත්වීම වැළැක්විය නොහැකිය. එසේ නම් ඔබ අත්හල යුත්තේ පරිහරණය නොව "ලෝකය" ලෙස ඔබ භාවිතා කරන විවිධ සංකල්ප මත ගොඩනැගුනා වූ දෘෂ්ඨී නානාත්වයයි. මේ දෘෂ්ඨී නානාත්වය නොදැකීමට නම් ඔබ බාහිර ලෝකයේ ඇති ද්‍රව්‍ය පුද්ගල හා සිද්ධි වල සංඛාර වීම පිළිබඳ සහ නාම-රූප ධර්මතා පිළිබඳව දැකීමට දෘෂ්ඨිය දියුණු කළ යුතු වේ. එසේ උපන් තැනටම ගොස් විමසා බැලීම "යෝනිසෝමනසික"කිරීම නම් වේ. යථාභූත ඥාන දර්ශනය ඔබ තුළ ඇති වනු ඇත.

©

තවත් කෝණයකින් බලන විට ඔබ කය පමණක් අවදි කරවාගෙන ජීවත් වන්නෙක් යැයි මම යෝජනා කරමි. මෝහයෙන් මත් වූ සිත තවමත් අවදි වී නැත. ඔබේ සිත අතීතයෙන් එන දුකක් අනාගතයෙන් එන බියත් සමඟ නිරන්තරයෙන් පොරබදමින් වර්තමානයේ මේ මොහොතට අවදි නොවී මායාවක් තුළ නිද්‍රෝපගතව පවතී. සැබැවින්ම ඔබ අතහැරිය යුත්තේ මේ අතීතය සහ අනාගතයයි තමා තුළ මේ මොහොතට අවදි වීම යනු කායගතා සතියයි.

තමා තුළ මේ මොහොතට අවදිවීමත් සමඟ ඔබට අතීතය ද

අනාගතය ද ඒ තුළ සකස් වී ඇති භවය ද අත හැරෙනු ඇත. ලෝකයේ ද්‍රව්‍ය, පුද්ගල, සිද්ධි වල දෘෂ්ඨී නානාත්වයෙන් මිදෙන විට ජාතික, ආගමික, දේශපාලනික, සංස්කෘතික සංකල්ප වල ග්‍රහණයෙන් එනම් වහල් භාවයෙන් මිදී සැබෑ නිදහස් සුවය ඔබට දැනෙනු ඇති.

නෙක්ඛම්මයේ ඊළඟ පියවර වන්නේ ශරීරය, සිත, වේදනාව (මිදීම) සහ නානාවිධ ධර්මතා (ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, ප්‍රීතිය වැනි) ඔබ ලෙස හඳුනාගෙන කටයුතු කිරීමෙන් මිදීමයි. ශරීරය යනු ඔබ නොවන බවට අවබෝධ වුවහොත් නෙක්ඛම්මය තුළ ඔබ පූර්ණත්වයට පත් වනු ඇති. බුදුන් වහන්සේ දෙසූ සතර සතිපට්ඨානය මෙයයි. මෙකී පූර්ණත්වය වර්තමානය ද මුළු සසර ගමන ද මෙතෙක් සොයා ගැනීමට අසීරු වූ සතුට අත්විඳින ශුද්ධ අවකාශයේ උතුම් සම්බෝධියට ඔබ පත්වනු ඇති.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

නිවීම

මුළාවේ කඩතිර ඉරී මතුවන සදාකාලික සැනසීම

ඇවිදිමින් තැන තැන නොදැන හරිමඟ
හරිමින් විඩා ගත සිත
යුහුසුළුය දිගු භව සැරිය ....
සොයමින් ප්‍රීතිය..... ආශාව නොසිඳුනු
රැස්කළෙමි යමක්.... අවසන ශෝකය ......
හඳුනා ගතිමි සත්‍යයය ......
දුකම බව - භව ගමන
හමුවිය ජීවිතය ....
සරලය .... සෘජුය ....
නැත වංක බව
දිළිඳුය හදවත ... නිසලය සිතුවිලි ජලාශය ....
නමුත් ඇත සතුට පිරී උතුරන
නිරුවත්ව ඇත අද
රැවටුන මමත්වය - ඇරඹුමයි අරමුණක
නිවෙන්නට අනන්තය තුළ

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

මනුෂ්‍යත්වය හා අධ්‍යාපනය

සැනසිලි සහගත මනුෂ්‍යයෙක් නිර්මාණය කරා යොමුවිය යුතු අධ්‍යාපනය

නූතන ජන සමාජය ආරම්භ වන්නේ මිනිසෙකු ගෙනි. නමුත් වර්තමාන ජන සමාජය මිනිසුන් නොවන පුද්ගලයින්ගෙන් ගොඩනැගී ඇත. විවිධ පුද්ගලයින් දැකගත හැකි අතර ඔවුන්ගේ පුද්ගල භාවය විසින් මනුෂ්‍යත්වය වසාගෙන ඇත. මිනිසෙකු නොවන පුද්ගලයෙකුට කිසි දිනක නිවන් අවබෝධ කළ නොහැක. නිවන් අවබෝධයට ප්‍රථම තමා ඇතුළු සියලු පුද්ගලයන් විනිවිද මනුෂ්‍යත්වය දැකගත යුතුය. පුද්ගල භාවය ගොඩනැගී ඇත්තේ මනුෂ්‍යයත්වය මත ඇලවුනු ලේබල් කන්දරාවකිනි. සමහර ලේබල් සමාජය විසින් අප මත අලවා ඇති අතර අප විසින් අලවා ගත් ඒවාද දැකගත හැක.

සත්‍යය දැන දැකගත් පසුව සත්‍යය ගරුකව ජීවත්වීමේදී මෙම මනෝමය ලේබල් එකින් එක ගැලවී යනු ඇත. සත්‍යය දැකීම සහ සත්‍යය ගරුකව ජීවත්වීම යනු සියල්ල සෑදී ඇති සතර මහා ධාතුව යෝනිසෝ මනසිකාර කිරීමයි. සමාජගත විධි ක්‍රම තුළ මානව හිතකාමී කිසිවක් මෙම යුගයේ සිදුනොවනු ඇත.

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

පාලකයින් විසින් ගොඩනැගිය යුත්තේ දේශයක් නොව සිතකි. පාලනය කළ යුත්තේ රටක් නොව සිතකි. රැකිය යුත්තේ ආගමක් නොව සිතකි. සිත හදන වැඩපිළිවෙල බද්ධ විය යුත්තේ රටක අධ්‍යාපනයටය. අධ්‍යාපනය යනු ලෝකය පිළිබඳ කරුණු වලින් ඉහමොළ පිරවීම පමණක් නොවන්නේය. අධ්‍යාපනයෙහි කෙළවර සැනසීම විය යුතුය. ජීවන නිපුණතා සමඟ සැනසීමෙන් ජීවත්වන ජන සමාජයක් දකින්නට නම් අධ්‍යාපනය ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිවන විප්ලවීය වෙනසකට බඳුන්විය යුතුය. ආධ්‍යාත්මයෙන් තොර දැනුමෙහි වර්ධනය ජන සමාජය තුළ විනාශකාරී බලවේග නිර්මාණය කරයි. කෙළවර සැනසීම නොමැති අධ්‍යාපනයකින් මිනිසාට කුමන ප්‍රයෝජනයක්ද?

මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ

විවිධ විෂයයන් පිළිබඳ ඉගෙනීම ජීවත් වීම පහසු කරවීමට , රැකියාවක් කිරීමට හෝ ලෝකයේ යහපත පිණිස භාවිතා කිරීමට හැකි බව ඇත්තකි. එම දැනුමම අයහපත පිණිසද භාවිතා නොවනවා නොවේ. ප්‍රාථමික, ද්විතියික හා උසස් ලෙස අධ්‍යාපනය ලබන සියල්ලන් තුළම තමන් ලද අධ්‍යාපනය හේතු කොට මනුෂ්‍යත්වය නොඑසේ නම් මානව හිතවාදී බව ඉහළ නැංවෙනවාද යන්න ප්‍රශ්නාර්ථයකි. එසේ වනවා නම් විවිධ උසස් රැකියා නිලතල දරන්නන් වෘත්තිකයින් සැවොම උසස් මානව ධර්ම හෝ

ආධ්‍යාත්මික ගුණ වගාව තුළින් පෝෂණය වූ සැබෑ මිනිසුන් ලෙස අපට සමාජයේ බොහෝ හමු වනු ඇත. එසේ නම් ඔවුන් විසින් නිරන්තරයෙන් මානව සමාජීය යහපත් ආකල්ප හා සාරධර්ම වලින් පෝෂණය කරනු ඇත.

එහෙත් සාක්ෂරතාවයෙන් ඉහළ තැනක සිටින අප රට එකිනෙකාගේ හැඟීම්, ගැටළු, දුක, සතුට, ප්‍රාර්ථනා තේරුම් ගැනීමට හෝ බෙදා හදා ගැනීමට හැකි තරම් වන මට්ටමක බොහෝ පිරිස් නොසිටීම කණගාටුවට කරුණකි.

වර්තමාන අධ්‍යාපනය තුළ ඇති තරඟකාරීත්වය මත ආත්මාර්ථකාමීත්වයට සහ තරඟයට පෙළඹෙන දරුවන් අධ්‍යාපනය හමාර කර සමාජගත වීම තුළද, ආත්මාර්ථයෙන් මිදීමට නොහැකිවන පුද්ගලයාගෙන් ජන සමාජයට,හෝ පොදු ලෝකයට සාධාරණයක් හෝ යහපතක් බලාපොරොත්තු විය නොහැකිය. එනිසාම දැනුම කොපමණ තිබුණද තම ආධ්‍යාත්මික සංවර්ධනය නොමැතිකම තමන් විසින් තමන්වම මුළාවට පත් කර ගනිමින් තමන්ගේ ආත්මීය පරිහානිය සිදුවීම තමන්ටම නොදැනෙයි.

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

වර්තමාන ගුරු පරපුරෙහි හා දෙමාපියන්ගේද ජීවන රටා මත පැටළුණ අධික කාර්ය බහුලත්වයක් වෙයි. එමඟින් ඇති වන

අනවශ්‍ය(අත්‍යවශ්‍ය නොවන) සීමා රහිත කලබලය මගින් ඔවුන්ගේ සිත්වල කිසිදු සැනසීමක් නොමැති බව දක්නට ලැබෙයි. මෙවන් වටපිටාවක් මත අධ්‍යාපනය ලබන දරුවන්ගේ සිත් වලට සැනසීම, මානව දයාව, මානව හිතවාදීකම, සමානාත්මතාව කාන්දු කිරීමට තරම් කෙනෙක් දරුවන්ට හිමිව නැත.

දරුවන්ට ඔවුන්ගේ සිත් තුළ ඇති හැඟීම් හඳුනාගැනීමට, එකිනෙකාට ආදරය කිරීමට කියා දෙන්නට තරම් කෙනෙක් නැත. පාසලට හෝ රටට ආදරය කිරීමට පොළඹවන්නට කෙනෙක් නැත. ජීවිතය ගැන කියා දෙන්නට ජීවිතයේ ඇතිවන ගැටළු වලට පිළිතුරු කියා දෙන්නට, ගැටළු වලට ඔරොත්තු දෙන්නට කියා දෙන්නට කෙනෙක් නැත. අධ්‍යාපනය තුළ ක්‍රම වේදයක්ද නැත. මෙවැනි තත්ත්ව නිසාම දරුවන් මෙන්ම අධ්‍යාපනය හමාර කළ බොහෝමයක් පිරිස් සැනසිල්ලකින් තොරව ජීවත්වීම ඛේදවාචකයකි. එනිසාම අධ්‍යාපනය යම් තරමකින් හෝ මනුෂ්‍යත්වය ඔසොවා තබන සැනසිල්ල උදා කරන ක්‍රමවේදයකට වේ නම් යහපතකි.

උපතින්ම දරුවන් ආධ්‍යාත්මිකව සැනසිල්ලේ පසුවෙයි. ලෝකයක පරිහරණය තුළ වෙහෙසට පත් දෙමාපියන් සහ ගුරුවරුන්ගේ අනුදැනුම තුළ කරන්නා වූ අධ්‍යාපනයටද යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස කාලයාගේ

© මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ඇවෑමෙන් සැනසිල්ලක් නොමැති පුද්ගලයෙකු ලෙස සමාජගත වැඩ යන්ත්‍රය හා එකතු වෙයි. ඉන් තමාද අන් අයද පීඩාවට පත්වන්නේ විසඳුම් රහිත ප්‍රශ්න තුළ දැවෙමින් තමාටද සමාජයටද හානිකර ප්‍රතිඵල උදාකරමිනි.

ජීවන අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම සඳහා පමණක්ම බාහිර ලෝකය භාවිතා කරමින් සහ සතුට සොයා ගැනීම සඳහා තමාගේ අභ්‍යන්තර ආධ්‍යාත්මය භාවිතා කරන අධ්‍යාපනයකින් සතුටින් ජීවත් වන මිනිසුන්ගෙන් පිරුණ ශිෂ්ඨාචාරයක් බිහිවනු ඇත.

මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

සම්මා දිට්ඨි

සෑම දැක්මකින්ම විදුනු කළ ඉතිරිවන්නේ නිවැරදි දැක්මයි.

ඔබ යනු කවරෙක්ද? ඔබ ජීවත්වන ලෝකය යනු කුමක්ද? ඔබ ජීවත්වනවා යනුවෙන් හැඟෙන්නේ කුමක්ද? මෙම කරුණු පිළිබඳව ඔබ අවබෝධයෙන් පසුවන්නේද? මෙම කරුණු පිළිබඳව ඔබ දකින්නේ කෙසේද? එය ඔබගේ දැක්මයි. ඔබගේ දෘෂ්ටියයි.

මෙම ලෝකය තුළ ඔබ මානසික තලයේ එනම් එදිනෙදා ජීවත්වීමේදී වුවත් ගැඹුරු ආධ්‍යාත්මික විමර්ශනයන්හි නිරතවන විට වුවත්, ඔබව මෙහෙය වෙන්නේ ඔබ ඇතිකරගෙන ඇති ඔබගේ දෘෂ්ටිය මතයි. ඔබගේ ක්‍රියාකාරකම් ඔබ බැසගෙන ඇති දෘෂ්ටියට අනුවම සිද්ධ වේ.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ

දෘෂ්ටියත් සමගම සහසම්බන්ධවන අනෙකුත් වැදගත් දෙය නම් සංකල්පයයි. ඔබ ගන්නා ඕනෑම අරමුණක් සිතෙහි ප්‍රකට වනුයේ සංකල්පයක් ලෙසිනි. යම් රූපයක් ඇස ගැටුණු විට එය ලස්සනද, අවලස්සනද, ලස්සනත් නැති අවලස්සනත් නැති දෙයක් දැයි ආදී වශයෙන් සංකල්පයන් ඔබ සිතෙහි ජනිතවී එම රූපය කෙරෙහි දෘෂ්ටියක් ඔබ තුළ පහල කරවයි. ඉන්පසු ඔබ එම රූපය දකින සෑම විටම ඔබ එම රූපය දකිනුයේ පෙර කී දෘෂ්ටියත් සමගමය. එම දෘෂ්ටිය එකිනෙකට සාපේක්ෂ

වෙයි. එකම වස්තුවක් පුද්ගලයන් දෙදෙනෙකු දකින විට ඔවුන්ට එම වස්තුව කෙරෙහි පහල වන සංකල්ප හා දෘෂ්ටිය දෙකක් විය හැක ඔවුන් දෙදෙනා එම වස්තුව කෙරෙහි ක්‍රියාකරන්නේ තම තමන්ගේ දෘෂ්ටියට අනුකූලව විවිධ අයුරිනි. එනම් පුද්ගලයින්ගේ ක්‍රියාවන්ට ඔවුන්ගේ දෘෂ්ටිය සෘජුවම බලපායි. ක්‍රියාව පෞද්ගලිකත්වයෙන් තොරය. .... අවිහිංසකය..... නිර්ව්‍යාජය .... අසීමිතය. නමුත් එම ක්‍රියාව තමාගේ කරගනුයේත්.... සීමිත කරනුයේත් ..... ප්‍රචණ්ඩ කරනුයේත්..... ව්‍යාජකරනුයේත් පුද්ගලයාගේ දෘෂ්ටියයි. එහෙයින් වඩාත්ම වැදගත් වනුයේ ක්‍රියාව නොව දෘෂ්ටියයි..... දැක්මයි.

ගැටළුව පැනනඟිනුයේ එතැනිනි. එනම් තම තමන්ගේ දෘෂ්ටිය කෙතරම් නිවැරදිද නැතහොත් සාවද්‍යද යනුයි. යමෙකුගේ දෘෂ්ටිය සාවද්‍යයි නම් ඔහුගේ සියලු ක්‍රියා මෙන්ම සමස්ත ක්‍රියා පිළිවෙතම වැරදි සහගත වන්නේය. ඔහුගේ මුළු ජීවිතයම වැරදි සහගත වන්නේය.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

ලෝකයේ යථා ස්වභාවය ඇති සැටිය නොදන්නා කමින් පුද්ගලයන් මමෙකු ඇත. මගෙන් පරිබාහිර වූ ලෝකයක් ඇත යනුවෙන් පනවාගෙන, එම දෘෂ්ටිය සහිතව, එම ලෝකය තම වසඟයේ පැවැත්වීමට නිරන්තර නොනවතින අරගලයක යෙදෙමින්, එය ව්‍යවර්ථ වීමෙන් දුකට පත්වෙති.

නොදන්නාකම නිසාම වැරදි දෘෂ්ටියකට පත්වී සිටින මිනිසා එයින් මිදීගත නොහැකිව එම දෘෂ්ඨිය මතම පිහිටා නැවත නැවතත් විවිධ අරමුණු ඔස්සේ සංකල්ප බිහිකරමින් මමත්වයම පෝෂණය කරමින් සිටී. මගේ යැයි කියමින් ලොවට අයිතිවාසිකම් කියමින් සිටී.

එසේ නම් නිවැරදි දැක්ම කුමක්ද? සම්මා දිට්ඨියට පත්වන්නේ කෙසේද? එහිදී අපට පිහිටවනුයේ ශාස්තෘන්වහන්සේය. උන් වහන්සේ විසින් දේශිත සත්‍යය ධර්මයය. ආරම්භයේදී උන්වහන්සේ පිළිබඳවත්, උන් වහන්සේ විසින් වදාල සත්‍යය වූ දහම පිළිබඳවත් ඇදහීමට අපිට සිදුවේ. ඇදහීම විශ්වාසයට එහා ගිය දෙයකි. විශ්වාසය පෞද්ගලිකය. නමුත් ඇදහීම යනු සම්පූර්ණ යටහත් භාවයෙන් යුතුව තමා අතහැර ශාස්තෘන් වහන්සේත් උන්වහන්සේගේ ධර්මයත් සරණ යාමකි. එසේ සරණ ගොස් තම දැක්ම අවකාශයේ යථා භූත ඥාණය දහමට අනුව හැඩගසා ගත යුතුය.

ලෝකය තුළ පවතිනුයේ ද්‍රව්‍ය, පුද්ගල, සිද්ධි ක්‍රියාකාරිත්වයකි. එම ක්‍රියාකාරිත්වය හේතුවක ඵලයක් ලෙස සිදුවන අතිශය ස්වාභාවික ක්‍රියාවලියකි. ඵලයක් බිහිකිරීමේ ශක්තිය ඇතිව හේතුවක් ජනිත වූ විට එම හේතුව ඵලයක් බිහිකර නැතිවී යයි. ඇති වූ ඵලය තවත් ඵලයකට හේතුවක් වෙයි. තමා තුළත් බාහිර ලෝකය තුළත් සිදුවන මෙම අතිශය ස්වභාවික

එහෙත් ගැඹුරු ක්‍රියාවලිය නොදකින මිනිසා “මම” යන්නෙක් ඇතැයිද බාහිර “ලෝකයක්” ඇතැයිද යන හැඟීමෙන් යුතුව එම ස්වාභාවික ක්‍රියාවලිය තම වසඟයට ගැනීමට ප්‍රයත්න දරමින් සිටී.

මිනිසා තම ඉන්ද්‍රියයන් හරහා ලැබෙන සෑම අරමුණක් පාසාම මතකයේ ඇති සංකල්ප හා දෘෂ්ඨි සාපේක්ෂ වීමෙන් තමා යැයි ප්‍රතිරූපයක් ගොඩනගා ගනිමින් නිරතුරුව මමත්වය ප්‍රසාරණය කරගනිමින් සිටින අතර එම ක්‍රියාවලිය අනාදිමත් කාලයක පටන් නොකඩවා සිදුකරගෙන එනු ලබයි. සංකල්ප බිහිකිරීම යනු අරමුණක් මත නිගමනයකට එළඹීමකි. එනම් සංකල්පය යනු නිගමන ගොඩකි.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

ඔබ ගසකින් කොළයක් වැටෙනවා දකිනවා යයි සිතමු. ගසෙන් කොළය වැටීම සුළඟ හෝ ගසේ පැවතිය යුතු කොළයේ ජීවිත කාලය අවසන්වීම වැනි කවර හෝ හේතුවක් මත සිදුවන සාමාන්‍ය ස්වභාවික සිදුවීමකි. නමුත් අසවල් ගසෙන් අසවල් කොළයක් අසවල් තැනට වැටෙනවා යයි පනවා ගන්නේ ඔබ විසිනි. ගස හා කොළය පිළිබඳ නිගමන සංකල්ප හරහා ලෝකයක් මවාගන්නේ ඔබ විසිනි. ඔබගේ නිගමන සංකල්ප පිළිබඳ ගසට හෝ කොළයට කිසිම නිනව්වක් නැත. එම ගසෙන් එම කොළය වැටෙනවා ඔබ නොදුටුවේ නම්, ඒ පිළිබඳ කිසිවෙක් දන්නේ නැත.

ඔබත්, ගසෙන් කොළය වැටීමත් ස්වායත්ත සිද්ධි දෙකකි. එයින් ලෝකයක් මවාගත්තේ ඔබ විසිනි. එනම් ලෝකය යනු ඔබයි. "මම" බිහිකර ගනුයේ ඔබ විසින් ඔබ තුළයි. සැබෑවටම ඔබ තුළ "මමෙක්" සිටීද? කොළය වැටීම යන ස්වභාවික සිද්ධිය මත ඔබ තුළ සිදුවූ මූලිකම යථාර්තය කුමක්ද? ඔබගේ ඇසට ගසේ සහ කොලයේ වර්ණ සටහනක් ගෝචර වීමත් එම ගස සහ කොළය ඔබගේ පෙර මතක සටහන් ඔස්සේ නාමිකව හඳුනාගැනීමත්, කොළයේ චලනය පෙර මතක සටහන් ඔස්සේ වැටෙනවා යයි හඳුනා ගැනීමත්, ඒ අනුව එම සිද්ධිය අසවල් ගසෙන් අසවල් කොළයක් වැටුනා යයි නිගමනයකට එළඹීමත්ය. කොළය වැටෙනවා සේම ඔබ තුළ සිදුවූ මෙම ක්‍රියාකාරිත්වයත් හේතුවන ඵලයක් ලෙස පටිච්ච සමුප්පන්නව සිදුවූ ක්‍රියාවලියක් පමණි. එම ක්‍රියාව "මම දැක්කා" යයි වරදවා වටහාගන්නේ ඔබය.

පර්යේෂණ කේන්ද්‍රය

එසේම එම කොළය ඔබ කැමති වුවත් නැතත් බිමට පතිත වනවාමය. ඔබට අවශ්‍ය වූ පමණින් වේගයෙන් බිමට පතිත කරවීමටවත්, බිමට පතිතවීම ප්‍රමාද කරවීමටවත් ඔබට නොහැකියි. එය හේතු ඵල දහමට අනුව ඉතාම ස්වභාවිකව ස්වාභාවිකත්වය තුළම සිදුවේ. එම ක්‍රියාව ඔබට අවශ්‍ය පරිදි පාලනය කළ නොහැක. එනම් ලෝකය ඔබගේ වසඟයේ පැවැත්විය

නොහැකිය. එසේ නම් "මගේ" යැයි පැනවිය හැකි යමක් ලෝකය තුළ නොපවතී.

මෙම ඥාණ දර්ශනය ඔබ තුළ ඇතිවීමට නම්, ඔබ තුළ සිදුවන ක්‍රියාකාරීත්වය දෙසත් අවට ලෝකය තුළ සිදුවන ක්‍රියාකාරීත්වය දෙසත් සෑම මොහොතකම ඉතාම සුපරීක්ෂාකාරීව තියුණු අවධානයකින් නිරීක්ෂණය කළ යුතුවේ. ඔබෙන් ඉවත්වී දුරක සිට යම් වස්තුවක් නරඹන පරිදි එම අවධානය තීව්‍ර කළ යුතුය.

එවිට ඔබ තුළත් බාහිර ලෝකය තුළත් සිදුවනුයේ ක්‍රියාකාරිත්වයක් පමණක් බව ඔබට අවබෝධ වනු ඇත. මමය මාගේ යැයි කියා දෙයක් ලෝකය තුළ පැනවිය නොහැකි බවත් ඇත්තේ එකම ක්‍රියාකාරිත්වයක් බවත්.... එකම සමස්තයක් බවත් ඔබට ප්‍රත්‍යක්ෂ වනු ඇත. "නිවැරදි දැකීම" නම් එය වන්නේය.... "සම්මා දිට්ඨිය" නම් එය වන්නේය.

එසේම මෙම ලෝකයෙහි හේතුවක් නිසා හටගත් සියල්ල එම හේතු නැති වීමෙන්ම නැතිවන්නේය. ඇතිවීම තුළම සියල්ල නැතිවන්නේය. මේ විශ්වය තුළ මොහොතක්වත් ස්ථිරව පවතින දෙයක් නැත. මෙම ක්‍රියාවලිය අකාලික වේගයකින් ක්ෂණයක් පාසාම සිදුවන නිසා මිනිසාට, සත්වයාට එය ගෝචර නොවේ. ඔහු විශ්වය ලෙස දකිනුයේ ඇතිවෙමින් නැතිවෙමින් යන

ක්‍රියාවලිය නොව, විශ්වය ස්ථිර ලෙස තිබෙන දෙයක් සැටියටය. එම අකාලික වේගය හසුනොවන ප්‍රාථමික ඉන්ද්‍රියයන් වලින් සමන්විත සත්ත්වයා, එහි ඇති වන නැතිවන ක්‍රියාකාරිත්වයක් නොව ස්ථිර වශයෙන්, නොවෙනස්ව පවතින ලෝකයක් ඇතැයි අවිද්‍යාවෙන් අල්ලා ගනී. මුළාවට පත්වෙයි. නමුත් අතීතය හා අනාගතය පරිහරණය නොකොට වර්තමානයේ, එනම් මේ මොහොතේ තමා තුළ සිහිය පවත්වා ගැනීමෙනුත් එම සිහිය පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මූල ධාතු හරහා අවකාශයට යොමු කිරීමෙනුත් ලෝකයේ ඇති මෙම මායාව ඔබට ප්‍රත්‍යක්ෂ කරගත හැක.

එවිට "නිවැරදි දැක්ම" පහල වී ඇති බවත් "සම්මා දිට්ඨිය" ට පත්වී ඇති බවත් ඔබ තුළින්ම සැක නැතිවම දැනගත හැකිවනු ඇත.

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය

විනාශය

මිනිසාගේ විනාශය සිදුවන්නේ ඔහුගේම ඇතුළාන්තයේ කුරිරු බව නිසාය. බාහිර සාධක මත නොවේ...

අප ජීවත් වන මෙම යුගයේ ස්වාභාවික විපත් වැඩිවෙමින් පවතී. එය වක්‍රාකාරව මිනිසාගේ අයහපත් චින්තන ධාරාව විශ්වගත කරන, අයහපත් කර්ම නමැති ශක්තිය හේතුවෙන් විය හැකිය. අප පෞද්ගලිකව රැස් කලද සියළුම කර්ම විශ්වගත වන්නේය. මක් නිසාද, සැබැවටම අප සියළු දෙනාම විශ්වයේ කුඩා අංශුවක් වන බැවිනි. දැවැන්ත විශ්ව ශරීරයේ හටගත් කුඩා තුවාල රාශියක් ලෙස මිනිසා නිතරම කුණු සැරව (දුගඳ හමන) විශ්වයට එකතු කරයි. විශ්වය කර්ම ශක්තියෙන් ආතති ගැන්වෙන විට ඒවා පෞද්ගලික භූමිය ඉක්මවා පොදු භූමියක නිදහස් වනු ඇත. කර්ම නිදහස් වන්නේ ඵල - විපාක ලෙස පමණි. බුදුන් වහන්සේගේ දේශනාව පරිදී දූෂිත සිත් ඇත්තන් නිසා ක්‍රමයෙන් සමස්ත මිනිසුන්ගේම ආයුශ අඩුවී, උස අඩුවී. භව භෝග හීන වී, ලෙඩ රෝග වැඩිවී යම් කලෙක බොහෝ දුකට පත්වන බව අවධාරණය කරයි. එබැවින් මිනිස් චිත්ත සන්තානයේ හැසිරීම වක්‍රව සොබා දහමට බලපෑම් ඇති කරයි.

නමුත් අද මිනිසාට විශාලතම හානිය සිදුකරන්නේ බාහිර පරිසරය නොව ඔවුන්ගේම ඇතුළත චින්තන ධාරාවයි. දූශිත අභ්‍යන්තරයක් සහිත මිනිසුන්ගෙන් බොහෝ මිනිසුන්ගේ විනාශය සිදුවනු ඇත. තම අභ්‍යන්තරය විසින්ම අණ කර තමාවම විනාශ කරගන්නා මිනිසුන්ද, අභ්‍යන්තර පෙළඹවීම මත අන් අය සහ සියළු දෙනා ජීවත් වන පරිසරය විනාශ කරන

මිනිසුන්ගෙන්ද නූතන සමාජය පිරී ඇත.

අතීතයේ මිනිසාට උවදුරක් ලෙස තිබුණේ සොබාදහම තුළ අවට පරිසරයේ ක්‍රියාකාරීත්වය නිසා ඇති වූ අපහසුතාවයන්ය. ඒ සඳහා යුග යුග මහා ප්‍රයත්න දරමින් ආහාර, ඇඳුම්, නිවාස සහ මෙවලම් මෙන්ම බෙහෙත් යනාදිය බොහෝ සෙයින් දියුණු මට්ටමකට ඔසවා ඇත. නූතන මිනිස් වර්ගයාට ප්‍රබලම තර්ජන, අභියෝග එල්ල වී ඇත්තේ තම වර්ගයාගේම අභ්‍යන්තරයෙන් පැන නඟින කෲරත්වය හේතුවෙනි. ස්වයං ඝාතක, පර පීඩක ක්‍රියාකාරකම් සඳහා අණ දෙන තමාගේම ඇතුළාන්තය හේතුවෙන් මිනිසුන් මිහිමත වඳ වීමේ තර්ජනය උත්සන්න වී ඇත.

විසඳුම් ඇත්තේ වහ වහා මිනිසුන්ගේ ආධ්‍යාත්මය ගොඩනැඟෙන, ආධ්‍යාත්මික ගුණ වගාව සක්‍රීය වන ක්‍රියා දාමයක් ආරම්භ කිරීමෙන් පමණි. වැඩිහිටියන්ට ආගමික සංස්ථාව මඟින්ද, දරුවන්ට අධ්‍යාපනය තුළින්ද ආධ්‍යාත්මික සංවර්ධන වැඩපිළිවෙලක් ගෝලීය වශයෙන් ආරම්භ කළ යුතුය. නැතහොත් ලොවම විනාශ කරන පරමාණුක, රසායනික සහ ජීව විද්‍යාත්මක ප්‍රහාරයකට තම ඇතුළාන්තයෙන්ම අණ ලැබෙන උන්මත්තකයින් ගෙන් ලොව නිදහස් කළ නොහැක. අද දවසේ කථිකාවතක් වේ නම් එය මේ සඳහාම විය යුතු අතර පොත් වල තිබෙන වචන වලට රණ්ඩු වෙන පූජකයින්ගෙන් හෝ එකිනෙකාට මඩ ගසමින් කෑ මොර දෙන පාලකයින්ගෙන් මිනිසාට සේවයක් නොවනු ඇත. සංවිධානය විය යුත්තේ මිනිසාගේ ඇතුළාන්තය මිනිස් සංහතියට විරුද්ධව කරන කෲර හානිය වළක්වන වැඩපිළිවෙලක් මිහි මත ක්‍රියාත්මක කිරීමට පමණකි.

අපට ඇත්තේ එකම අරමුණකි.
ඒ අවකාශයේ පරම සත්‍යය හා සමවීමයි.
එනම් අජර අමර වූ සදාකාලික සැපය වූ නිවන් අවබෝධයයි.

එනිසා මේ කළණ මිතුරන්
විවිධ වූ දහම් කරුණු ලිපි වලින් සාකච්ඡා කළද,
ඒ සැම දෙනෙකුගේම ලිපි වල දිශාගත වීම එකම දිශාවකට,
එනම් සත්‍යය කරා වීම මේ ලිපි කියැවූ ඔබට දැන් පසක් වී තිබෙනු
නොඅනුමානයි.

ඔබට හා මට සත්‍යාවබෝධය අසීරු නැත.
ඔබ කළ යුත්තේ නිවැරදි දැක්ම තුළ නිරන්තරයෙන් සතිමත්ව සිටීම පමණි.
එවිට ඔබට ඔබව හොඳින් පෙනෙනු ඇති.
ඔබ තුල වූ සැබෑ නිවීම ඔබට ප්‍රත්‍යක්ෂ වීම නිරායාසයෙන් සිදුවනු ඇත.
බුදුවරුන්, මහරහතුන් තුළ සිදුවූ ප්‍රබුද්ධනය
ඔබ තුළද සිදුවී පරම සත්‍යය හා සමවනු ඇති.

© මානව ධර්ම හා ආධ්‍යාත්මක විද්‍යාව පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය

"මිනිසාට සත්‍යය වෙනස් කළ නොහැක.
සත්‍යයට මිනිසාව වෙනස් කළ හැක"

©
මානව ධර්ම හා ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ
පර්යේෂණ කේන්ද්‍රය